Enid Blyton

ඉංග්‍රීසි සාහිත්‍යයේ ප්‍රකට ලේඛිකාවක වන ENID BLYTON ගේ "FAMOUS FIVE" කථා මාලාවේ දස වැන්න.

## පන් පසිඳුවන්ගේ වීර ක්‍රියා - 10

# විල්තෙරේ බියකරු රැයක්..!

# FIVE ON A HIKE TOGETHER

WWW.sin7788.blogspot.com



පරිවර්තනය

ප්‍රගීත් මධුරංග අලුත්වත්ත

## සිදුවීම් පෙළ


| | |
|---|---|
| ජූලියන්ගෙන් ලියුමක්..... | 01 |
| ගමන පිටත් වෙමින්..... | 02 |
| පිටිසර පළාතේ සැරසරමින්..... | 03 |
| ටිම්ට කරදරයක්..... | 04 |
| ඈන් සහ ඩික් අතරමං වී..... | 05 |
| මැදියම් රැයේ..... | 06 |
| පසු දා උදෑසන..... | 07 |
| නැවතත් එකට එක් වී..... | 08 |
| ඩික් ගේ පුදුම කතාව..... | 09 |
| අපූරු පොලිස් නිලධාරියෙක්..... | 10 |
| ජූලියන්ගෙන් අපූරු අදහසක්..... | 11 |
| නිදන්නට තැනක් සොයමින්..... | 12 |
| විල් තෙරේ රැයක්..... | 13 |
| දඟකාර ජේන්ව සොයමින්..... | 14 |
| මැගී සහ කිළුටු ඩික්..... | 15 |
| පහුරේ නැග යමින්..... | 16 |
| එකට එක..... | 17 |
| රහස සොයා ගැනෙයි..... | 18 |
| ජූලියන්ගේ උපාය..... | 19 |
| සඳ ඇති රැයේ..... | 20 |
| වටිනා වස්තුව අත් කර ගනිමින්..... | 21 |
| අපූරු හපන්කම නිම වෙයි..... | 22 |


# ජූලියන්ගෙන් ලියුමක්..... 01

"ඈන්....!" ජෝර්ජ් ඇගේ නෑ සොයුරිය පසුපසින් පන්ති කාමරයට දිව එමින් කෑ ගැසුවා. "මෙන්න...! ඔයාට ජූලියන්ගෙන් ලියුමක්...!"

ඈන් නැවතී ආපසු හැරී බැලුවා.

"දැන් දවස් දෙක තුනකට කලින් ජූලියන් මට ලියුමක් එව්ව නේ. මේ හදිස්සියෙම ආයෙත් ලිව්වේ මොකද දන්නෙ නෑ. මොකක් නමුත් වැදගත් කාරණාවකට වෙන්න ඕනේ...!" ඈන් කිව්වා.

"කඩලම බලන්න කෝ...!" කියමින් ජෝර්ජ් ලියුම ඈන්ට දුන්නා. "ඉක්මනට...! මම පන්තියට යන්න ඕනේ."

ඈන් වහා ලියුම් කවරය ඉරා ලියුම අතට ගත්තා. ජූලියන් කියන්නේ ඇගේ වැඩිමහලු සහෝදරයා. ඇය ලියුම ඉක්මනින් කියවා අවසන් කර ජෝර්ජ් දෙස බැලුවා. ඇගේ මුහුණේ තිබුණේ සතුටු සිනාවක්...!

"ජෝර්ජ්, මේ අහන්න...! ජූලියන්, ඩික් දෙන්නා ලබන සති අන්තයේ නිවාඩු දවස් ටිකේ ඈත පිටිසරබද පළාතක ඇවිදින්න යන්නයි ලෑස්තිය..!" ඈන් කිව්වා. "එයාලා අපි දෙන්නවත් එක්ක යනවලු..!"

"හා....! ඒක නම් නියම අදහස....!" ජෝර්ජ් සතුටින් කිව්වා. "ජූලියන්ට ඒ වගේ දෙයක් කල්පනා වුණු එක කොච්චර හොඳද?"

ඒ සමගම ඇන්ගේ පන්තිභාර ගුරුතුමිය කොරිඩෝව දිගේ පන්තිය දෙසට ආවා.

"ජෝර්ජිනා...! ඔයා මේ වෙලාවේ ඉන්න ඕනේ ඔයාගෙ පන්තියේ නේද? ඇන්...! ඔයත් පන්තිය ඇතුළට යන්න." ඇය කිව්වා.

ජෝර්ජ් තවත් එක වචනයක්වත් කතා කරන්නේ නැතිව බුම්මාගත් මුහුණින් යුතුව ඇගේ පන්තිය දෙසට ගමන් කළා.

කවුරුන් හෝ ඇයට ජෝර්ජිනා කියා කතා කරනවාට ජෝර්ජ් හරිම අකමැතියි. ඇයට ඕනෑ වුණේ පිරිමි ළමයෙකු මෙන් හැසිරෙන්නටයි. ඇත්තෙන්ම ඈට තිබුණේත් පිරිමි ළමයෙකුගේ පෙනුමක්. කොටට කපා තිබුණු ඇගේ කැරලි ගැසුණු හිසකෙස් ඒ පෙනුම තවත් වැඩි කළා.

ඇන් ජූලියන්ගෙන් ලැබුණු ලියුම සාක්කුවේ දමා ගනිමින් සතුටින් පන්තිය ඇතුළට ගියා. ඇගේ වැඩිමහලු සොහොයුරන් දෙදෙනාත්, ජෝර්ජ් සහ ඇගේ සුරතලා ටිමීත් සමග නිවාඩුවක් ගත කරන්නට ලැබීම තරම් ඇයට තවත් සතුටක් තිබුණේ නෑ.

පාසැල් කාලය අවසන් වීමෙන් පසුව ඇන්, ජෝර්ජ් දෙදෙනා එක්වී ජූලියන්ගේ ලියුම ගැන උනන්දුවෙන් කතා කරන්නට පටන් ගත්තා.

"අපිට සිකුරාදා උදෙන්ම මෙහෙන් පිටත් වෙලා ගිහින් අඟහරුවාදාට ආපහු එන්න පුළුවන්." ජෝර්ජ් කිව්වා.

"අපේම වාසනාව...! මේ වගේ නිවාඩු දවස් අහුවෙන්නේ හරිම කලාතුරකින්."

"මේ දවස් වල ගෙදර යන්නත් විදිහක් නෑ." ඇන් කිව්වා. "අපේ ගෙදර තීන්ත ගානවා. අපිට යනවා නම් යන්න තියෙන්නේ ඔයාලගෙ කිරින් ගෙදර තමයි. ජෝර්ජ්, අපි හදිසියේම එකපාරට කිරින් ගෙදරට එනවට කොන්ටින් මාමා කැමති වෙන එකක් නෑ. මේ වගේ ගමනක් ලෑස්ති කරපු එක කොච්චර දෙයක්ද?"

"ඒක ඇත්ත...!" ජෝර්ජ් කිව්වා. "තාත්තා වෙනදා වගේම මේ දවස් වලත් අලුත් විද්‍යාත්මක සොයාගැනීමක් ගැන පර්යේෂණ කරනව ඇති. අපි ගෙදර ගිහින් එහෙ මෙහෙ දඟලනකොට එයාට තරහ යයි.





හොඳ වෙලාවට ජූලියන් මේ වගේ වෙන ගමනක් ලෑස්ති කළේ."

"ජූලියන් ලියලා තියෙනවා අද රෑට කතා කරලා අපිට වැඩි විස්තර කියන්නම් කියලා." ඇන් කිව්වා. "මේ මාසේ කාලගුණයත් හොඳ නිසා අපේ ගමන හරිම විනෝදයෙන් යන්න පුළුවන් වේවි."

"පිටිසරබද පළාත්වල ලස්සන කැළෑ තියෙනවා." ජෝර්ජ් කිව්වා. "ටිමීත් ඒ වගේ තැන්වල ඇවිදින්න යන්න හරිම කැමතියි. අපි ගිහින් ටිමීව බලලා එමු."

නේවාසික බාලිකා පාසැලේ ගැහැනු ළමුන්ට ඔවුන්ගේ සුරතල් සතුන් ළඟ තබා ගන්නනට පාසැලෙන් අවසර දී තිබුණා. ළමුන්ගේ සුරතල් බල්ලන්ට වෙන් වූ කුඩු පේළියක්ම පාසැලේ එක් කෙළවරක පිහිටි මඩුවක පිහිටා තිබුණා. ගැහැනු ළමුන් දෙදෙනා ඒ දෙසට ගමන් කළා.

ටිමී තමයි ජෝර්ජ්ගේ එකම සුරතලා. එයා දුඹුරු පාට ලොකු බූල් බල්ලෙක්. ජෝර්ජ් එන හඬ ඇසී ටිමී කූඩුවේ දොරටුව පහුරු ගාමින් සතුටින් බුරන්නට පටන් ගත්තා. ජෝර්ජ් දොර හැර දමා ටිමීව එළියට ගත්තා. ටිමී වලිගය වේගයෙන් වනමින් ජෝර්ජ්වත් ඇන්වත් ලෙව කන්නට පටන් ගත්තා.

"ටිමී....! මේ අහන්න." ජෝර්ජ් කිව්වා. "අපි ජූලියන්, ඩික් දෙන්නත් එක්ක නිවාඩුවකට පොඩි රවුමක් යන්නයි ලෑස්තිය..!"

ටිමී 'වූෆ්..!' කියා වලිගය වැනුවා.

ජෝර්ජ් කියූ දෙය ටිමීට ඉවෙන් මෙන් වැටහුණා.

ජෝර්ජ්, ඇන් දෙදෙනා ටිමීත් සමග සෙල්ලම් පිටිය වටා රවුමක් ඇවිදින්නට පිටත් වුණා. ටිමී ගමනට එක් වුණේ හරිම කැමැත්තෙන්. ළමුන් වගේම ටිමීත් පාසැලේ ගත කරන කාලයට වඩා නිවාඩු කාලයට වැඩි කැමැත්තක් දැක්වුවා.

ජූලියන් පොරොන්දු වූ පරිදිම ඔහු එදා රෑ ඇන්ට දුරකථන ඇමතුමක් දුන්නා. ඔහු ගමනට අවශ්‍ය සෑම දෙයක්ම අපූරුවට සූදානම් කර තිබුණා.

"හරි...! අපි වෙලාවට ඔයා කියපු තැනට එන්නම්." ඈන් ජූලියන්ගේ ඇමතුමට පිළිතුරු දෙමින් සතුටින් කිව්වා.

"හරි...! හරි....! අපි කතා කරගත්ත විදිහට ඕනෙ කරන දේවල් සේරම අරන් එන්නම්." ඇය නැවතත් කිව්වා.

ජෝර්ජ් දුරකථන සංවාදය නිම වන තුරු නොඉවසිල්ලෙන් අසලටම වී බලා සිටියා.

"ජූලියන් මොනවද කිව්වේ?" දුරකථන සංවාදය අවසන් වූ ගමන්ම ජෝර්ජ් ඈන්ගෙන් ඇසුවා.

"මටත් ජූලියන් එකක වචනයක් දෙකක් කතා කරන්න ඕනෙකම තිබුණා. අපරාදේ... ඔයා රිසිවරය තිබ්බා නේ." ඇය අමනාපයෙන් කිව්වා.

"ඔයාගෙන් ටිමී ගැන විස්තර අහන්න සල්ලි නාස්ති කර ගන්න ජූලියන් කැමති වෙන එකක් නෑ." ඈන් සිනාසෙමින් කිව්වා. "ජූලියන් ඇහුවා, කොහොමද ටිමී හොඳින් ඉන්නවද කියලා. මම කිව්වා, වරදක් නෑ ටිමී හොඳින් ඉන්නවා කියලා. ඉතින් ඒ ඇති නේ."

ජෝර්ජ්, ඈන් දෙන්නා එළිමහනේ බංකුවක නිදහසේ වාඩි වී ගමන ගැන කතා බස් කරන්නට පටන් ගත්තා. ටිමීත් ඔවුන් අසලින්ම බිම වාඩි වී සිටියා.

ඒ අසලම වෙනත් ගැහැනු ළමුන් දෙදෙනෙකුගේ සුරතල් බල්ලන් දෙදෙනෙකුත් සිටියා. ඔවුන් හැමෝම දඟ වැඩ නොකර හොඳින් හැසිරුණා. හැසිරීම හොඳ නැතිනම් දවසම කූඩුවට වී කාලය ගත කරන්නට සිදු වන බව ටිමී අත්දැකීමෙන්ම දැනගෙන සිටියා..!

"ජූලියන් කිව්වා, පුළුවන් තරම් අඩුවෙන් බඩු මුට්ටු අරන් එන්න කියලා." ඈන් කිව්වා. "පයින් යන නිසා පිටේ එල්ලාගෙන යන බෑග් එකට දාන්න පුළුවන් ප්‍රමාණයට වඩා වෙන කිසි දෙයක් අරන් යන්න බෑ."

"දත් බුරුසුවයි, පනාවයි, පුංචි තුවායකුයි, වැඩිපුර ජර්සියකුයි, තව... එතකොට.... බිස්කට්, චොකලට් ටිකකුත් තිබුණාම ඇති...!" ඇය කල්පනා කරමින් කිව්වා. "ඔයා ළඟ වැඩිපුර සල්ලි තියෙනවද ජෝර්ජ්...?"





"ටිකක් තියෙනවා." ජෝර්ජ් කිව්වා. "ඒ තරම්ම නෙමෙයි. ඒත් චොකලට් දෙක තුනක් ගන්න ඒ සල්ලි ඇති. අම්මා ගිය සතියේ එවපු බිස්කට් ටින් එකක් ඔයාගේ ළඟ තියෙනවා නේද, අපි ඒකත් අරගෙන යමු."

"හරි...! ඒ හොඳටම ඇති." ඈන් කිව්වා. "ජූලියන් කිව්වා වගේ අපි අනවශ්‍ය තරම් බර බෑග් එකක් ගෙනියන්න ඕනෙ නෑ. ආ..... එයා කිව්වා, වැඩිපුර මේස් කුට්ටම් දෙක තුනක් අරන් එන්න කියලා."

"ඒක හොඳයි." ජෝර්ජ් කිව්වා.

"ටිමී...! අපි ෂෝක් ගමනක් යන්නයි ලෑස්ති වෙන්නේ. ඔයා ඒකට කැමතියි නේද?" ඇය ටිමීගෙන් ඇසුවා.

ටිමී 'වූෆ්...!' කියා වලිගය වනමින් ගමනට කැමැත්ත පළ කළා.

ළමුන් සමග පිටිසරබද පළාත් වල ඇවිදින්නට යන විට මගතොටේ දී හමු වන හාවුන් පසුපස පන්නා යන්නට ටිමී හරිම කැමැත්තෙන් පසු වුණා..!

සති අන්තයේ එන නිවාඩුවට ගෙදර යන්නේ නැතිව වැඩිමහලු සහෝදරයින් දෙදෙනා සමග පිටිසරබද පළාතක ඇවිදින්නට යන බව නේවාසිකාර පාලිකාවට දන්වන්නට ඈන්, ජෝර්ජ් දෙදෙනා පිටත්ව ගියා.

"පීටර්ස් නෝනා..! අපේ ගමනට අපිට අවසර දෙන්න කියලා ඉල්ලලා ජෝර්ජ්ගේ අම්මා හෙට ලියුමක් එවයි." ඈන් කිව්වා. "අපිට අවසර ලැබෙනවා නේද?"

"ඔව්...! ඔව්...!" පීටර්ස් නෝනා කිව්වා. "මේ දවස්වල කාලගුණයත් හොඳයි නේ. ඔය ළමයි කොහේද ඇවිදින්න යන්නේ?"

"පිටිසර පළාතකටලු...!" ඈන් කිව්වා. "ජූලියන් තමයි හරියටම ගමන ගැන විස්තර දන්නේ. එහේ කැළෑ එහෙමත් ඇති. අපිට මුවෝ බලන්නත් පුළුවන් වෙයි. අපි වැඩි දුරක් පයින්ම ඇවිදගෙන යන්නයි හිතා ගෙන ඉන්නේ."

"ඒත්, ඔය වගේ පිටිසර පළාතක ඇවිදින්න ගිහින් ඔය ළමයි

රෑට නවතින්නේ කොහේද?" පීටර්ස් නෝනා ඇසුවා.

"ඔහ්...! ජූලියන් නවතින්න තැනක් ලෑස්ති කරලා ඇති." ජෝර්ජ් කිව්වා. "සිතියමෙන් බලලා හොඳ ගොවිපළක් හොයා ගන්න පුළුවන් නේ. එළිමහනේ වුණත් නිදා ගන්නත් පුළුවන්. ඒත් එතකොට නම් ටිකක් සීතල දැනේවි."

"එළිමහනේ නිදියන්න අමාරුයි." පීටර්ස් නෝනා කිව්වා. "කොහොම වුණත් කමක් නෑ. පරිස්සමින් ගිහින් එන්න. මං හිතන්නේ ඔය ළමයි එක්ක ටිමීත් යනව ඇති?"

"ඔව්, නැතුව නැතුව...!" ජෝර්ජ් කිව්වා. "මම ටිමී නැතුව කොහේවත් යන්නෙ නෑ. මට එයාව තනියම දාලා යන්න බෑ."

ගැහැනු ළමුන් දෙදෙනා පීටර්ස් නෝනාගෙන් සමුගෙන ඇවිත් ගමනට ඕනෑ කරන දේවල් සූදානම් කරන්නට පටන් ගත්තා.

ඔවුන් දෙදෙනාටම පිටෙහි එල්ලාගෙන යන ගමන් මලු දෙකක් තිබුණා. ඔවුන් ඒවායේ ගමනට ඕනෑ කරන දේවල් අසුරා තැබුවා. ආපසු පිටතට ගෙන නැවත ඇසිරුවා...! තව තවත් දේවල් සැරින් සැරේ ඊට එකතු වුණා...!

ඈන් කියවන්න පුංචි පොතකුත් ගත්තා. ජෝර්ජ් අලුත් බැටරි දැමූ පුංචි විදුලි පන්දම් දෙකකුත් බෑග් එකට දැම්මා.

"ටිමීට බිස්කට් ටිකක් ගන්නත් ඕනේ." ජෝර්ජ් කිව්වා. "මස් කටුවකුත් තිබුණොත් හොඳයි. ඒත් එයා ඒක බාගෙට කාලා ඉතුරු කළාම ඉතුරු කෑල්ල ආපහු මට බෑග් එකේ දාගෙන යන්න වෙනවා."

"ඔයා ගඳ ගහන මස් කටු ඔය බෑග් එකට දානව නම්, ඊට කලින් මට ඔයාගෙ බෑග් එකේ තියෙන චොකලට් ටිකයි බිස්කට් ටිකයි දීලා ඉන්න." ඈන් සිනාසෙමින් කිව්වා.

"ජෝර්ජ්...! මේ අහන්න, ටිමීට කියලා වෙනම කෑම ගෙනියන්න ඕනෙ නෑ. අපි කන දේකින්ම එයාටත් දෙන්න පුළුවන් නේ." ඈන් පැහැදිලි කළා.

අන්තිමේදී ජෝර්ජ් මස් කටු ගෙන යන අදහස අත හැර දැම්මා...!





ගැහැනු ළමුන් දෙදෙනා සති අන්තය ළඟා වන තුරු සිටියේ හරිම නොඉවසිල්ලෙන්. ඔවුන් දෙදෙනා එදින උදෑසන වෙනදාටත් වඩා වේලාසනින් අවදි වුණා.

"අපි උදේට හොඳට කාලා යමු." ඈන් කිව්වා. "දවල්ට කන්න ටිකක් පරක්කු වෙන්න ඉඩ තියෙනවා.

'ඉස්කෝලේ සීනුව ඇහෙන්නෙ නැති තරම් ඈත පළාතකට යන්න ලැබෙන එක ගැන මට හරි සතුටුයි.' ඇය තමන්ටම කියා ගත්තා.

ඔවුන් දෙදෙනා උදෑසන ආහාරයෙන් පසුව පීටර්ස් නෝනාගෙන් සමු ගෙන නේවාසිකාගාරයෙන් පිටත් වුණා. ටිමීත් ඒ පසුපසින් ගමන් කළා.

"ඈන්, ජෝර්ජ්, සුබ ගමන්...! ගිහින් ඇවිත් අපිට ගමනේ විස්තර කියන්න හොඳේ....!" ඔවුන්ගේ මිතුරියක් අත වනමින් කිව්වා.

ටිමී ඇයට 'වූෆ්...!' කිව්වා.

## ගමන පිටත් වෙමින්..... 02

ජූලියන්, ඩික් දෙදෙනාත් ගමන පිටත් වන්නට සූදානම් වුණේ හරිම නොඉවසිල්ලෙන්.

"මම විලීස්ටවත් ජොන්සන්ටවත් චුට්ටක්වත් කැමති නෑ." ජූලියන් පාසලේ නේවාසිකාගාරයෙන් පිට වී එන අතරතුර දී ඩික්ට කිව්වා. "ඒ දෙන්නා සෙල්ලම් කරන්නවත් එන්නේ නෑ. හැමදාම කරන්නේ පාඩම් කරන එක විතරයි."

"මේ සති අන්තයම ඒ දෙන්නා පුස්තකාලයේ මුල්ලක වාඩි වෙලා පොත් කියව කියව ඉඳීවි." ඩික් කිව්වා. "අපිට නම් මේ සති අන්තය අපූරු එකක් වෙයි...!"

"ඒ දෙන්නා ඇවිදින්න යන්න කොහොමටවත් කැමති නෑ." ජූලියන් කිව්වා.

"ඔයා දන්නව නේ, ජොන්සන් රගර් සෙල්ලම් කරන හැටි. අඩුම ගානේ කොයි පැත්තටද බෝලේ යවන්න ඕනේ කියලවත් එයාට තේරෙන්නෙ නෑ. සමහර වෙලාවට බෝලෙත් අරන් අනිත් පැත්තට දුවලා යනවා...!" ජූලියන් සිනාසෙමින් මතක් කර දුන්නා.

"ඒක නම් ඇත්ත තමයි...! ඒත් එයාට තියෙන්නේ අපූරු මොළයක් නේ." ඩික් කිව්වා. "ඒක නෙමෙයි. අපි මොකටද විලීස් ගැනයි ජොන්සන් ගැනයි කතා කරන්නේ? අපිට කතා කරන්න වෙන මාතෘකා ඇත්තෙම





නැද්ද? අපි කතා කරමුකෝ ජෝර්ජ් ගැනයි, ඈන් ගැනයි, ටිමී ගැනයි. එයාලා වෙලාවට පිටත් වුණාද දන්නෙ නෑ."

"අපි ප්‍රධාන පාරවල් වලින් යන්නෙ නැතුව පිටිසර පැති වල තියෙන පුංචි අතුරු පාරවල් දිගේ ඇවිදින්න යමු." ජූලියන් කිව්වා. "කැලේ මැදින් යනකොට මුවෙක් හම්බ වුණොත් ටිමී මොනවා කරයිද දන්නෙ නෑ නේද?"

"ටිමී මුවෝ ගැන කරදර වෙන එකක් නෑ. එයා කරදර වෙන්නේ හාවෝ ගැන විතරයි....!" ඩික් කිව්වා. "අපි පහුගිය නිවාඩු දවස් වල ටිමීට අයිස් ක්‍රීම්, චොකලට් කවලා දැන් හිටියටත් වැඩිය මහත් වෙලාද දන්නෙ නෑ."

"නිවාඩු කාලේ වගේ නෙමෙයි, ඉස්කෝලේ පටන් ගත්තට පස්සේ ටිමීට ඒවා හම්බ වෙන්නෙ අඩුවෙන්." ජූලියන් කිව්වා. "ජෝර්ජ්, ඈන් දෙන්නට ගෙදරින් වියදමට සල්ලි දෙන්නේ ටිකයි නේ."

"අන්න....! බස් එක. ඉක්මන් කරලා දුවමු....!"

ජූලියන්, ඩික් දෙදෙනා වහා දිව ගොස් පිටත් වන්නට ආසන්නව තිබූ බසයට නැග ගත්තා.

"ආ.... ළමයිනේ...! ඉස්කෝලෙන් පැනලා යනවද?" කොන්දොස්තරවරයා සිනාසෙමින් ඔවුන්ගෙන් ඇසුවා. "ඉස්කෝලෙන් අවසර අරන්ද යන්නේ හැබෑටම?"

"විහිළු කරනවද?" ජූලියන් පිටෙහි එල්ලාගෙන සිටි ගමන් මල්ල බසයේ රාක්කයෙහි තබමින් කිව්වා. "අපි මොකටද පැනල යන්නේ?"

ජූලියන්, ඩික් දෙදෙනා ලන්ඩන් නගරයේ සිට ඈත පිටිසර ගම්බද පළාතට දිවෙන බස් රියේ ආසනයක වාඩි වී නිදහසේ ගමන් කරන්නට පටන් ගත්තා.

පැයකට පමණ පසුව ඔවුන් දෙදෙනා ගැහැනු ළමුන්ව හමුවන්නට කලින් කතිකා කර ගත් බස් නැවතුමෙන් බැස ගත්තා.

ජූලියන්, ඩික් දෙදෙනා බස් නැවතුමෙන් බැස වටපිට බැලුවා.

"ආ... මම කිව්වේ, එතකොට අපිට අද දවසටම වෙන කෑමක් ඕනෙ වෙන එකක් නෑ...!" ජූලියන් කිව්වා.

කාන්තාව හිස සොළවා කිසිත් නොකියාම ආපසු සැන්විච සාදන්නට පිටත්ව ගියා.

"එයාට පුදුම හිතෙන්න ඇති." ඈන් සිනාසෙමින් කිව්වා. "එක් කෙනෙකුට සැන්විච් අටයි. පාන් පෙති දාසයයි. ඒ කියන්නේ ටිමිටත් එක්ක.... පස් දෙනාටම... පාන් පෙති අසූවයි...!"

"එයා ළඟ පාන් පෙති කපන උපකරණයක් තියෙනව නම් හොඳයි." ඩික් කිව්වා. "නැත්නම් අද දවසම අපිට මෙතෙන්ට වෙලා ඉන්න වෙනවා...!"

ළමුන් ටික වේලාවක් වෙළඳ සැලට වී වාඩි වී කතා බස් කරමින් කල් ගත කළා. ඒ අතර තරමක් උස හීන්දෑරි තරුණයෙක් බයිසිකලයකින් පැමිණ වෙළඳ සැලට ඇතුළු වුණා.

"අම්මේ...!" ඔහු කතා කළා.

"ඔයාගේ අම්මා මේ වෙලාවේ හරියට වැඩ. පාන් පෙති අසූවක් කපනවා." ඩික් සිනාසෙමින් ඔහුට කිව්වා. "එතකල් කඩේ බලා ගන්නේ අපි තමයි. එයාට කතා කරන්නද?"

"ඕනෙ නෑ...! මට පරක්කු වෙනවා." තරුණයා සිනාසෙමින් කිව්වා.

ඔහු වෙළඳ සැලේ කබඩයේ අසුරා තිබූ සැන්විච් කිහිපය මල්ලකට දමාගෙන ආපසු පිටත් වී යන්නට හැරුණා.

"මම ඇවිත් ගියා කියලා අම්මට කියන්න." ඔහු කිව්වා. "හිර ගෙදරට බඩු වගයක් ගෙනියන්න තියෙන නිසා අද රෑට මම එන්න පරක්කු වෙනවා කියලත් කියන්න."

ඔහු බයිසිකලයේ නැග පිටත් වී ගියා. ඒත් සමගම ඔහුගේ මව - වෙළඳ සැලේ අයිති කාන්තාව පසුපස දොරෙන් එතැනට ආවා.

"ජිම් ඇවිත් ගියා ද?" ඇය ළමුන්ගෙන් ඇසුවා.





"ඔව්. එයා පරක්කු වෙනවා කියලා සැන්විච් ටිකක් අරගෙන ඉක්මනටම ආපහු ගියා." ජූලියන් කිව්වා. "එයා කිව්වා, අද රෑට එන්න ටිකක් පරක්කු වෙනවා කියලා. හිර ගෙදරට බඩු වගයක් ගෙනියන්න තියෙනවා කියලත් කිව්වා."

"මගේ අනිත් පුතා ඉන්නේ එහේ...!" කාන්තාව කිව්වා.

ළමුන් එකිනෙකාගේ මුහුණු බලා ගත්තා.

'ඒ කියන්නේ එයා හිරකාරයෙක්ද?' ළමුන් කල්පනා කළා.

ළමන්ගේ කල්පනාව වෙළඳ සැල අයිති කාන්තාවට තේරුණා.

"මගේ අනිත් පුතා ටොම්. එයා හිරකාරයෙක් නෙමෙයි." ඇය සිනාසෙමින් කිව්වා.

"ටොම් වැඩ කරන්නේ එහේ. එයා බන්ධනාගාර නිලධාරියෙක්. ඒ වුණාට ඒක ඒ තරම්ම හොඳ රස්සාවක් නෙමෙයි කියලයි මට නම් හිතෙන්නේ. භයානක හිරකාරයෝ පාලනය කරන එක ගැන හිතනකොටත් මට නම් හරි බයයි." ඇය කිව්වා.

"මේ කඳුකර පළාතේ ලොකු බන්ධනාගාරයක් තියෙනවා කියලා මම අහලා තියෙනවා." ජූලියන් කිව්වා. "ඒක මේ සිතියමෙත් සලකුණු කරලා තිබුණා. අපි යන්නෙත් ඒ පැත්තටම තමයි."

"මේ ගෑනු ළමයා වත් එක් කර ගෙන ඒ පැත්තට යන්න එපා." ඇය ඈන්ව පෙන්වමින් කිව්වා.

ළමුන් ඊට කිසිවක් කිව්වේ නෑ. ඇය ජෝර්ජ්ටත් පිරිමි ළමයෙක් කියා රැවටී තිබෙන බව ළමුන්ට වැටහුණා.

"මම ඉක්මනට සැන්විච් ටික හදන්නම්. කතා කර කර හිටියොත් ඔය ළමයින්ට යන්න වෙන්නේ අද හවසට තමයි...!" කියමින් ඇය ආපසු වෙළඳ සැලේ පිටුපස දොරෙන් පිට වී ගියා.

ළමුන් තවත් ටික වේලාවක් වෙළඳ සැලට වී වාඩි වී සිටියා. අන්තිමේදී වෙළඳ සැල අයිති කාන්තාව පිළිවෙළට එතූ සැන්විච්

පාර්සලයක් රැගෙන පිටුපස දොරෙන් වෙළඳ සැලට ඇතුළු වුණා.

"ඔහ්....! මේ සැන්ඩ්විච් අපි හිතුවටත් වැඩිය ලොකුයි නේ." ජූලියන් ඒවා අතට ගනිමින් කිව්වා. ඔහු ඇයට මුදල් ගෙව්වා.

"ආ.... මෙන්න මගේ ගානේ ඔය ළමයින්ට කේක් කෑලි හතරකුත් තියෙනවා." ඇය ළමුන් පිටත් වන්නට සූදානම් වෙද්දී තවත් පාර්සලයක් ඔවුන් අතට දෙමින් කිව්වා. "මේවට සල්ලි එපා. මගේ ගානේ දෙන්නේ....!"

"ඔහ්...! මේ කේක් කෑල්ලක් සෑහෙන්න ලොකුයි නේ." ජූලියන් කිව්වා. "ස්තූතියි..! කොහොම ස්තූති කළත් මදි."

වෙළඳ සැල අයිති කාන්තාව ටිමීට මස් කටුවකුත් දුන්නා.

ටිමීත් වලිගය වනමින් ඇයට ස්තූති කළා. ළමුන් ඇගෙන් සමුගෙන ගමන් අරඹන්නට සූදානම් වුණා.

"ඔන්න එහෙනම්, අපි අපේ ගමන පටන් ගන්නවා." ජූලියන් ගමන් මල්ලත් පිටෙහි එල්ලාගෙන මගට බසිමින් කිව්වා.



# පිටිසර පළාතේ සැරසරමින්..... 03

ළමුන් සතර දෙනා ගමන් මලුත් පිටෙහි එල්ලා ගෙන පිටිසරබද පළාතේ පටු පාරවල් දිගේ ඉදිරියට ඇවිද ගෙන යන්නට පටන් ගත්තා. ජූලියන් සිතියම බලමින් ඔවුන් ගමන් කළයුතු මග සොයා ගත්තා. ටිමී සතුටින් බුරමින්, උඩ පනිමින් ළමුන් පිටුපසින් දිව ආවා.

එදින හරිම උණුසුම් දිනයක්. හිරු රැස් වැටීමෙන් පරිසරය ගිනියම් වී තිබුණා. ගස් වැල් සියල්ල කහ, කොළ වර්ණ වලින් දීප්තිමත්ව බැබළුණා. ළමුන් ගමන් කළ මග දෙපස උස් ගස් වලින් සෙවණ වී තිබුණා. ඒත් ඔවුන් තවමත් ඝන වනාන්තරය අසලට ළඟා වී සිටියේ නෑ.

"අද හරිම ෂෝක් දවසක්." ජෝර්ජ් කිව්වා. "හැබැයි ටිකක් දාඩිය දානවා."

ළමුන් උඩු කබා ගලවා කර වටා දමා ගත්තා. සැහැල්ලු ජර්සිය පමණක් ඔවුන්ට ප්‍රමාණවත් වුණා.

"මම කිව්ව විදිහටම ඔයාලා ඇවිදින්න පහසු විදිහේ සැහැල්ලු සපත්තු දාගෙන ආපු එක කොච්චර හොඳද?" ජූලියන් කිව්වා. "වැඩිපුර මේස් කුට්ටමක් ගෙනාවද?"

"ඔව්, ගෙනාවා." ඈන් කිව්වා. "ඔයා කිව්ව නිසා මතක් කරලම

ගෙනාවා. ජූලියන්, ඔයාගේ බෑග් එක අපේ ඒවට වැඩිය බරයි වගේ. මොනවද ඔය තරම් ඒකේ පුරවලා තියෙන්නේ?"

"සිතියමයි, මාලිමාවයි, තව ගොඩක් දේවල්...." ජූලියන් කිව්වා. "මේ පළාතේ එක එක තැන්වලට කියන නම් හරිම අපූරුයි. බ්ලයින්ඩ්වැලි, කෝහිකෝප්ස්... සිතියමේ තිබුණු සමහර නම් මට අමතකයි."

ළමුන් පුංචි ගම්මානයක් පසු කර වංගු සහිත පටු පාරක් දිගේ ඉහළට ගමන් කරන්නට පටන් ගත්තා. ඒ පාර දෙපසින්ම ඝන සැරේට පඳුරු වැවී තිබුණා. ඒවා ළමුන්ගේ හිසටත් වඩා උසට වැවී තිබුණු නිසා ඔවුන්ට මග දෙපස ඇති කිසිම දෙයක් දැක ගන්නට පුළුවන් වුණේ නෑ. ඒ පඳුරු පාරට නැමී ඉහළින් එකිනෙකට සම්බන්ධ වී තිබුණා.

"මේක හරිම අපූරු පාරක් නේ." ඩික් කිව්වා. "හරියට උමගක් දිගේ යනවා වගේ. හරිම පටුයි, හැම පැත්තෙන්ම වැහිලා."

ටික දුරක් ඉදිරියට ගමන් කළ පසුව ඔවුන් එළිමහන් තැන්නකට ළඟා වුණා. තැන්න පුරාම හාවුන් රංචු දුව පැන ඇවිදිමින් සිටියා. ටිමී ඒ දැක හොඳටම කලබල වුණා...!

"මේ තරම් හාවෝ ගොඩක් එක තැනක ඉන්නවා මම කවදාවත් දැකලා නෑ." ජෝර්ජ් පුදුමයෙන් කිව්වා.

ළමුන් තැන්නේ කෙළවරකට වී ටික වේලාවක් නිහඬවම හාවුන් දුව පනින සැටි බලා සිටියා. ඒත් ටිමීට නම් තවත් එසේ බලා සිටින්නට පුළුවන්කමක් තිබුණේ නෑ.

ටිමී එකවරම ළමුන් සිටි තැනින් ඉදිරියට පැන හාවුන් රංචු දෙසට දිව යන්නට පටන් ගත්තා...!

"ටිමී....!" ජෝර්ජ් කෑ ගැසුවා.

ඒත් ටිමී එය ගණනකට ගත්තේ නෑ. වේගයෙන් හාවුන් පසුපස පන්නා ගියා. හාවුන් වහා දිව ගොස් තැන්න පුරා තැනින් තැන තිබුණු





ගුල් වලට රිංගා ගත්තා.

"ටිමීට කතා කරලා වැඩක් වෙන්නෙ නෑ. එයා හාවෝ දැකලා පිස්සු වැටිලයි ඉන්නේ." ඩික් කිව්වා. "කමක් නෑ. හාවෝ ටිමීට අහුවෙන්නෙ නෑ. ජේනවද, හාවෝ ටිමී එක්ක හොරා පොලිස් සෙල්ලම් කරනවා වගේ."

බැලූ බැල්මටම ඩික්ගේ කතාව ඇත්තක් වගේ පෙනුණා.

ටිමී එක් හාවෙකු පසුපස පන්නා ගියා. ඒ හාවා වහා දිව ගොස් ළඟම තිබූ ගුලකට රිංගා ගත්තා. ටිමී ආපසු හැරී වෙනත් හාවෙකු පසුපස පන්නා යන්නට උත්සාහ කළා. ඒත් ඒ හාවාත් ගුලකට රිංගා ගත්තා.

ටිමී හති දමමින් වටපිට බැලුවා. තවත් හාවෙක් ගුලකින් ඉහළට මතු වුණා. ටිමී ඒ දෙසට දිව ගියේ කේන්තියෙන්. ඒත් ටිමී එතැනට යන විට ඒ හාවාත් ගුලකට රිංගාගෙන අතුරුදන් වී සිටියා...! ආපසු හැරී බලන විට කලින් වතාවේ ගුල් වලට රිංගා ගත් හාවුන් ආපසු සෙමින් සෙමින් ගුල් වලින් ඉහළට මතු වෙමින් සිටින බව ටිමීට පෙනුණා.

තැන්නේ තැනින් තැන තිබූ ගුල්වලින් හාවුන්ගේ සුදු පැහැදි දිගු කන් යුවල බැගින් වරින් වර ඉහළට එස වෙන්නටත් සැණෙකින් අතුරුදන් වන්නටත් පටන් ගත්තා. ටිමී ඒ මේ අත දුවමින් උමතුවෙන් මෙන් හාවකු අල්ලා ගන්නට උත්සාහ කළා.

අන්තිමේදී ටිමීට හොඳටම හති වැටුණා. ඉන්පසු දිව එළියේ දමාගෙන 'හැහ්...! හැහ්...!' කියමින් හති අරින්නට පටන් ගත්තා.

ළමුන් මේ සිදුවීම දෙස බලා සිටියේ සිනාසෙමින්...!

"දවල් කෑම ගැන මොකද හිතන්නේ?" අන්තිමේදී ඈන් අනෙක් ළමුන්ගෙන් ඇසුවා. "තවම දවල් වෙලා නම් නෑ. ඒ වුණාට මට යන්තම් බඩගින්නක් දැනෙනවා."

"තව ටිකක් දුර ගිහින්ම කෑම පාර්සලය දිග අරිමු." ජූලියන් කිව්වා. "කෑම කන්න නවතින්න හොඳ තැනක් මම සිතියමෙන් බලලයි තියෙන්නේ."

"අද රෑට අපි නතර වෙන්නේ ගොවි ගෙදරකද?" ජෝර්ජ් ඇසුවා. "ගොවි ගෙදරක නවතින්න තියෙනව නම් මමත් හරි කැමතියි. ඒත් කලින් දන්වන්නේ නැතුව ඇවිත් එයාලා අපිව නතර කර ගන්න කැමති වෙයි ද දන්නෙ නෑ."

"විනෝදයට ඇවිදින්න එන අයට නවාතැන් දෙන ගොවිපළවල් මේ පිටිසර පළාත්වල ඕනෙ තරම් තියෙනවා." ජූලියන් කිව්වා. "මම සිතියමෙන් බලලා ඒ වගේ තැන් දෙකක්ම හොයා ගත්තා."

ළමුන් තැන්න පසු කර ගොස් පුංචි කන්දක් නගින්නට පටන් ගත්තා. පටු මාවත, කඳු මිටියාවත් දිගේ ඈතින් ඈතටම වැටී ඇති බව ළමුන්ට පෙනුණා. මේ පාළු පිටිසරබද පළාතේ සැතපුම් ගණනක් යන තුරු ගම්මානයක්, ගොවිපළක් දකින්නට තිබුණේ නෑ.

හුදෙකලා පටු මාවතේ තැනින් තැන එකා දෙන්නා බැගින් ඒ මේ අත දුව පනිමින් සිටි හාවුන් ළමුන් එනවා දැක වහා කැලයට පැන පඳුරු අතරින් නොපෙනී ගියා.

එක් හාවෙක් මාවත අද්දර තිබූ තරමක විශාල ගුලකට රිංගා ගත්තා. ටිමී ඒ දැක වහා එතැනට දිව ගියා. අනෙක් හා ගුල්වලට වඩා එය තරමක විශාල එකක්. ටිමී හාවා අල්ලා ගන්නට ගුල ඇතුළට රිංගා ගත්තා...!

ජෝර්ජ් කෑ ගසමින් එතැනට දිව ආවා...!

ටිමීට හා ගුලෙන් පිටත එන්නට නොහැකිව සිර වී සිටින බව ළමුන්ට වැටහුණා. ඈන් හා ගුල අසලින්ම බිම වැතිරී ගුල ඇතුළට අත දැම්මා. ටිමීව ඇගේ අතට හසු වුණා. ඇය ටිමීගේ පිටුපස කකුල් දෙකෙන් අල්ලා පිටතට අදින්නට පටන් ගත්තා. ටිමී වේදනාවෙන් කෑ ගසන්නට වුණා...!

"අනේ...! එයාට රිදෙනවා ඇති ඈන්...!" ජෝර්ජ් ටිමී ගැන දුකින් කිව්වා.

"කරන්න දෙයක් නෑ." ජූලියන් කිව්වා. "ටිමීව හා ගුලෙන් එළියට





ගන්න වෙන විදිහක් ඇත්තෙම නෑ."

"මම ටිමීගේ කකුල් දෙකෙන් අල්ලාගෙන ඉන්නේ. කවුරු හරි මගේ කකුල් දෙකෙන් අදින්න." ඈන් කිව්වා. "එතකොට මාත් එක්ක ටිමීවත් ඇදිලා ඒවි."

අනෙක් ළමුන් ඈන්ගේ කකුල් වලින් ඇද්දා. ඈන් සමගම ටිමීත් හා ගුලෙන් පිටතට ඇදී ආවා.

ටිමී වේදනාවෙන් කෑ ගසන්නට පටන් ගත්තා. ජෝර්ජ් ටිමීව අතගාමින් සනසන්නට උත්සාහ කළා.

"ටිමීගේ ඇඟේ කොහේ හරි තැනක් රිදෙනවා ඇති." ජෝර්ජ් කිව්වා. "ඒ නිසයි මේ තරම් කෙඳිරි ගාන්නේ. ජූලියන්, ටිමීව පශු වෛද්‍යවරයෙකුට පෙන්වන්න වෙයිද?"

"පිස්සු කතා කියන්න එපා...!" ජූලියන් කිව්වා. "පශු වෛද්‍යවරු කියන්නේ කැලේ ගස් අතරේ හැදෙන ජාතියක් නෙමෙයි නේ. මේ වගේ පාළු පළාතක කොහෙන්ද පශු වෛද්‍යවරයෙක් හොයන්නේ...!"

"ඔයා කලබල වෙන්න එපා...!" ඩික් කිව්වා. "අපි හෙමිහිට ඇවිදගෙන යමු. තව ටිකකින් ටිමීගේ අමාරු සේරම ඉබේම හරි යාවි. එයාගේ ඇඟට ඒ තරම් ලොකු අමාරුවක් තියෙන බවක් පේන්නෙ නෑ. හැබැයි හාවා අල්ල ගන්න බැරි වුණු නිසා හිතට නම් ටිකක් අමාරු ඇති...!"

ළමුන් සෙමින් සෙමින් මාවත දිගේ ඉදිරියට ගමන් කරන්නට පටන් ගත්තා. ජෝර්ජ් ටිමීගේ ගමනේ වෙනසක් තියෙනවාදැයි කියා වරින් වර සැකයෙන් බලමින් ගමන් කළා. ටිමී වලිගය පහත දමාගෙන, බිම බලාගෙනම ගමන් කළා. වරින් වර සිහින් කෙඳිරියකුත් නැගුවා.

ළමුන් තරමක උස් කඳු ගැටයක් මුදුනට ළඟා වුණා.

"මේ තමයි 'ෆෝලවේහිල්'" ජූලියන් සිතියම බලමින් කිව්වා. "අපි මෙතන නැවතිලා දවල් කෑම කමු."

ඔවුන් ගසක් යට සෙවණේ වාඩි වී කෑම කන්නට සූදානම් වුණා. මුළු පලාතම කුඩා පඳුරු විශේෂයකින් වැසී ගොස් තිබුණා. ඈන් එවැනි මිටි පඳුරක් මත වාඩි වුණා.

"හරිම ෂෝක්...!" ඇය කිව්වා. "වාඩි වෙලා ඉන්න ඇඟට හරිම පහසුයි...! සනීපයි...!"

"මේ පඳුරු දෙක තුනක් ගලවගෙන ඉස්කෝලෙට අරන් යන්න ඕනේ." ඩික් සිනාසෙමින් කිව්වා. "පන්ති කාමරයේ පුටු වල වාඩි වෙලා ඉන්න එක හරිම අමාරු වැඩක්. මේ පඳුරක් දෙකක් අරන් ගිහින් පුටුව උඩින් තියා ගත්තම කුෂන් කළා වගේ තියෙයි...!"

අනෙක් ළමුන් ඩික්ගේ කතාවට සිනාසුණා. ජූලියන් සැන්විච් පාර්සලය බිම තැබුවා. ඈන් එය දිග හැරියා. ජෝර්ජ්, ටිමී දෙන්නාත් ඒ අසලින්ම හිඳ ගත්තා.

"ෂහ්...! අපූරු සුවඳ." ඈන් කිව්වා. "ඉස්සර වෙලාම ඕනේ මොන ජාතියෙන්ද?"

"ආ.... මම හැම ජාතියෙන්ම සැන්විච් එක ගානේ එක උඩින් තියලා එක පාරටම කනවා...!" ඩික් කිව්වා. "චීස්, හැම්, බේකන්, සේරම...!"

ඈන් ඩික්ට සිනාසුණා. ඒත් ඩික් සැන්විච් හතරක්ම එක උඩ තබා අතට ගත්තා. ඉන්පසුව පුළුවන් තරම් කට හැර ඒ හතරම එකවර හපා කැබැල්ලක් කඩා ගත්තා...!

"ඩික්, ඔයාගේ කට ඔය තරම් ලොකු ඇති කියලා මම හිතුවෙ නෑ." ඈන් සිනාසෙමින් කිව්වා.

"කොහොම වුණත් එක ගානේ කන එක වඩා හොඳයි වගේ." ඩික් අන්තිමේදී කිව්වා. "ටිමී මෙන්න මගෙ ගානේ කෑල්ලක්."

ටිමී ඩික් දුන් සැන්විච් කැබැල්ල සෙමින් කන්නට පටන් ගත්තා. ඒත් තවමත් ටිමී වැඩි ඇඟබිල්ලක් නැතිව අපහසුවෙන් මෙන් සිටින බව පෙනුණා.





ජෝර්ජ් ටිමී ගැන සිතමින් දුක් වුණා. ඇය කමින් සිටි සැන්විච් වලින් ලොකු කැබලි කඩා ටිමීට කන්නට දුන්නා.

"ටිමී ඔය අපූරුවට ඉන්නේ...!" ඩික් කිව්වා. "මට පේන්නේ එයා අපි ඔක්කෝටම වැඩිය හොඳට කනවා."

හොඳින් හිරු එළිය වැටී ඇති දිනක සුන්දර කඳු මුදුනක, ගසක් යට සිසිල් සෙවණේ වාඩි වී, දිවා ආහාරය ගන්නට ලැබීම ගැන ළමුන් සිටියේ හරිම සතුටින්. එත් ජෝර්ජ් නම් තවමත් හිටියේ ටිමී ගැන තරමක් දුක් වෙමින්.

# ටිමීට කරදරයක්..... 04

ළමුන් දිවා ආහාරයෙන් පසුව ගස් සෙවණ යට වැතිරී ටික වේලාවක් ගත කළා. ඔවුන් ගෙන ආ කෑම වලින් තරමක ලොකු කේක් කැබැල්ලකුත්, සැන්විච් දෙකකුත් පමණක් ඉතිරි වී තිබුණා.

ටිමී සිතුවේ ඉතිරි කෑම සියල්ලම ගිළ දමන්නටයි. එත් ජූලියන් කේක් කැබැල්ල පසුව ප්‍රයෝජනයට ගන්නට සිතා කඩදාසියක ඔතා ගමන් මල්ලකට දැම්මා.

"ටිමී..! ඔයා කෑවා හොඳටම ඇති." ජූලියන් කිව්වා.

ටිමී 'වූෆ්...!' කියා වලිගය වැනුවා.

"හවසට මග දී බඩගිනි දැනුණොත් මේ කේක් කෑල්ල කන්න බැරියැ." ජූලියන් කිව්වා. "අද රෑට අපි නතර වෙන්න හිතාගෙන ඉන්න ගොවි ගෙදරිනුත් මේ වගේම අපූරු කෑම වේලක් ලැබෙයි කියලා මං හිතනවා."

"මට නම් ආයේ හෙට උදේ වෙනකල් කෑම ඕනෙ නැති වෙයි." ඈන් කිව්වා. "මගේ බඩ ඒ තරමටම පිරිලා."

"එහෙමනම් ඉතින් ඈන්ගේ අද රෑ කෑම පංගුවත් ටිමීට දෙන්න වෙයි." ඩික් කිව්වා. "ටිමීට දුන්නොත් නම් එපා කියන එකක් නෑ."





"දැන් අපි යමු." ජූලියන් කිව්වා. "මේ විදිහට එකම තැනක නැවතිලා පැය ගණන් කාලෙ නාස්ති කරන්න ඕනෙ නෑ. රෑ වෙන්න කලින් අපි ඊළඟ ගමට යන්න ඕනේ. අපි රෑට නවතින ගොවිපළ තියෙන්නේ එහේ."

"ඒකට කියන නම මොකක්ද?" ඈන් ඇසුවා.

"බිලූපොන්ඩ් ගොවිපළ" ජූලියන් කිව්වා.

"එහේ අපිට නිදා ගන්න ඇති වෙන්න ඉඩ තියේවිද?" ඈන් ආයෙත් ඇසුවා.

"ඔයාලා දෙන්නට විතරක් කාමරයක් ලැබුණාම ඇති." ජූලියන් කිව්වා. "මටයි ඩික්ටයි එළියේ තියෙන පිදුරු මඩුවක හරි ගබඩාවක හරි නිදා ගන්න පුළුවන්."

"මාත් ආසයි මඩුවක නිදා ගන්න." ඈන් කිව්වා. "අපි හැමෝම පිදුරු වලින් බිම ඇඳන් හදාගෙන ඊට උඩින් ඇතිරිලි එළාගෙන මඩුවක නිදා ගනිමු."

"නෑ... නෑ...." ජූලියන් කිව්වා. "ගෑනු ළමයි ගේ ඇතුළේ නිදා ගන්න ඕනේ."

"ගෑනු ළමයෙක් වෙලා ඉපදුණ එක හරිම කරදරයක්." ජෝර්ජ් තරහින් කිව්වා.

ඒ ඈය නිතරම කියන කතාවක්...!

"පිරිමි ළමයින්ට විතරක් තමන් කැමති ඕනෙම දෙයක් කරන්න පුළුවන්. අපිට බෑ. ඒක හරිම අසාධාරණයි...!" ජෝර්ජ් කියන්නට පටන් ගත්තා. "ජූලියන්, ඔයා මොනවා කිව්වත් කමක් නෑ. මම නම් නිදා ගන්නේ එළියේ මඩුවක..."

"ඔයා මම කියන දේ අහන්න ඕනේ." ජූලියන් කිව්වා. "නැත්නම් මම ආයේ ඔයාව මේ වගේ ගමන් එක්ක එන්නෙ නෑ. ගෑනු ළමයින්ගේ ආරක්ෂාව ගැන බලන එක පිරිමි අයගේ යුතුකමක්...!"

"ඒ වුණාට මම නම් ඒකට කැමති නෑ." ජෝර්ජ් නොරිස්සුම් හඬින් කිව්වා. කවුරුත් මොකටද මං ගැන බලන්නේ. මට තනියම මං ගැන බලා ගන්න පුළුවන්."

"එක සැරයක් කිව්වාම අහන්න." ජූලියන් ඈට තදින් කිව්වා.

"දැන් ඔය කතාව නවත්තමු." ඈන් කතාවට මැදිහත් වෙමින් කිව්වා. හැමෝම ඊට එකඟ වුණා.

ජූලියන්, ඩික්, ජෝර්ජ්, ඈන් සතරදෙනා ගමන් මලු කරේ එල්ලාගෙන පිටිසරබද මාවත දිගේ නැවතත් සෙමින් සෙමින් ඉදිරියට ගමන් කරන්නට පටන් ගත්තා.

ටිමී ඔවුන් පසුපසින් ආවා. ඒත් කලින් තරම් ඉක්මනින් නොවෙයි. ටිමී තරමක් අපහසුවෙන් ගමන් කරන බව ජෝර්ජ්ට තේරුණා.

"ටිමී, මොකද ප්‍රශ්නේ..?" ඈය ඇසුවා. "මේ බලන්න... ටිමී හෙමින් හෙමින් එන්නේ. ඇවිදින්නේ ටිකක් අමාරුවෙන් වගේ."

ළමුන් සියලු දෙනාම ටිමී දෙස බැලුවා. ටිමී එක් කකුලක් යන්තමින් කොර ගසමින් ඇවිදින බව ඔවුන්ට පෙනුණා. ජූලියන් ටිමීගේ කකුල අත ගා බැලුවා.

"හා ගුලෙන් එළියට ගනිද්දී ටිමීගේ කකුල උළුක්කු වෙලා වෙන්න ඇති." ඔහු කිව්වා.

"ජූලියන්, අපි තවම ගමක කිට්ටුවටවත් ඇවිත් නැද්ද?" ජෝර්ජ් දුකින් ටිමී දෙස බලමින් ඇසුවා.

"සිතියමේ හැටියට නම් මෙතන ඉඳලා බීකොන් කියන ගමට තියෙන්නේ තව ටික දුරයි." ජූලියන් කිව්වා. "ඒ ගමේ පශු වෛද්‍යවරයෙක් හිටියොත් අපි ටිමීව එයාට පෙන්නමු. ඒත් පශු වෛද්‍යවරයෙක්ට පෙන්නන්න තරම් ටිමීගේ කකුලට හානියක් වෙලා නෑ කියලා තමයි මට නම් හිතෙන්නේ. සමහරවිට තව ටිකක් වෙලා යනකොට ඔය ගතිය අඩු වෙන්නත් පුළුවන්."

"අපි කොහොම හරි ටිමීට ඒ ගමට අරන් ගිහින් පශු





වෛද්‍යවරයෙකුට පෙන්නන්න ඕනේ...!" ජෝර්ජ් කිව්වා. "ටිමී පොඩි බලු පැටියෙක් වෙලා හිටියා නම් අපිට එයාව උස්සගෙන වත් යන්න තිබුණා. ඒත් ටිමී දැන් හරිම ලොකුයි නේ."

"ඔහ්..! ටිමීව උස්සගෙන යන්න නම් හිතන්නවත් එපා...!" ඩික් කිව්වා. "ටිමීට එක කකුලක් උස්සගෙන කකුල් තුනෙන් විතරක් සෑහෙන දුරක් යන්න ලේසියෙන්ම පුළුවන්.... නැද්ද ටිමී..?"

ටිමී 'වූෆ්...!' කියා ඩික්ගේ කතාව අනුමත කළා.

"ටිමී, අපි හෙමිහිට ඉස්සරහට යමු." ජෝර්ජ් ටිමීව අතගාමින් කිව්වා.

ළමුන් ආපසු ගමන පටන් ගත්තා. ඔවුන් වරින් වර ටිමී දෙස හැරී බලමින් සෙමින් සෙමින් ඉදිරියට ගමන් කළා. මුලින්ම ටිමී ගමන් කළේ තරමක් කොර ගසමින්. ඒත් ටික දුරක් යද්දී ටිමී ආබාධයට ලක් වූ කකුල ඔසවාගෙන අනෙක් කකුල් තුනෙන් පමණක් ගමන් කරන්නට පටන් ගත්තා.

ජෝර්ජ් ටිමී ගමන් කරන හැටි බලා සිටියේ හරිම දුකෙන්. අනෙක් ළමුනුත් ටිමී ගැන කණගාටු වුණා. ඔවුන් ඉදිරියට ගමන් කළේ ඉතාම සෙමින්.

ළමුන් සතර දෙනාත් ටිමීත් බීකොන් ගමට ළඟා වුණා. බීකොන් ගමේ මාවත අද්දර තිබූ පුංචි වෙළඳ සැලක ජනේලය පිරිසිදු කරමින් සිටි කාන්තාවක් ළඟට ජූලියන් කිට්ටු වුණා.

"මේ ගමේ පශු වෛද්‍යවරයෙක් ඉන්නවද?" ජූලියන් ඈගෙන් ඇසුවා.

"නෑ. මේ ගමේ නම් නෑ." කාන්තාව කිව්වා. "මීට හැතැප්ම හයකට විතර ඈතින් තියෙන මර්ලින්ස් ගමේ තමයි ළඟම ඉන්න පශු වෛද්‍යවරයා ඉන්නේ."

ඒ කතාව ඇසූ ජෝර්ජ් හොඳටම කලබලයට පත් වුණා.

'ටිමීට තව හැතැප්ම හයක් මේ විදිහට යන්න බෑ.' ඈය තමාටම කියා ගත්තා.

"ඒ ගමට යන්න බස් එකක් තියෙනවද?" ජෝර්ජ් කාන්තාවගෙන් ඇසුවා.

"නෑ.... මරිලින්ස් ගමට බස් යන්නෙ නෑ." ඇය කිව්වා. "ඔය ළමයින්ට ඕනේ බල්ලාගේ කකුල සනීප කර ගන්න නම් ස්පිගි ගෙදරට යන්න. එහේ ඉන්න ගස්ටන් මහත්මයා අශ්වයෝ ඇති කරනවා. අශ්වයින්ට බෙහෙත් කරනවා. එයා බල්ලන්ටත් බෙහෙත් කරනවා. ඔය ළමයි බල්ලව එහාට එක් කරගෙන යන්න. එයා මොනව හරි කරයි."

"ඔහ්...! බොහොම ස්තූතියි...!" ජෝර්ජ් සතුටින් කිව්වා.

ඒ සතුටුදායක ආරංචියෙන් ඇය නොඉවසිලිමත් වුණා.

"එහාට ගොඩක් දුරද?" ඇය ඇසුවා.

"හැතැප්ම බාගයක් විතර....!" කාන්තාව කිව්වා. "මේ පාර දිගේ අර ඈත පේන කන්ද පැත්තට යන්න. එතනින් දකුණට හැරිලා කන්ද නගින්න. එතකොට ලොකු ගෙයක් පෙනේවි. ඒ තමයි ස්පිගි ගෙදර. ඒ ගෙදර ලේසියෙන්ම හොයා ගන්න පුළුවන්. ගේ ඉස්සරහ ලොකු ඉස්තාලක් තියෙනවා."

"ගස්ටන් මහත්මයා ඉන්නවද කියලා අහන්න. එයා හරිම කරුණාවන්ත කෙනෙක්. හැබැයි ඔය ළමයින්ට ටිකක් වෙලා ඉන්න වෙයි. එයා අශ්වයෝ අරගෙන කොහේ හරි ගිහින් නම් එනකොට හවස් වෙයි."

ළමුන් කාන්තාවගෙන් සමුගෙන ආපසු මගට බැස්සේ ඇයට මුව නොසෑහෙන තරම් ස්තූති කරමින්.

"මං හිතන්නේ අපි ගස්ටන් මහත්මයා හම්බ වෙන්න ගියොත් හොඳයි වගේ." ජූලියන් කිව්වා. "මම ජෝර්ජ් එක්ක ටිම්වත් අරගෙන එහාට යන්නම්. ඩික්, ඔයා ඈන්වත් එක් කරගෙන අපි අද රෑ නවතින්න හිතාගෙන ඉන්න බිලූපොන්ඩ් ගොවි ගෙදරට යන්න. ඔය දෙන්නා වේලාසනින් ගිහින් නවතින තැන පිළියෙළ කරලා තියා ගන්න එක හොඳයි නේ. එතකොට අපි දෙන්නට රෑ වෙලා හරි එතෙන්ට එන්න පුළුවන්."





"හරි...!" ඩික් කිව්වා. "මම ඈන්වත් එක්ක යන්නම්. අපි එහාට යනකොට රෑ වෙයි. ඔයාලා ටිම්ව ගස්ටන් මහත්මයට පෙන්නලා බෙහෙත් අරගෙනම එන්න. ජූලියන් ඔයා ළඟ ටෝච් එකක් තියෙනවා නේද?"

"ඔව්. තියෙනවා." ජූලියන් කිව්වා. "අපි ගස්ටන් මහත්මයව හම්බ වෙලා, ටිම්ගේ කකුලට බේත් කරගෙන, පුළුවන් තරම් ඉක්මනට බිලූපොන්ඩ් ගොවි ගෙදරට එන්නම්. ඒක තියෙන්නේ මේ ගමේ ඉඳලා හැතැප්ම එක හමාරක් විතර දුරින්."

ජූලියන්, ජෝර්ජ් දෙදෙනා ටිම්ත් සමග ස්පිගි නිවස බලා ගමන් කරන්නට පටන් ගත්තා. ටිම් එක් කකුලක් කොර ගසමින් කකුල් තුනකින් අපහසුවෙන් ඇවිද ගියා. ඈන්, ඩික් දෙදෙනා ඒ දෙස දුකින් බලා සිටියා.

"ටිම්ට ඉක්මනට සනීප වෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා...!" ඩික් කිව්වා. "නැත්නම් අපේ ගමනේ කිසිම විනෝදයක් නැති වෙයි."

ඩික්, ඈන් දෙදෙනා බිලූපොන්ඩ් ගොවිපළ සොයා ඉදිරියට ගමන් කරන්නට පටන් ගත්තා.

"සිතියමත් ජූලියන් ළඟ නේ. මට ඒක ඉල්ල ගන්න බැරි වුණා." ඩික් කිව්වා. "කාගෙන් හරි හරියටම අහලා බලන්න ඕනේ බිලූපොන්ඩ් ගොවිපළ තියෙන්නේ කොහේද කියලා."

ඒත් ඔවුන් ගමන් කළ පාළු පිටිසර පළාතේ මිනිසුන් ගැවසුණේ හරිම කලාතුරකින්. ඔවුන් සෑහෙන දුරක් ඉදිරියට ගමන් කළත් අතරමග දී ඔවුන්ට කිසිවෙක් හමු වුණේ නෑ.

අන්තිමේදී අශ්ව කරත්තයක් පදවාගෙන එන මිනිසෙක් ඔවුන් ඉදිරියට ආවා. ඩික් කෑ ගසා ඔහුගේ කරත්තය නතර කර ගත්තා.

"බිලූපොන්ඩ් ගොවිපළට යන්නේ මේ පාරෙන් නේද?" ඩික් ඔහුගෙන් ඇසුවා.

"ආ....!" මිනිසා හිස වනමින් කිව්වා.

"මම ඇහුවේ.... මේ පාරෙන් බිලුපොන්ඩ් ගොවිපළට යන්න පුළුවන්ද කියලා?" ඩික් ආපසු තරමක් හයියෙන් ඇසුවා.

"ආ....!" මිනිසා හිස සොළවමින් නැවතත් කිව්වා.

'මෙයා හැමදේටම 'ආ...!' කියන්නෙ මොකද?' ඩික් සෙමින් තමාටම කියා ගත්තා.

"මේ පාර බිලුපොන්ඩ් වලටද?" ඩික් මහා හඬින් කෑ ගසා තුන් වැනි වරටත් ඇසුවා.

"ආ...!" මිනිසා නැවතත් කිව්වා.

ඔහු පටු මාවතේ ඈත කෙළවරින් දකුණු පැත්තට හැරෙන්නට තිබූ තවත් අතුරු පාරක් දෙසට අත දිගු කර ඩික්ට පෙන්නුවා.

"ඔහ්...! හරි...! හරි...! අපි අතනින් දකුණට හැරෙන්න ඕනේ. එහෙම නේද?" ඩික් කිව්වා.

"ආ....!" කියමින් හිස සෙළවූ මිනිසා එකවරම අශ්ව කරත්තය ඉදිරියට පදවාගෙන යන්නට ගියා.

ඩික් පාරෙන් ඉවතට පැන ඔහුගේ කකුල අශ්වයින්ට පෑගීමෙන් වලකා ගත්තා.

"'ආ...!' කියලා විතරක් කියන මනුස්සයෙක්ගෙන් පාර අහගෙන බිලුපොන්ඩ් ගොවිපළ හොයා ගන්න ලැබුණොත් ඒක ඉතින් අපේ ලොකු වාසනාවක්...!" ඩික් කිව්වා. "යමු ඈන්...!"



# ඈන් සහ ඩික් අතරමං වී..... 05

ඉක්මනින්ම අඳුර වැටෙන්නට පටන් ගත්තා. අහස අඳුරු වලාකුළු වලින් පිරී ගියා. හිරු වලාකුළු අතර සැඟවී ගියා.

"වැස්සක් එන්නයි යන්නේ...!" ඩික් කිව්වා. "ෂහ්...! මම හිතුවේ අද හවස් වරුව අපූරු හැන්දෑවක් වෙයි කියලා. දැන් බලාගෙන ගියාම නරක හැන්දෑවක් නේ."

"අපි ටිකක් ඉක්මන් කළොත් හොඳයි නේද ඩික්?" ඈන් ඇසුවා. "වැස්සට තෙමී තෙමී ගහක් යටට වෙලා ඉන්න මම නම් චුට්ටක්වත් කැමති නෑ."

ඩික්, ඈන් දෙදෙනා ඉක්මන් ගමනින් ඉදිරියට යන්නට පටන් ගත්තා. ඔවුන් දෙදෙනා කරත්තකරුවා පෙන්වූ අතුරු පාර දිගේ දකුණට හැරී ගමන් කරන්නට පටන් ගත්තා.

ඒ පටු මාවත දෙපස දිගටම උස් රූස්ස ගස් වැවී තිබුණා. ඒවායේ මුදුන් එකිනෙක සම්බන්ධ වී වියනක් මෙන් සෑදී තිබුණා. ඒ නිසා පරිසරය ඉතා අඳුරු ස්වභාවයක් ගත්තා.

"මේ පාර හරියටම හරිද දන්නෙ නෑ." ඩික් කිව්වා. "තව කාගෙන් හරි අහල බලන්න ඕනේ."

"ඔව්, හැබැයි ඉතින් තව කවුරු හරි හම්බ වුණොත් තමයි

අහිත් එක ගින්නක් දවසක, මේ පිටිසර පළාතේ මොනවා ගිහි ගන්නද? ආවම සීනුවක් නාද කරලා සතුරු ආක්‍රමණයක් වගේ හදිසි අවස්ථාවක් ආවම සීනුවක් නාද කරලා වේ විදිහට අනතුරු ඇඟෙව්වේ ආදි කාලෙදි නේ. දැන් ඒවට සයිරන් තලා තියෙනව නේ."

"දැනුත් ඇහෙන්නේ ආදි කාලේ සීනුවක සද්දෙ වෙන්න බැරිද?" ඈන් ඇසුවා.

"අපොයි...! එහෙම වෙන්න විදිහක් නෑ." ඩික් සිනාසෙමින් කිව්වා. "මේක ඇත්තටම මේ පළාතේ කොහේ හරි තැනක තියෙන දැන් කාලේ සීනුවකින් දෙන සංඥාවක්, ඈන්."

ටික වේලාවකින් ගුප්ත සීනු හඬ නැවතුණා. ආපසු අඳුරු පරිසරයම නිහඬතාවේ ගිලී ගියා.

"ඇති යාන්තම්....! ඒක නැවතුණා." ඈන් සැනසුම් සුසුමක් හෙළමින් කිව්වා. "ඩික්, මේ මහ රෑ ඒ සීනුව ගැහුවේ මොකද දන්නෙ නෑ. අපි ඉක්මනට බ්ලූපොන්ඩ් ගොවි ගෙදර හොයාගෙන යමු."

ඩික් ඈන්ගේ අතින් අල්ලාගෙන විදුලි පන්දමත් දල්වාගෙන අඳුරු කැලෑව මැදින් වැටුණු අඩි පාර දිගේ ඉදිරියට ගමන් කරන්නට පටන් ගත්තා.

ටික දුරක් ඉදිරියට යද්දී ඔවුන් සතුටට පත් කරන දසුනක් ඈතින් දකින්නට ලැබුණා...!

"පුංචි එළියක්...!"

"අන්න....! ඒ බ්ලූපොන්ඩ් ගොවි ගෙදර වෙන්න ඇති...!" ඩික් සතුටින් කිව්වා. "ඈත් එතෙන්ට තව වැඩි දුරක් නෑ. අපි ඉක්මනට යමු."

ළමුන් පඳුරු අතරින් වැටී තිබුණු අඩි පාර දිගේ ඉක්මනින් ඉදිරියට ගමන් කර, ගරා වැටුණු පැරණි කලු ගල් තාප්පයක් අසලට ආවා. තාප්පයේ එක් තැනක මළ බැඳී දිරා ගිය පැරණි යකඩ ගේට්ටුවක් පිහිටා තිබුණා.





ඩික් ගේට්ටුව තල්ලු කළා. එය 'කිරි කිරි' හඬක් නගමින් සෙමින් විවර වුණා. ඔහු ඈන් සමග වත්තට ඇතුළු වී තරමක් ඈතින් වත්ත මැදට වන්නට පිහිටා තිබූ ගරා වැටුණු පැරණි පන්නයේ නිවස වෙත ගමන් කරන්නට පටන් ගත්තා. ඔවුන් ගමන් කළ අඩි පාර ගස් වලින් වැටී ගිය කොළ රොඩු වලින් පිරී ගොස් තිබුණා.

අඳුරු පරිසරයම මූසල පාළු ස්වභාවයක් ඉසිලුවා. මිදුල පුරාම තණකොළ වැවී කොළ රොඩු වලින් පිරී තිබෙන සැටි ඩික් විදුලි පන්දම් එළියෙන් දැක්කා.

නිවසේ දොර වසා දමා තිබුණා. නිවස තුළ යන්තමින් එළියක් දැල්වෙන බව ජනේලයෙන් පෙනෙන්නට තිබුණා. ඩික් ජනේලයෙන් එබී බැලුවා. මහලු කාන්තාවක් තෙල් ලාම්පුවක් දල්වාගෙන ඒ අසලට වී රේන්ද ගොතමින් සිටින සැටි ඔහුගේ ඇසට හසු වුණා.

ඩික් දොරේ සීනුවක් ඇත්දැයි කියා පිරික්සා බැලුවා. ඒත් එවැන්නක් පෙනෙන්නට තිබුණේ නෑ. ඔහු කිහිප වරක්ම දොරට තට්ටු කළා. ඒත් තෙල් ලාම්පුව අසල වාඩි වී ගෙත්තම් කරමින් සිටි මහලු කාන්තාවට එය ඇසුණු බවක් පෙනෙන්නට තිබුණේ නෑ.

"සමහරවිට එයාගේ කන් දෙක ඇහෙන්නෙ නැතුව ඇති..." ඩික් ඈන්ට කිව්වා.

ඔහු පෙරට වඩා තරමක් හයියෙන් දොරට තට්ටු කළා. ඒත් මහලු කාන්තාව දිගටම ගෙත්තම් කරමින් සිටියා.

"මේ විදිහට නම් අපිට අද රෑ මේ ගෙදර නවාතැන් ගන්න වෙන්නෙ නෑ." ඩික් කිව්වා.

ඔහු දොරේ හැඬලය කරකවා බැලුවා. දොර හැරුණා. ඔහු නිවසේ සාලයට ඇතුළු වී මහලු කාන්තාව වාඩි වී සිටි තැනට ගමන් කළා. ඈන් ඔහු පසුපසින් ආවා.

මහලු කාන්තාව ඩික්ගේ දර්ශනයෙන් තිගැස්සී ගියා...! ඇය කලබලයෙන් නැගිට්ටා. ඇගේ අතේ තිබුණු ගෙත්තම බිම අත හැරුණා...! ඇය වාඩි වී සිටි පුටුවත් පිටුපසට පෙරළී ගියා...!

"කරදර කළාට සමාවෙන්න....!" ඩික් කිව්වා. "අපි කීප සැරයක්ම දොරට තට්ටු කළා. ඒත්...."

"ඔය ළමයා මාව හොඳටම බය කළා....!" ඇය පපුවට අත තබා ගනිමින් කිව්වා. "මේ මහ රෑ මොකටද මෙහාට ආවේ...?"

ඩික් බිම පෙරළී තිබූ පුටුව ආපසු කෙළින් කර තැබුවා. මහලු කාන්තාව නැවතත් එහි වාඩි වුණා.

"අපි අද රෑට නවතින්න තැනක් හොයාගෙනයි ආවේ..." ඩික් කිව්වා. "මේ බ්ලූපොන්ඩ් ගොවි ගෙදර නෙවෙයිද? අපිට මෙහෙ නවතින්න පුළුවන් වෙයිද? අපි දෙන්නා ඇරුණම තවත් ළමයි දෙන්නෙක් ඉන්නවා....."

"මගේ කන් දෙක හරියට ඇහෙන්නෙ නෑ." මහලු කාන්තාව කිව්වා. "මං හිතන්නේ ඔය ළමයි දෙන්නා අතරමං වෙලා වගේ...!"

ඩික් හිස සොළවා 'ඔව්' කිව්වා.

"ඒත් ඔය ළමයින්ට මෙහෙ නවතින්න දෙන්න බෑ." මහලු කාන්තාව කිව්වා. "මගේ පුතා කාටවත් මේ ගෙදරට එන්න දෙන්නෙ නෑ. ඔය ළමයි එයා එන්න කලින් මෙහෙන් යනව නම් හොඳයි. එයාට හරියට තරහා යනවා. හරිම දරුණුයි.... ඔව්..."

ඩික් හිස සොළවා, ජනේලයෙන් පිටතට අත දිගු කර, වැසි සහිත අඳුරු රාත්‍රී පරිසරය ඇයට පෙන්නුවා. ඉන්පසුව වැස්සෙන් තෙත බරිත වී සීතලෙන් ගැහෙමින් සිටි ඈන්ව පෙන්නුවා. ඩික් අදහස් කළ දේ මහලු කාන්තාව තේරුම් ගත්තා...!

"ඔය ළමයි අතරමං වෙලා... වැස්සට තෙමිලා... මහන්සියි... ඇත්ත...! මම ඔය ළමයින්ව ආපහු හරවලා යවන එක හරි නෑ." ඇය කිව්වා. "ඒත් මගේ පුතා කැමති නෑ, අමුත්තන්ව මේ ගෙදර නවත්ත ගන්නවට."

ඩික් අත දිගු කර ඈන්ව ඇයට පෙන්නුවා. සාලයේ කෙළවරක තිබූ සෝෆාව පෙන්නුවා. ඉන්පසුව තමාවම පෙන්වා ජනේලයෙන් පිටත අඳුරු පරිසරය පෙන්නුවා. එවරත් මහලු කාන්තාව ඩික්ගේ අදහස





එකවරම තේරුම් ගත්තා...!

"ඔය ළමයා කියන්නේ, ඔයාගේ සහෝදරිය විතරක් මට නවත්තා ගන්න පුළුවන් නම් ඔය ළමයා වෙන කොහේ හරි ගිහින් රෑට නවතින්න තැනක් හොයා ගන්නම් කියලා නේද? ඇය කිව්වා.

ඩික් හිස සොලවා 'ඔව්' කිව්වා.

'මට නම් කොහේ හරි රෑ ගත කරන්න පුළුවන්.' ඩික් සිතුවා. 'ඈන්ව නවත්තලා යන්න තිබුණොත් ඇති.'

"මගේ පුතා ආවම ඔය දෙන්නව දකීවි." මහලු කාන්තාව කල්පනා කරමින් කිව්වා.

ඉන්පසු ඇය ඈන්ගේ අතින් අල්ලාගෙන සාලයේ කෙළවරක තිබූ පුංචි දොරක් වෙත කැඳවාගෙන ගියා. ඇය දොර හැරියා. තිවසේ ඉහලින් පිහිටි සොල්දරයට නගින ලී තරප්පු පෙළ දොරට ඉදිරියෙන් දකින්නට තිබුණා.

"ඔය ළමයා මෙතනින් උඩට නගින්න." මහලු කාන්තාව ඈන්ට කිව්වා. "හැබැයි මම හෙට උදේට කතා කරන කල් පහළට එන්න එපා. මගේ පුතා ආවම ඔය ළමයා මේ ගෙදර නැවතිලා ඉන්නවා දැක්කොත් මාව ලොකු කරදරේකයි වැටෙන්නේ."

"යන්න ඈන්...!" ඩික් කිව්වා. "ගිහින් බලන්න. රැයක් නවතින්න තරම් හොඳ තැනක් වගේ හිතෙනව නම් ඉන්න. හරි නෑ වගේ පේනව නම් ආපහු එන්න. සොල්දරේ උඩ ඉඳන් බිත්තියෙන් එළියට ජනේලයක් තියෙනවද බලන්න. තිබුණොත් එළියෙ මිදුලේ ඉඳන් මට ඔයාට කතා කරන්න පුළුවන්. එතකොට ඔයා හොඳින් ඉන්නවා කියලා මට දැනගන්න පුළුවන්."

"හරි...!" ඈන් කිව්වා.

ඇය තරමක දෙගිඩියාවෙන් ලී තරප්පු පෙළ දිගේ තිවසේ සොල්දරයට නගින්නට පටන් ගත්තා.

ඈන් තිවසේ සොල්දරය උඩට නැග ඇගේ අතේ තිබූ පුංචි

විදුලි පන්දම අල්ලා වටපිට පිරික්සා බැලුවා. තරමක අපිරිසිදු පෙනුමක් තිබෙන මෙට්ටයක් කුඩා සොල්දර කාමරයේ බිම අතුරා තිබුණා. ඒ අසලම පැරණි පන්නයේ පුටුවකුත් තිබුණා. පුටුව මත පොරවන රෙද්දක් නමා තබා තිබුණා. පසෙකින් තිබූ පුංචි ස්ටූලය මත වතුර ජෝගුවකුත් තබා තිබුණා.

සොල්දරයේ එක් බිත්තියකින් පිටතට විවර වූ කුඩා ජනේලයක් තිබුණා. ඈන් ජනේලය අසලට ගොස් ඉන් පිටතට එබී බලා මිදුලේ සිටි ඩික්ට කතා කළා.

"ඩික්, මම මෙහේ...! ඔයාට පේනවද?"

"ඔව්...! ඈන්.... කොහොමද...? ඔතන හොඳද?" ඩික් මිදුලේ සිට නිවසේ මුදුන් බිත්තියේ ඉහළ කෙළවරක පිහිටා තිබූ පුංචි ජනේලය වෙත විදුලි පන්දම එල්ල කරමින් ඇසුවා.

"මේ අහන්න ඈන්. මම මේ අහළ පහළම රෑට නවතින්න තැනක් හොයා ගන්නම්. එතකොට ඕනෙම වෙලාවක ඔයාට වුවමනාවක් වුණොත් මට කතා කරන්න පුළුවන් නේ." ඔහු කිව්වා.



# මැදියම් රැයේ..... 06

"මෙතන නරකම නෑ..." ඈන් ජනේලයෙන් පහළට එබී බලමින් ඩික්ට කිව්වා. "මෙට්ටෙකුයි, පොරවන රෙද්දකුයි තියෙනවා. මට මේ ඇති. ඒත්.... ඩික්, ඔයා නිදියන්නේ කොහෙද? ජූලියන්, ජෝර්ජ් දෙන්නත් ආවම එයාලටත් නිදාගන්න තැනක් නෑ."

"මම ඒ ගැන බලා ගන්නම්." ඩික් කිව්වා. "ඔයා ඒ ගැන කරදර වෙන්න එපා. එළියේ මඩුවක් තියෙනවා. මම ඒකේ නිදා ගන්නම්."

"ඩික්, ඔයයි ජූලියනුයි දෙන්නත් එක්ක ජෝර්ජ්ටත් ඒ මඩුවේ නිදා ගන්න පුළුවන් වෙයි නේද?" ඈන් ඇසුවා. "මේ වයසක නෝනා වෙන කවුරුවත් ආපහු ගේ ඇතුළට ගනීවි කියලා මම නම් හිතන්නේ නෑ."

"ඒ දෙන්නා ආවම මම ජෝර්ජ්ටත් නිදා ගන්න තැනක් ලෑස්ති කරලා දෙන්නම්." ඩික් කිව්වා. "ඈන්, ඔයා බෑග් එකේ තියෙන ඉතුරු සැන්ඩ්විච් එක කාලා නිදා  ගන්න. තව කේක් කෑල්ලකුත් තිබුණා නේ. ඒකත් කන්න. තෙත ඇඳුම් මාරු කරලා සපත්තු දෙක වේලෙන්න තියලා නිදා ගන්න. මම මේ ළඟම තියෙන මඩුවේ ඉන්නවා. වුවමනාවක් වුණොත් මට කතා කරන්න."

ඈන් ජනේලය ළඟින් ඉවත්ව ගියා. ඇය සිටියේ බඩගින්නෙන් වගේම මහන්සියෙන්. ඇය ගමන් මල්ලේ තිබුණු දහවල් ඉතිරි වූ

සැන්විච් සහ කේක් කෑබැල්ල ආහාරයට ගෙන ජෝගුවේ තිබූ වතුර බිව්වා. ඉන්පසුව තෙත ඇඳුම් මාරු කරගෙන, මෙට්ටයේ දිගා වී, පොරෝනයෙන් සිරුර වසා ගත්තා.

ජූලියන්, ජෝර්ජ් දෙන්නා එන හඬ ඇසේවි දැ යි කියා ඇන් ටික වේලාවක් අවදියෙන් බලා සිටියා. ඒත් මහන්සිය නිසා ඇය ඉක්මනින්ම නින්දට වැටුණා.

ඩික් නිවස ඉදිරිපිට පිදුරු මිටි ගොඩ ගසා තිබූ මඩුවට ගොස් නිදා ගන්නට තැනක් පිළියෙළ කර ගත්තා.

'ටිමීට මොකද දන්නෙ නෑ.' ඩික් තනිවම සිතුවා. 'ජූලියන්, ජෝර්ජ් දෙන්නා මේ පාර දිගේ මෙහාටම එයිද, නැත්නම් වෙන කොහාටවත් යයිද දන්නෙත් නෑ. ඈන්ට හරියට නිදා ගන්න පුළුවන් විදිහේ පරිසරයක් සොල්දරේ උඩ තියෙනවද දන්නෙත් නෑ.'

ඩික් පිදුරු මිටි කිහිපයක් මත නිදා ගන්නට තැනක් පිළියෙළ කර ගත්තා. ඉන්පසුව ඔහුගේ ගමන් මල්ලේ තිබුණු ඉතිරි වූ සැන්විච් සහ කේක් කෑබැල්ල කමින් ජූලියන්, ජෝර්ජ් දෙදෙනා එන තුරු බලා සිටියා.

ටික වේලාවකින් ඔහුට ඈනුමක් ගියා. ඔහු සිටියේ මහන්සියෙන්. ඒ නිසා ඔහුටත් නිදිමත දැනුණා.

ටිකෙන් ටික මැදියම් රැයත් ළඟා වුණා. ජූලියන්, ජෝර්ජ් දෙදෙනා තවමත් එහි ආවේ නෑ. මහලු කාන්තාවගේ පුතාත් එදින රැයේ නිවසට ආවේ නෑ.

ඩික් අවදියෙන් සිටිමින් ජෝර්ජ් සහ ජූලියන් ගැන සිතමින් කරදර වුණා. ඉතින් ඔහුට නින්ද ළඟා වුණේ නෑ. ඩික් නිවස දෙස බැලුවා. මහලු කාන්තාව නින්දට ගොස් සිටියත් තවමත් සාලයේ තෙල් ලාම්පුව දැල්වෙමින් තිබුණා.

'ලාම්පුව පත්තු කරලා තියෙන්නේ එයාගේ පුතා එනකල් වෙන්න ඇති.' ඩික් සිතුවා.





ඒ වන විට වැස්ස හොඳටම පායා තිබුණා. අහසේ වලාකුළු තරමක් ඉවත් වී, යන්තම් හඳ එළිය වැටී, පරිසරය පැහැදිලිව දිස් වන්නට පටන් ගත්තා.

'දැන් ජූලියන්, ජෝර්ජ් දෙන්නා එනකල් ඇහැරගෙන ඉඳලා වැඩක් නෑ.' ඩික් තමාටම කියා ගත්තා. 'රෑ වුණු නිසා ඒ දෙන්නා ස්පිගි ගෙදරම නවතින්න ඇති.'

ඔහු පිදුරු මිටි මත සකස් කර ගත් යහනේ වැතිරී නිදා ගන්නට වුණා. ඒත් ටික වෙලාවකට පසු ඇසුණු සිහින් හඬකින් ඔහු හදිසියේම අවදි වුණා...!

'මොකක්ද ඒ සද්දේ...?' ඔහු තනිවම කල්පනා කළා. 'සමහරවිට පිදුරු මඩුවේ ඉන්න මීයෙක් වෙන්න ඇති.'

ඒත් ටික වේලාවකින් ඩික්ට පැහැදිලිවම ඇසුණේ කවුරුන් හෝ මඩුව .දෙසට සෙමින් ඇවිදගෙන එන හඬක්...! ඔහු නිහඬවම අසා සිටියා. ඔහු පුදුමයට පත් කරමින් අපූරු යමක් සිදු වුණා...!

"ඩික්...! ඩික්....!"

මඩුව දෙසට ඇවිදගෙන ආ මිනිසා රහසින් ඩික්ගේ නම කියා සෙමින් කතා කළා. ඩික් පුදුමයට පත් වුණා...!

'ඒ කවුද...? ජූලියන්ගේ කට හඬ නෙමෙයි නේ. වෙන කවුද එතකොට...! ඒත් මම මේ මඩුවේ ඉන්නවා කියලා කිසිකෙනෙක් දන්නෙ නෑ නේ.' ඩික් පුදුමයෙන් කල්පනා කළා. ඔහු තවත් ටික වේලාවක් නිහඬවම වැතිරී අසා සිටියා. එවර මිනිසා තරමක් උස් හඬින් කතා කළා.

"ඩික්...! මම දන්නවා ඔයා මේ මඩුව ඇතුළේ ඉන්නවා කියලා. මම බලාගෙනයි හිටියේ ඩික් මඩුවට රිංගනවා...! ඉක්මනට ඇවිත් මේක අරගන්න."

අඳුරේම පිදුරු මඩුව ඉදිරිපිට සිටගෙන සිටි මිනිසාගේ මේ

පත් වුණා...! ඔහු ඒ කටහඬ කතාවෙන් ඩික් හොඳටම පුදුමයට පත් වුණා...! ඔහු ඒ කටහඬ හඳුනන්නේ නැති නිසා හොඳටම කලබල වුණා. කළ යුත්තේ කුමක්දැයි කියා ඩික්ට කල්පනා වුණේ නෑ.

"ඉක්මනට ඩික්...!" මිහිසා කිව්වා. "මගේ අතේ රහස් පණිවිඩයක් තියෙනව ඔයාට දෙන්න. ඉක්මනට ඉන්න තැනකින් එළියට ඇවිත් ඒක අර ගන්න. මට ඉක්මනට මෙහෙන් යන්න ඕනේ...!"

'මේ මනුස්සයා කවුරු වුණත් කමක් නෑ. නැගිටලා ගිහින් බලනවා.' ඩික් අන්තිමේදී තීරණය කළා.

ඔහු නිදා සිටි තැනින් නැගිට අඳුරේම මඩුවේ කෙළවරට ගමන් කළා. මඩුව ඇතුළත සම්පූර්ණයෙන්ම අඳුරේ ගිලී තිබුණු නිසා පිටත සිටි මිහිසාට ඩික්ව පෙනුණේ නෑ.

"මම මෙහේ...!" ඩික් සෙමින් කිව්වා.

ඔහු කතා කළේ කටහඬ ටිකක් ගැඹුරු කරමින්...!

"මෙච්චර වෙලා එළියට එන්නේ නැතුව මොනවද කළේ..?" මඩුව අසල එළියේ සිටි මිහිසා කිව්වා.

හඳ එළියෙන් ඔහුගේ මුහුණ යන්තමින් දැක ගන්නට ඩික්ට හැකි වුණා. ඔහුගේ විශාල ඇස් දෙක අඳුරේ දිළිසුණා. ඩික් මිහිසාට පෙනෙන සේ මඩුවෙන් එළියට යාමෙන් වැළකී අඳුරේම නැවතී බලා සිටියා.

"මෙන්න...! නෙයිලර්ගේ පණිවිඩයක් තියෙනවා." මිහිසා කිව්වා. "හොඳට අහගන්න... 'මහ ගස් දෙක - කළුදිය විල - දඟකාර ජේන් - මැගී දන්නවා'. මේ පණිවිඩය එක්ක මේ වගේම තවත් කඩදාසි කෑල්ලක් මැගීටත් දෙන්න කියලා නෙයිලර් මට කිව්වා."

මිහිසා මඩුවෙන් එළියේ සිටම පුංචි කඩදාසි කැබැල්ලක් ඩික් අතට දුන්නා. ඩික් අඳුරේ සිට අත දිගු කර එය අරගත්තා...!

"ඇහුණද ඩික්...? 'මහ ගස් දෙක - කළුදිය විල - දඟකාර





ජේන් - මැගී දන්නවා.'" මිහිසා කිව්වා. "ඔන්න එහෙනම් පණිවිඩේ හරි නේ. මම යනවා."

මිහිසා අඳුරේම පිට වී ගොස්, සඳ එළිය වැටුණු අඩි පාර දිගේ ගමන් කර, ගස්වල සෙවණැලි අතරින් නොපෙනී ගියා. ඩික් ඇස් අදහා ගත නොහැකිව ටික වේලාවක් පුදුමයෙන් ගල් ගැසී බලා සිටියා...!

'කවුද මේ මනුස්සයා...?' ඩික් කල්පනා කළා. 'මහ රෑ ඇවිත් දීලා ගිය අමුතු පණිවිඩය මොකක්ද? මේක හීනයක්ද? ඒත් වෙන්න බෑ...! මම ඉන්නේ ඇහැරිලා නේ...!'

ඩික් ටික වේලාවක් හඳ එළිය වැටී තිබුණු අඳුරු පරිසරය දෙස විමසිල්ලෙන් බලා සිටියා. ඒත් පරිසරයේ කිසිම හැලහොල්මනක් තිබුණේ නෑ.

ඔහු මඩුවේ පිදුරු මිටියක් මත වාඩි වී විදුලි පන්දම අතට ගත්තා. එය දල්වාගෙන මිහිසා ඔහු අතට දුන් කඩදාසි කැබැල්ල පිරික්සා බැලුවා.

එය අපිරිසිදු වී පොඩි වී ගිය පුංචි කඩදාසි කැබැල්ලක්. කඩදාසියේ අපැහැදිලි අත් අකුරින් වචන කිහිපයක් ලියා තිබුණා. අපැහැදිලි රූප සටහනකුත් ඇඳ තිබුණා. ඩික්ට විදුලි පන්දමේ එළියෙන් ඒ වචන කිහිපය හරි හැටි කියවා ගන්නටවත්, රූප සටහන පැහැදිලිව තේරුම් ගන්නටවත් හැකි වුණේ නෑ.

'මේක හීනයක් වගේ...!' ඩික් තමාටම කියා ගත්තා.

ඔහු කඩදාසි කැබැල්ල කලිසම් සාක්කුවේ දමාගෙන ටික වේලාවක් පිදුරු මිටිය මත වැතිරී කල්පනා කරමින් සිටියා. අන්තිමේදී ඔහුට නොදැනීම නින්ද යන්නට ආවා.

ඒත් ටික වෙලාවකට පසුව ඩික්ට ආයෙත් වතාවක් කවුරුන් හෝ පිදුරු මඩුව දෙසට ඇවිදගෙන එන හඬ ඇසුණා. ඩික් නිහඬවම කන් දී ගෙන හිටියා.

'ඒ පාර කවුද...? අර මනුස්සයාම ආපහු සැරයක් ඇවිත්ද?' ඔහු කල්පනා කළා.

මඩුව දෙසට ආ මිනිසා අඳුරේම මඩුවට ඇතුළු වුණා...! ඩික් බියට පත් වුණා. ඒත් කිසිම ශබ්දයක් නොකර නිහඬවම වැතිරී බලා සිටියා.

'මේ නම් කලින් ඇවිත් ගිය මනුස්සයා නෙමෙයි.' ඩික් තමාටම කියා ගත්තා. 'මේ වෙන කෙනෙක්... දෙන්නගේ පෙනුම වෙනස්. මට ඒක හොඳටම විශ්වාසයි.'

ඩික්ගේ වාසනාවට මිනිසා ඔහු සිටි තැනට ආවේ නෑ...! ඔහු මඩුවේ එක් කෙළවරක තිබූ පිදුරු මිටියක් මත වාඩි වුණා. ඩික්ට කළ හැකි කිසිම දෙයක් තිබුණේ නෑ. මිනිසා පිට වී යන තුරු නිහඬවම ඉවසාගෙන සිටින්නට ඔහුට සිදු වුණා.

'ඒත්.., මේ මනුස්සයා එළි වෙනකල්ම මෙතන ඉඳයිද කවුද දන්නේ?' ඩික් නොඉවසිල්ලෙන් කල්පනා කළා. 'එහෙම වුණොත් මටත් මුළු රෑ තිස්සේම ඇහැරගෙන බලාගෙන ඉන්න වෙනවා.'

මිනිසා මඩුවෙන් පිටතට එබී බලමින් නොඉවසිල්ලෙන් මෙන් සිටින බව පෙනුණා. ඔහු කවුරුන් හෝ එන තුරු මග බලා සිටින බව ඩික්ට වැටහුණා.

මිනිසා සෙමින් තමාටම මුමුණමින් යමක් කියා ගත්තා. ඩික්ට ඔහු මිමිණූ දෙය පැහැදිලිව ඇසුණේ නෑ. ඒත් වචන කිහිපයක් පමණක් යන්තමින් අහුලා ගන්නට ඩික් සමත් වුණා.

"මොනවද මේ වෙන්නේ..." මිනිසා සෙමින් තමාටම මුමුණන අයුරු ඩික්ට ඇසුණා. "මම තව කොච්චර වෙලා මේ විදිහට බලාගෙන ඉන්නද...?"

මිනිසා වාඩි වී සිටි තැනින් නැගිට ගොස් මඩුවෙන් පිටතට එබී බැලුවා. ටික වේලාවක් අඳුරු වටපිටාව දෙස බලා සිට ආපසු මඩුවට ඇවිත් කලින් සිටි තැනින්ම වාඩි වුණා.





ඩික් බොහෝ වේලාවක් පිදුරු මිටිය මත වැතිර ගත් වනම මිනිසා මඩුවෙන් පිට වී යන තුරු බලා සිටියා. ඒත් අන්තිමේදී ඔහුට නොදැනීම නින්ද ගියා...!

පසුදා එළි වෙන තුරු ඩික්ට තදින් නින්ද ගොස් තිබුණා. උදෑසන හිරු එළිය වැටී පරිසරය ටිකෙන් ටික එළිය වන්නට පටන් ගත් විට ඩික් නින්දෙන් ඇහැරුණා. ඔහු තිගැස්සී ගොස් වටපිට බැලුවා...! මැදියම් රැයේ මඩුවට පැමිණි අමුත්තා පෙනෙන්නට සිටියේ නෑ...!

ඩික් නැගිට වටපිට බැලුවා. මුළු පරිසරයම නිහඬතාවේ ගිලී තිබුණා. කිසිවෙක් පෙනෙන්නට සිටියේ නෑ.

'එතකොට මම රෑයේ රෑ දැක්කේ හීනයක්ද?' ඩික් පුදුමයෙන් කල්පනා කළා...!

# පසු දා උදෑසන..... 07

ඩික් ඇඟමැලි කඩමින් නැගිට්ටා. ඔහුගේ ඇඳුම් පොඩි වී, දූවිලි තැවරී කිළුටු වී තිබුණා. සපත්තුවල මඩ තැවරී තිබුණා. ඒ වගේම ඔහුට තදින්ම බඩගිනි දැනුණා.

'ඈන්ටත් බඩගිනි ඇති.' ඩික් සිතුවා. 'මේ වයසක නෝනාගෙන් පාන්, චීස් ටිකක්වත් සල්ලි වලට ගන්න පුළුවන් වෙයිද දන්නෙ නෑ.'

ඩික් නැගිට මඩුවෙන් එළියට ගියා. ඔහු නිවසේ මුදුන් බිත්තියේ ඉහළ කෙළවර තිබූ පුංචි ජනේලය අසලට ගොස් ඒ දෙස බැලුවා. ඈන් වේලාසනම නැගිට ජනේලයෙන් පහළ බලාගෙන ඩික් එන තුරු රැඳී සිටියා.

"කොහොමද ඈන්...!" ඩික් ඈට කතා කර සෙමින් ඇසුවා.

"වරදක් නෑ..." ඈන් සිනාසෙමින් කිව්වා. "ඒත් මට දැන්ම පහළට එන්න බයයි. වයසක නෝනාගේ පුතා සාලේ ඉන්නවා. එයා හරිම නපුරු විදිහට එයාගේ අම්මාට බනිනවා මට කීප සැරයක්ම ඇහුණා. පව්...! ඒ වයසක නෝනා...! එයාගේ පුතා උඳේ පාන්දර ඉඳන්ම තරහෙන් පුපුර පුපුර කාට හරි බනිනවා. හොඳ වෙලාවට ඒ වයසක නෝනාගේ කන් දෙක ඇහෙන්නෙ නැත්තේ...!"

"එයා ගෙදරින් එළියට යනකල් අපි සද්ද නැතුව ඉඳිමු." ඩික්





කිව්වා. "ඊට පස්සේ අපි වයසක නෝනාට සල්ලි කීයක් හරි දීලා කෑම ටිකක් අරගනිමු."

"ඒක හොඳයි...!" ඈන් කිව්වා. "මගේ බෑග් එකේ කිසිම කෑමක් ඉතුරු වෙලා නෑ. එහෙනම් ඩික් ඔයා, ආපහු කතා කරන කල් මම මෙතෙන්ටම වෙලා ඉන්නම්."

ඩික් ඉක්මනින්ම මඩුවට ගොස් කිසිවෙකුටත් නොපෙනෙන තැනක් බලා පිදුරු මිටි කිහිපයකට පිටුපසින් වාඩි වුණා. ඔහු ටික වේලාවක් බලා සිටියා.

ටික වේලාවකට පසු මහළු කාන්තාවගේ පුතා නිවසේ ඉදිරිපස දොරටුවෙන් මිදුලට බැස්සා. ඔහු තමාටම යමක් මුමුණා කියා ගනිමින් නොඉවසිල්ලෙන් කිහිප වරක් මිදුලේ ඒ මේ අත ඇවිද්දා. ඔහු සිටින්නේ කේන්තියෙන් බව පෙනෙන්නට තිබුණා. අවුල්ව ගිය හිසකෙස් සහ මුහුණ පුරා අපිළිවෙළට වැවුණු රැවුලින් යුතු ඔහුට තිබුණේ කිළුටු පෙනුමක්.

අන්තිමේදී ඔහු පිට වී යන්නට ගියා. ගේට්ටුව ඇරෙන විටදී ඇසෙන 'කිරි කිරි' හඬ ඩික්ට ඇසුණා. ඉන්පසුව ඩික් සෙමෙන් මඩුවෙන් එළියට ආවා. ඔහු ගේට්ටුව දෙස බැලුවා.

'යන්තම් ඇති..! එයා ගිහින්.' ඩික් තමාටම කියා ගත්තා.

ඔහු සෙමින් නිවස දෙසට ගමන් කළා. එය හරිහැටි නඩත්තු නොකිරීම නිසා ගරා වැටෙමින් තිබෙන පැරණි නිවසක් බව දිවා ආලෝකයෙන් ඔහුට දැක ගන්නට ලැබුණේ එවිටයි.

ඩික් නිවසේ ඉදිරි දොර දෙසට ගමන් කළා. දොරට තට්ටු කිරීමෙන් පළක් නැති බව ඔහු දැන සිටියා. ඒ නිසා ඔහු දොරත් හැරගෙනම සාලයට ඇතුළු වුණා. මහලු කාන්තාව ඔහුව දැක කලබලයෙන් වහා එතැනට ආවා.

"මට ඔය ළමයි ගැන අමතක වෙලයි හිටියේ...!" ඈය කිව්වා. "අර ගෑනු ළමයා තවම සොල්දරේ උඩ නේද? ඉක්මන් කරලා එයාවත් එක් කර ගෙන මෙහෙන් පිට වෙලා යන්න. ඉක්මන් කරන්න...! මගේ පුතා එන්න කලින් මෙහෙන් යන්න...!"

"අපිට කෑම ටිකක් ගන්න පුළුවන් වෙයිද?" ඩික් ඇගෙන් ඇසුවා. ඇගේ කන් ඇසෙන්නේ නැති බව ඩික්ට මතක් වුණේ පසුවයි.

"කිව්වම අහලා ඔය ළමයි ඉක්මනට මෙහෙන් යන්න...!" මහලු කාන්තාව නැවතත් කිව්වා.

ඩික් මේසය මත තිබූ පාන් ගෙඩිය දෙසට අත දිගු කර පෙන්නුවා.

"බෑ...! බෑ...! ඉක්මන් කරලා මගේ පුතා එන්න කලින් ඔය ළමයගේ සහෝදරියවත් එක් කර ගෙන මෙහෙන් යන්න." ඇය කලබලයෙන් වටපිට බලමින් කිව්වා.

ඒත් එක්කම කවුරුන් හෝ නිවස දෙසට එන හඬ ඇසුණා...! ඩික් ආපසු හැරී බලන විට මහලු කාන්තාවගේ පුතා නිවසේ දොරකඩ සිටගෙන සිටින බව ඔහුට දැක ගන්නට ලැබුණා...!

ඔහුගේ අතේ බිත්තර කිහිපයක් තිබුණා. ඔහු උදේ පාන්දරින්ම කුකුළු කූඩු වලින් බිත්තර එකතු කරන්නට ගොස් තිබෙන බව පෙනුණා. ඔහු නිවසට ඇවිත් සිටින අනවසර අමුත්තා දෙස තරහින් පුපුරමින් බලා සිටියා.

"ආ....! කාගෙන් අහලද මෙහාට ආවේ...! යනවා යන්න මෙහෙන්...!" ඔහු දත් මිටි කමින් ඩික්ට කිව්වා.

'මම ඊයේ රෑ මඩුවේ නිදා ගත්තා කියලා මෙයාට දැන ගන්න ඉඩ තියන්න හොඳ නෑ.' ඩික් තමාටම කියා ගත්තා. "අපි ආවේ කෑම ටිකක් සල්ලිවලට ගන්න පුළුවන්ද බලන්න." ඩික් කිව්වා.

"ආ...! කවුරු? අපි..?" මහලු කාන්තාවගේ පුතා ඇසුවා. "තෝ එතකොට අනිත් අය? එක්ක එනවා බලන්න. මගේ කුකුළු කොටුවේ බිත්තර හොරකම් කරන්න ආව කොල්ලන්ට කරන්න ඕනෙ දේ මම දන්නවා."

"ඔහොම ඉන්න මම එයාලව එක්ක එන්නම්" කියමින් ඩික් ඇසිල්ලකින් නිවසින් එළියට පැන ගත්තා...!

මහලු කාන්තාවගේ පුතා ඉදිරියට පැන ඩික්ගේ කමිස කොලරයෙන් අල්ලා ගන්නට උත්සාහ කළා. ඒත් ඔහුගේ අතට හසු





නොවී පැන ගන්නට ඩික් සමත් වුණා. ඔහු පසු නොබලා ගේට්ටුව දෙසට දිව ගියා.

මහලු කාන්තාවගේ පුතා ඩික් පසුපස පන්නාගෙන ආවේ නෑ. ඒත් ඔහු කේන්තියෙන් දත්මිටි කමින් දොර අසල රැඳී ටික වේලාවක් බලා සිටියා.

ඔහු නිවස ඇතුළට ගිය පසු ඩික් සෙමින් සෙමින් ආපසු නිවස දෙසට ආවා.

'කොහොම හරි ඉක්මනටම ඈන්වත් අරන් මෙහෙන් පැනගන්න ඕනේ.' ඩික් තමාටම කියා ගත්තා.

ඩික් මඩුව පිටුපස සැඟවී ටික වේලාවක් බලා සිටියා. ටික වේලාවකට පසු මහලු කාන්තාවගේ පුතා කූඩයකුත් අතින් අරන් නිවසින් පිට වුණා. ඔහු කුකුළන්ට කෑම දමන්නට පිටත් වී ගිය බව ඩික්ට පෙනුණා. ඒ අතර වාරයේදී ඩික් වහාම ඈන් සිටි සොල්දරයේ ජනේලය අසලට දිව ගියා.

පහත මාලයේ සිදු වූ සියල්ල ඈන් සොල්දරයේ උඩ සිට අසා සිටියා. ඇය ඩික්ට කරදරයක් වේ දෝ කියා කල්පනා කරමින් ජනේලය අසලටම වී දිගටම ගෙවත්ත දෙස බලා සිටියා. ඩික් ජනේලය අසලට ඇවිත් ඈට කතා කළා.

"ඈන්...! දැන්මම පහළට එන්න...! එයා ගියා...! ඉක්මන් කරන්න...!" ඩික් කිව්වා.

ඈන් සොල්දරයෙන් පහළට බසින්නට වේලාව එන තුරු ඇගේ ගමන් මල්ලත් කරේ එල්ලාගෙන සූදානමින් බලා සිටියේ බොහෝ වේලාවකට පෙර සිටයි. ඩික්ගේ සංඥාව ලැබුණු ගමන්ම ඇය ලී තරප්පු පෙළ බැස නිවසේ පහළ මාලයට දිව ආවා. ඩික් නිවසේ සාලයට ඇතුළු වී මේසය මත පවුමේ කාසියක් තැබුවා.

"මේ අපිට තවාතැන් දුන්නට ගාස්තුව" ඔහු ඈන් සමග කිව්වා. "යමු...! ඈන්"

ඩික් ඈන්ගේ අතින් ඇදගෙන පුළුවන් තරම් වේගයෙන් ගේට්ටුව

පැන ගත්තා. ඔවුන් දෙදෙනා මග දෙසට දිව ගොස් ඉන් පිටතට හැරී බැලුවේ අඩි පාර දිගේ සෑහෙන දුරක් ඈතට දිව නැවතී ආපසු ගිය පසුවයි.

"ඩික්...! ඒ ගෙදර වගේ අපිරිසිදු, මුසල, බය හිතෙන තැනක් මම මීට කලින් කවදාවත් දැකලා නෑ." ඈන් හති දමමින් කිව්වා. "රෑට නවතින්න මේ වගේ තැනක් තෝරා ගන්න ජූලියන්ට පිස්සුද මන්දා...! ඒක ගොවි ගෙදරක් නෙමෙයි. වගාවක්වත්, සත්තුවත් පේන්න හිටියේ නෑ. අඩුම ගානේ බල්ලෙක්වත්...!"

"ඈන්, ඒක බිලූපොන්ඩි ගොවිපළ නෙමෙයි කියලයි මට නම් හිතෙන්නේ...!" ඩික් කිව්වා. "ඊයේ අපිට පාර වැරදුණා. අපි ආවේ සාමාන්‍ය ගැමි ගෙදරකට. නියම බිලූපොන්ඩි ගොවිපළ මේ ළඟම කොහේ හරි ඇති."

"ජූලියන්, ජෝර්ජ් දෙන්නා දැන් මොනවා හිතනවා ඇත්ද?" ඈන් කිව්වා. "ඒ දෙන්නා හොඳටම කලබල වෙලා ඇති. අපිට මොකද වුණේ කියලා හොයනවා ඇති. ඩික්, ඔයා හිතන්නේ ඒ දෙන්නා ඊයේ රෑ නියම බිලූපොන්ඩි ගොවිපළට යන්න ඇති කියලද?"

"අපි ගිහින් බලමු." ඩික් කිව්වා. "ඈන් මගේ පෙනුම කොහොමද? හිඟන්නෙක් වගේද...?"

"හ්ම්...! කොණ්ඩෙවත් පීරලා නෑ...!" ඈන් කිව්වා. "හොඳටම අවුල් වෙලා. මූණත් දැලි කුණු ගෑවිලා...! පිදුරු මඩු වල නිදා ගත්තම ඔහොම තමයි. අපි දිය පාරකින් මූණ කට හෝදගෙන යමු."

ඩික්, ඈන් දෙදෙනා මඩ සහිත පටු පාර දිගේ ටික දුරක් ඉදිරියට ඇවිදගෙන ගියා. අන්තිමේදී මාවතට තරමක් ඈතින් ගලා යන දිය පාරක් ඔවුන්ට දකින්නට ලැබුණා. ඩික්, ඈන් දෙදෙනා ඉන් මුහුණ කට සෝදා ගෙන සපත්තුත් පිරිසිදු කර ගත්තා. ඩික් ගමන් මල්ලේ තිබූ අලුත් ජර්සියක් හැඳගෙන ඈන්ගෙන් පනාව ඉල්ලා ගෙන හිස පීරා ගත්තා.

"දැන් නම් ඔයාගේ පෙනුම සෑහෙන්න හොඳයි." ඈන් කිව්වා. "ඩික්, උදේ කෑම ගැන බැලුවොත් හොඳයි නේද? මට නම් හොඳටම බඩගිනියි. ඊයේ රෑ මම නිදා ගත්තු මෙට්ටේ ඒ තරම්ම සුවපහසු එකක්





නෙමෙයි. ඒත් මට මහන්සිය නිසා හොඳට නින්ද ගියා. නාඳුනන ගෙදරක සොල්දරේ උඩ තනියම නිදා ගන්න ටිකක් බයත් හිතුණා."

ඩික් යමක් කියන්නට පෙර පිරිමි ළමයෙක් පාර දිගේ ඉදිරියට එන හැටි ඔවුන්ට දකින්නට ලැබුණා. පිරිමි ළමයා ඩික් සහ ඈන්ව දැක පුදුමයට පත් වුණා.

"ආ...! හලෝ" ඔහු කිව්වා. "ඇවිදින්න ඇවිත් වගේ...!"

"ඔව්...!" ඩික් කිව්වා. "මේ පාරේ කෙළවරේ තියෙන ගෙදර බිලූපොන්ඩි ගොවි ගෙදරද ?" ඔහු කලින් දා රැය ගත කළ නිවස දෙසට අත දිගු කර පෙන්වමින් ඇසුවා.

පිරිමි ළමයා සිනාසුණා.

"ඒක ගොවි ගෙදරක් නෙමෙයි." ඔහු කිව්වා. "එහේ ඉන්නේ ටැගාර්ට් නෝනා. ඒ පැත්තට යන්න එපා. එයාගෙ පුතා ඔයාලව එළව ගනියි. අපි එයාට කියන්නේ 'කිළුටු ඩික්' කියලා. එයාට හරියට තරහා යනවා. බිලූපොන්ඩි ගොවිපළ තියෙන්නේ බීකොන් ගමේ ඉඳන් කෙළින්ම ඉස්සරහට තියෙන පාර දිගේ හැතැප්මක් විතර ඈතට ගියාම."

ඩික් සහ ඈන් ඒ පිරිමි ළමයාගෙන් සමු ගෙන ඉදිරියට ගමන් කරන්නට පටන් ගත්තා. කලින් දිනයේ හමු වූ කරත්තකරුවා ඔවුන්ට වැරදි පාරක් පෙන්වා ඇති බව ළමුන්ට වැටහුණේ පිරිමි ළමයාගේ කතාව ඇසීමෙන් පසුවයි.

"ඊයේ රෑ අපි අර හැමදේටම 'ආ...! ආ....!' කියන කරත්තකාරයගේ කීම අහලා මග දී දකුණට හැරුණ නේ." ඩික් තරහින් කිව්වා. "ඊයේ බීකොන් ගමේ දී අපිට හම්බ වුණු ගෑනු කෙනා ඔයාට මතකයි නේ. ටිම්ව ස්පිගි ගෙදරට එක්ක යන්න පාර කිව්ව කෙනා. අපි එතෙන්ට යමු. ගිහින් බිලූපොන්ඩි ගොවිපළට යන පාර හරියටම දැනගෙන ජූලියන්, ජෝර්ජ් දෙන්නව හොයා ගනිමු."

"බීකොන් ගමට ටෙලිෆෝන් තියෙනව නම් අපිට බිලූපොන්ඩි ගොවිපළට කතා කරලා ජූලියන්ලා එහේ ඉන්නවද කියලා දැන ගන්න පුළුවන්." ඈන් කිව්වා. "ආපහු හැතැප්මක් විතර පයින් යනවට වැඩිය ඒක ලේසියි නේ."

"ඒක හොඳ අදහස...!" ඩික් කිව්වා. "ටිමීට මොකද දන්නෙ නෑ. අපේ විනෝද ගමන හිතුව තරම් හොඳ නෑ වගේ...!"

"ඇයි එහෙම කියන්නේ...!" ඈන් තරහින් කිව්වා. "පටන් ගත්තු දවස්වල ටිකක් කරදර වුණාට ඉතුරු දවස් ටික හොඳින් ගත කරන්න පුළුවන් වෙයි."

"අපි ඉස්සර වෙලාම බීකොන් ගමෙන් උදේ කෑමට දෙයක් සල්ලිවලට අරගෙන ඊට පස්සේ අනිත් දේවල් ගැන බලමු." ඩික් කිව්වා. "බිලූපොන්ඩ් ගොවිපළ හොයන්න කලින් කාලා ඉන්න ඕනේ."

ඩික්, ඈන් දෙදෙනා බීකොන් ගමට ඇතුළු වුණා.

"ඩික්...! අතට පුංචි කෑම කඩයක් තියෙනවා." ඈන් කිව්වා. "ඒකෙ තියෙන කෑම මොනවද දන්නෙ නෑ."

"ඉස්සරවෙලාම මෙහේ ටෙලිෆෝන් තියෙනවද කියලා බලමු." ඩික් කිව්වා. "අපි බිලූපොන්ඩ් ගොවිපළට කතා කරන්න ඕනේ."

ළමුන් දෙදෙනා ඉදිරියට ගමන් කළා.

ඒත් සමගම කවුරුන් හෝ ඔවුන්ට කතා කරන හඬ ඈතින් ඇසුණා...!

"ඩික්...! ඩික්...! ඈන්...! හේයි...!"

ඒ ජූලියන්ගේ කටහඬ.

ජූලියන්, ජෝර්ජ් සහ ටිමී මාවතේ අනෙක් කෙළවරේ සිට වේගයෙන් ඔවුන් වෙතට දිව එමින් සිටියා...!

මුලින්ම ඔවුන් සිටි තැනට ආවේ ටිමී. ටිමීගේ කකුලේ ආබාධය සම්පූර්ණයෙන්ම සුව වී ඇති බව පෙනෙන්නට තිබුණා. ටිමී සතුටින් බුරමින් ඩික්ගේත් ඈන්ගේත් ඇඟට පැන්නා. වලිගය වනමින් ඔවුන්ව ලෙව කන්නට පටන් ගත්තා.

"ඔහ්...! ජූලියන්...! ජෝර්ජ්...! ඔයාලව දකිනකල් මට ඉවසුමක් තිබුණේ නෑ...!" ඈන් සතුටින් කිව්වා. "අපිට ඊයේ රෑ බිලූපොන්ඩ්





ගොවිපළට යන පාර වැරදුණා. දැන් ටිමීට සනීපයි වගේ...!"

"ඔව්...! හොඳටම සනීපයි." ජෝර්ජ් කිව්වා. "ඔයාලා කොහෙද හිටියේ?"

"උදේට කෑවේ නෑ නේද?" ජූලියන් ඇසුවා. "අපිත් කෑවේ නෑ. අපි උදේ ඉඳන් හැම තැනම ඔයාලා දෙන්නව හෙව්වා. දැන් අපි අර කඩේට ගිහින් මොනව හරි කාල ඉඳිමු. කන ගමන්ම විස්තර කතා කරමු."

# නැවතත් එකට එක් වී..... 08

අන්තිමේදී ඔවුන් පස් දෙනාම නැවතත් එකට එක් වී සිටියා...! හැමෝම සතුටට පත් වුණා. ඔවුන් බීකොන් ගමේ මාවත අද්දර තිබූ පුංචි වෙළඳසැලට ගොඩ වුණේ හොඳටම බඩගින්නෙන්.

"අපිට උදේ කෑමට මොනවද ගන්න පුළුවන්...?" ජූලියන් වෙළඳසැලට ඇතුළු වෙමින් ඇසුවා.

"ගෙදර හදපු පාන්, චීස්, බිත්තර, බේකන්..." වෙළඳ සැලේ සිටි කාන්තාව කිව්වා. "ආ.... කිරි කෝපි... එතකොට...."

ඇගේ කෑම ලැයිස්තුව අසා ළමුන් සතුටින් ඉපිළී ගියා...! ජූලියන් කෑම ඇණවුම් කළා. වෙළඳ සැලේ සිටි කාන්තාව කෑම පිළියෙළ කරන්නට එතැනින් ඉවත් වී ගියා. ළමුන් වෙළඳ සැලේ එක් කෙළවරක තිබූ පුංචි මේසය වටා වාඩි වුණා.

"දැන් කියන්නකෝ ඔයාලගේ විස්තරේ...!" ඩික් කිව්වා. "ඔයාලා ස්පිගි ගෙදරට ගියාද? ගස්ටන් මහත්මයා හිටියද?"

"නෑ...! අපි යන වෙලාවේ එයා ගෙදර හිටියේ නෑ." ජූලියන් කිව්වා. "ඒ වෙලාවේ එයා කොහේ හරි ගමනක් ගිහින්. ඒ වුණාට එයාගේ නෝනා හිටියා. එයා හරිම හොඳ කෙනෙක්. එයා කිව්වා ගස්ටන්





මහත්මයා එනකල් ඉඳලා ටිමීව පෙන්නන්න කියලා. ඉතින් අපි නැවතිලා බලාගෙන හිටියා.... හිටියා...."

"අපි රෑ අට වෙනකල්ම බලාගෙන හිටියා." ජෝර්ජ් කිව්වා. "අන්තිමේදී ගස්ටන් මහත්මයා ආවා."

"එයත් හරිම කරුණාවන්තයි." ජූලියන් කිව්වා. "එයා ටිමීගේ කකුල බලලා බෙහෙත් කළා. උළුක්කු වෙලා තිබුණේ කිව්වා."

"ගස්ටන් මහත්මයා ටික වෙලාවක් ටිමීගේ කකුල අතගගා ඉඳලා එක පාරටම හයියෙන් ඇද්දා. ටිමී මහ හයියෙන් කෑ ගැහුවා. ඒත් එක්කම ජෝර්ජ් ගස්ටන් මහත්මයාගෙ ඇඟට පැන්නා...! ගස්ටන් මහත්මයටයි මටයි හිනා...!" ජූලියන් සිනාසෙමින් කිව්වා.

"එයා ටිමීට හොඳටම රිද්දුව නේ." ජෝර්ජ් කිව්වා. "කොහොම හරි ඊට පස්සේ ටිමී හොඳට ඇවිදින්න පටන් ගත්තා."

"අහන්නත් සතුටුයි...!" ඈන් කිව්වා. "මට ඊයේ රෑ තිස්සෙම ඔයාලා ගැන කල්පනා වුණා."

"ඉතින් ඊට පස්සේ මොකද වුණේ...?" ඩික් ඇසුවා.

"ගස්ටන් නෝනා අපිට රෑ කෑමටත් ඉඳලා යන්න කිව්වා. ඒ වෙලාවේ ලොකු වැස්සකුත් වැස්ස නේ. අපි එහෙන් රෑට කෑම කාලා වැස්ස පෑව්වට පස්සේ රෑ නවය හමාරට විතර බිලූපොන්ඩ් ගොවිපළට යන්න පිටත් වුණා. ඔය දෙන්නා එහාට ඇවිත් නෑ කියලා අපි දැන ගත්තේ එතෙන්ට ගියාට පස්සෙ තමයි."

"ඒත් අපි හිතුවා ඔය දෙන්නා වෙන කොහේ හරි තැනක රෑට නවාතැන් ගන්න ඇති කියලා." ජෝර්ජ් කිව්වා. "අපි අද උදේ පාන්දරින්ම බිලූපොන්ඩ් ගොවිපළෙන් පිටත් වෙලා ඇවිත් ඔය දෙන්නව හොය හොයා ඇවිද්දා."

වෙළඳ සැලේ සිටි කාන්තාව ළමුන් ඉදිරියේ ඇති මේසය මත සුවඳ දමන උණුසුම් කෑම බන්දේසියක් ගෙනැවිත් තැබුවා. ළමුන්

කතාව මදකට නවතා ලහි ලහියේ කෑම කන්නට පටන් ගත්තා.

"තව මොනව හරි මදි වුණොත් මට කතා කරන්න." වෙළඳ සැලේ සිටි කාන්තාව ළමුන්ට කිව්වා. "මම ගිහින් කිරි කෝපි ලෑස්ති කරන්නම්."

ඇය එතැනින් පිට වී ගියා.

"ඈන්, ඉක්මනට කන්න." ඩික් කිව්වා. "නැත්නම් මම මේ සේරම කෑම ටික එකපාරටම කාලා දානවා...!"

"දැන්නම් මගේ ඇඟටත් අමුතු පණක් ඇවිත් වගේ." ඈන් සිනාසෙමින් කිව්වා."කෑම දැක්කම විතරක් ඇති බඩ පිරෙනවා."

"ඊයේ රෑ ඔයාලට මොකද වුණේ කියලා තාම කිව්වෙ නෑ නේ." ජුලියන් කිව්වා.

"පිස්සු කරත්තකාරයෙක්ගෙන් පාර අහලා ඊයේ හවස අපිට පාර වැරදුණා." ඩික් කෑම කමින්ම කිව්වා. "අපි බිලූපොන්ඩ් ගොවි ගෙදර කියල හිතාගෙන වෙන ගෙදරකට ගියා. අපි රෑ ගත කළේ එහේ."

"ඔහ්...! ඒත් ඉතින් ඒ ගෙදර උදවිය කිව්වෙ නැද්ද එහේ බිලූපොන්ඩ් ගොවි ගෙදර නෙමෙයි කියලා." ජෝර්ජ් කිව්වා. "ඔයාලා දෙන්නා නැතුව අපි ඊයේ රෑ කොච්චර නම් දුක් වුණාද?"

"ඒ ගෙදර හිටිය වයසක නෝනාගේ කන් දෙක චුට්ටක්වත් ඇහෙන්නෙ නෑ." ඈන් කිව්වා. "එයාට අපි කියපු එක වචනයක්වත් තේරුණේ නෑ. ඉතින් අපි හිතුවා ඒ බිලූපොන්ඩ් ගොවි ගෙදර වෙන්න ඇති කියලා. ඒක මහා මුසල, පාළු තැනක්...! අහික් එක රෑ හිස්සේ අපි ඔයාලා එනකල් හිතින් දුක් වෙවී බලාගෙන හිටියා."

"අපිට ඊයේ දවස හරිම කරදරයි." ඩික් කිව්වා. "ඈන්ට නිදා ගන්න වුණේ ඒ ගෙදර සොල්දරේ උඩ. මම නිදා ගත්තේ ගේ ඉස්සරහ තිබුණු පිදුරු මඩුවේ. අපි දෙන්නට ඒ ගෙදරින් රෑ කෑමවත් ලැබුණේ





නෑ. අපි එහාට ගියේ වැස්සේ හොඳටම තෙමිලා...! සීතලේ...! බඩගින්නේ...!"

"අහන්නත් දුකයි...!" ජෝර්ජ් කිව්වා.

"ඒ මදිවට හරි අමුතු දේවලුත් සිද්ධ වුණා...!" ඩික් කිව්වා.

"ඒ මොනවද?" ජුලියන් කුතුහලයෙන් ඇසුවා.

"යන ගමන් වැඩි විස්තර කියන්නම්." ඩික් කිව්වා. "අද එළි වුණාට පස්සේ මට හිතුණා ඒ සේරම ඊයේ දැකපු හීනයක්ද කියලා...!"

"ඩික්...! ඔයා මට එහෙම දෙයක් ගැන කිව්වේ නෑ නේ." ඈන් පුදුමයෙන් කිව්වා.

"ඔයාට ඒ ගැන කිසිම දෙයක් කියන්න තරම් අද උදේ මට වෙලාවක් තිබුණේ නෑ නේ." ඩික් කිව්වා. "උදෙන්ම අර කරදරකාර මනුස්සයාව මගඇරලා ඈන්වත් එක් කර ගෙන එහෙන් පැන ගන්න ඕනෙ වුණා. ඊළඟට බඩගිනි වැඩි නිසා ඉක්මනට කෑම කන්න තැනක් හොයා ගන්නයි, ඔයාලා දෙන්නව හොයා ගන්නයි ඕනෙ වුණා..."

"මට පේන්නේ ඔයාලා දෙන්නට ඊයෙ රෑ සෑහෙන්න කරදර සිද්ධ වෙලා වගේ." ජෝර්ජ් කිව්වා. "මහ රෑ කළුවරේ අතරමං වෙලා, වැස්සට තෙමිලා...."

"ඒත් මට නම් ඒ හැම දේකටම වඩා බය හිතුණේ ඊයේ රෑ ඇහුණු අර මුසල සීනු සද්දේට...!" ඈන් කිව්වා. "ජුලියන්, ඔයාලට ඒක ඇහුණේ නැද්ද?"

"ඇහුණා. ඒ සීනුවෙන් අනතුරු අඟවන්නේ මොකක් ගැනද කියලා ඔයාලා දැනගෙන හිටියේ නැද්ද?" ජුලියන් ඇසුවා. "ඒ සීනුව මේ ළඟ තියෙන බන්ධනාගාරයේ අනතුරු ඇඟවීමේ සංඥාවක්...! ඒකෙන් අහළ පහළ ගම්වල මිනිස්සුන්ට කියන්නේ, 'හිරකාරයෙක් හිරෙන් පැනලා කල්පනාවෙන් ඉන්න' කියන එකලු. අපිත් ඒ ගැන දැන ගත්තේ ස්පිගි ගෙදරින්."

ඈන් බියෙන් ජූලියන් දෙස බැලුවා.

"මම ඊයේ ඒ ගැන දැනගෙන හිටියේ නැති එකත් හොඳයි...!" ඇය කිව්වා. "නැත්නම් මට තවත් බය හිතෙනවා. ඉතින් ඒ හිරකාරයව අල්ලගෙන නැද්ද?"

"මම ඒ ගැන හරියටම කියන්න දන්නෙ නෑ." ජූලියන් කිව්වා. "අපි මේ කඩේ අයිති නෝනාගෙන් අහල බලමු."

ටික වේලාවකින් වෙළඳ සැලේ සිටි කාන්තාව ළමුන්ට කිරි කෝපිත් රැගෙන එතැනට ආවා. ළමුන් බන්ධනාගාරයෙන් පලා ගිය සිරකරු ගැන විස්තර ඇගෙන් ඇසුවා.

"තාම නම් ඒ හිරකාරයව අල්ල ගෙන නෑ." ඇය කිව්වා. "ඒත් ළඟදිම දවසක අහු වෙයි. මේ පළාතේ හැම පාරක්ම ඊයේ ඉඳන් පොලීසියෙන් මුර කරනවා. හිරෙන් පැනලා තියෙන්නේ හරිම දරුණු මංකොල්ලකාරයෙක්ලු."

"ජූලියන්...! ඒ වගේ දරුණු හිරකාරයෙක් හිඳැල්ලේ ඉන්න වෙලාවක අපි මෙහෙම ඇවිදින්න යන එක භයානක නැද්ද?" ඈන් බියෙන් ඇසුවා.

"බය වෙන්න එපා...!" ජූලියන් කිව්වා. "අපේ ආරක්ෂාවට ටිමී ඉන්නව නේ."

තම කියනවා ඇසී ටිමී 'වූෆ්...!' කියා වලිගය වැනුවා.

ටිමීටත් රසවත් කෑම වේලක් ලැබී තිබුණා. ඉතින් ටිමී සිටියේ හරිම සතුටින්.

ළමුන් කෑම කා අවසන් කළා. ඔවුන් වාඩි වී සිටි තැන්වලින් නැගිට්ටා.

"හොඳටම කාලා වැඩි වෙලා. දැන් නම් මට ඇවිද ගන්නත් බෑ." ඈන් අපහසුවෙන් කිව්වා.





"එහෙම කියලා බෑ...! දැන් අපි මෙහෙන් පිට වෙලා යන්න ඕනේ." ජූලියන් කිව්වා.

ඔහු මග දී ආහාරයට ගන්නට සිතා සැන්ඩ්විච් කිහිපයකුත් මිල දී ගත්තා. කෑමවලට මුදල් ගෙවා වෙළඳසැලේ සිටි කාන්තාවගෙන් සමු ගත්තා. ළමුන් ඇගේ රසවත් ආහාර වේල ගැන අගය කරමින් කතා කළා. ඇයට ස්තූති කළා.

"ආයේ ඕනෙ වෙලාවක එන්න." ඇය ළමුන්ට සමු දෙමින් සතුටින් කිව්වා.

ජූලියන්, ඩික්, ජෝර්ජ්, ඈන්, ටිමී පස්දෙනා නැවතත් ගමන් ඇරඹුවා. ඔවුන් ටික දුරක් ඉදිරියට යද්දී ලස්සන දොළ පාරක් අසලට ළඟා වුණා.

"අපිට මේ දොළ පාර දිගේ ඉහළට ඇවිදගෙන යන්න බැරි ද?" ඈන් ජූලියන්ගෙන් ඇසුවා.

"පුළුවන්...!" ජූලියන් සිතියම බලා කිව්වා. මේ දොළ පාර හරහා යන පාරක් තව ටිකක් දුරින් තියෙනවා. අපි එතෙන්ට යනකල් දොළ පාර දිගේ යමු."

ළමුන් දොළ පාර දිගේ ටික දුරක් ඉදිරියට ගමන් කළා.

"ඩික්, දැන්වත් ඔයාගේ කතාවේ ඉතුරු ටික අපිට කියන්න." ජූලියන් අතරමග දී කිව්වා. "ඊයේ රෑ අමුතු දෙයක සිද්ධ වුණා කිව්වා නේද? ඒ මොකද්ද?"

"හරි..!" ඩික් කිව්වා. "මම කතාව කියන්නම්. ඔන්න එහෙනම් අහගෙන ඉන්න කෝ...!"

# ඩික් ගේ පුදුම කතාව..... 09

ඩික් ඔහුගේ කතාව කියන්නට පටන් ගත්තා. ඇවිදින ගමන් එය අසා ගන්නට අපහසු නිසා ළමුන් දොළ පාර අසල තිබූ පඳුරක සෙවණ යට වාඩි වුණා.

"වයසක නෝනා එයාගේ පුතාට හරිම බයයි. ඒ නිසා එයා ගෙදර නවාතැන් දුන්නේ ඈන්ට විතරයි." ඩික් කිව්වා. "ඉතින් මම එළියේ පිදුරු මඩුවේ නිදා ගත්තා. මහ රෑ 'ඩික්... ඩික්....' කියලා කවුදෝ කෙනෙක් මට කතා කළාම මම හොඳටම පුදුම වුණා...!"

"ඒක හීනයක් වෙන්න ඇති." ඈන් කිව්වා. "ඔයාගේ නම දන්න කෙනෙක් මේ පළාතේ ඉන්න විදිහක් නෑ නේ."

"මමත් මුලින් හිතුවේ මම දකින්නේ හීනයක් වෙන්න ඇති කියලා තමයි." ඩික් කිව්වා. "ඒත් ඒ මනුස්සයා මඩුව ළඟට ඇවිත් 'ඩික්, මම දන්නවා ඔයා මේ මඩුවේ ඉන්නවා කියලා. ඔයා මඩුවට රිංගනවා මම බලාගෙනයි හිටියේ.' කියලා කිව්වා. පණිවිඩයක් කියන්න තියෙනවා කියලා මට එළියට කතා කළා."

"ඉතින්...!" ජූලියන් පුදුමයෙන් කිව්වා. "ඔයා මඩුවේ රෑ ගත කරන බව දැනගෙන හිටියේ ඈන් විතරයි නේ."

"මම මඩුව කෙළවරට ගිහින් කළුවරේ ඉඳන්ම 'මම මෙතේ'





කියලා කිව්වා. එළියේ හිටපු කෙනාට මාව හරියට පෙනුණේ නෑ." ඩික් කිව්වා.

"ඉතින්...! ඊට පස්සේ මොකද වුණේ..?" ජෝර්ජ් කුතුහලයෙන් ඇසුවා.

"ඒ මනුස්සයා මට පණිවිඩයක් කියලා දෙයක් කිව්වා. හැබැයි ඒක කිසිම තේරුමක් නැති වචන ටිකක් විතරයි." ඩික් කල්පනා කරමින් කිව්වා. "මට ඒක හොඳට මතකයි. මෙන්න මේකයි ඒ පණිවිඩය. 'මහ ගස් දෙක - කළුදිය විල - දඟකාර ජේන් - මැගී දන්නවා' එච්චරයි. ඔයා මොකද ඒ ගැන හිතන්නේ ජූලියන්...?"

"ඇත්තටම ඒක හීනයක් වෙන්න ඇති." ජූලියන් කිව්වා.

"පොඩ්ඩක් ඉන්න...!" ඩික් කිව්වා. "ඒ මනුස්සයා මට පුංචි කඩදාසි කෑල්ලකුත් දුන්නා...!"

ඔහු සාක්කුවට අත දමමින් යමක් සෙව්වා.

"ඔහ්...! ඉක්මනට බලන්න ඒක ළඟ තියෙනවද කියලා...! එහෙම නම් ඔයා දැකලා තියෙන්නේ හීනයක් නෙමෙයි." ජූලියන් කලබලයෙන් කිව්වා.

ඩික් පොඩි වී ගිය කිළුටු කඩදාසි කැබැල්ලක් ඔහුගේ සාක්කුවෙන් එළියට ගත්තා. ඉන්පසුව එය අනෙක් ළමුන්ට පෙන්වා පුංචි සිනහවක් පෑවා...!

"ඒ කඩදාසියද ඔය....?" ජූලියන් පුදුමයෙන් ඇසුවා. "එහෙනම් ඒක හීනයක් නෙමෙයි ඩික්...!"

ජූලියන් ඩික් අත තිබූ කඩදාසි කැබැල්ල අතට ගත්තා. අනෙක් ළමුනුත් ඒ වටා වට වුණා. ඔවුන් සියලු දෙනාම කඩදාසි කැබැල්ලේ තිබෙන්නේ මොනවා දැ යි කියා කුතුහලයෙන් එබී බැලුවා. ඒ දැක ටිමීත් ඊට එබී බලන්නට උත්සාහ කළා

"මේ කඩදාසියේ තියෙන දේවල් හරියටම පැහැදිලිව තේරුම්

ගන්න අමාරුයි." ජූලියන් කිව්වා. "මේක මොකක් හරි තැනක සිතියමක් වගේ පේන්නේ. ඒත් හරියටම මොකක්ද කියලා කියන්න බෑ."

"මට ඒක දුන්නු මනුස්සයා කිව්වා, මේ කඩදාසිය වගේ තව එකක් මැගීටත් දුන්නා කියලා." ඩික් කිව්වා.

"කවුද එතකොට මැගී කියන්නේ?" ජෝර්ජ් ඇසුවා. "මැගී මොනවද මේ ගැන දන්නේ...?"

"ඒක මටත් හරියටම තේරෙන්නෙ නෑ." ඩික් කිව්වා.

"ඉතින් කතාව එච්චරද?" ජූලියන් ඩික්ගෙන් ඇසුවා.

"නෑ....! තව තියෙනවා...!" ඩික් කිව්වා. "ඒ මනුස්සයා පිට වෙලා ගියාට පස්සේ මම පිදුරු මඩුවට වෙලා නිදා ගත්තා. ඒත් ටික වෙලාවකට පස්සේ ඒ ගෙදර අයිති වයසක නෝනාගේ පුතා මඩුවට ආවා. මම මඩුවේ ඉන්නවා කියලා එයා දැනගෙන හිටියේ නෑ."

"එයා කවුරු හරි එනකල් මඩුවට වෙලා බලාගෙන ඉන්න බව මට තේරුණා. මම සද්ද නැතුව එයා මඩුවෙන් යනකල්ම පිදුරු මිටි ගොඩක් උඩ වැතිරිලා කළුවරේ සද්ද නැතුව හිටියා. දන්නෙම නැතුව ටික වෙලාවකින් මට නින්ද ගිහින්. උදේ නැගිටලා බලනකොට මඩුවේ කවුරුවත් හිටියේ නැති හින්දා මම හිතුවා ඒකත් හීනයක් වෙන්න ඇති කියලා...."

ඈන් හදිසියේම කතා කරන්නට පටන් ගත්තා.

"ඩික්....! ජූලියන්....! මම දැන් දන්නවා මොකද වුණේ කියලා." ඈය කිව්වා. "කලින් ආපු මනුස්සයාට පණිවිඩේ දෙන්න ඕනෙ වෙලා තිබුණේ ඩික්ට නෙමෙයි. අර වයසක නෝනාගේ පුතාට. ඒත් ඒ මනුස්සයා වැරදීමකින් රැවටිලා ඩික්ට ඒක දීලා ගියා."

"ඒක ගන්න වයසක නෝනාගේ පුතා පිදුරු මඩුවට ආවේ ඊට පස්සේ. එයා බලාගෙන ඉඳලා ඉඳලා ආපහු යන්න ඇති. ඒ දෙන්නා පිදුරු මඩුවෙදි රෑට මුණ ගැහෙන්න කලින් සැලසුම් කරගෙන ඉන්න ඇති."





"වයසක නෝනාගේ පුතාගේ නමත් 'ඩික්' වෙන්න ඇති. ඒකයි අර මනුස්සයා 'ඩික්' කියලා කතා කළේ. අහම්බෙන් වගේ අපේ ඩික් එතන හිටියා. ඉතින් පණිවිඩය අපි අතට ආවා...! මම හරි නේද?"

ඈන් ඇගේ දිගු කතාව එක හුස්මට කියාගෙන ගොස් අවසන් කර අනෙක් ළමුන් දෙස බලා සිටියා.

"හරියට හරි ඈන්....!" ජූලියන් ඈන්ගේ පිටට තට්ටු කරමින් කිව්වා. "ඈන්, මටත් හිතෙන විදිහට නම් ඔයා කියපු දේ තමයි වෙලා ඇත්තේ...!"

"ඈන්, මේ අහන්න..." එතෙක් වෙලා කල්පනා කරමින් සිටි ඩික් හදිසියේම ඈන්ට කිව්වා.

"ඕකොන් ගමට එනකොට අපිට මග දී හම්බ වුණු පිරිමි ළමයා කිව්වා ඒ වයසක නෝනාගේ පුතාට එයාලා කියන්නේ 'කිළුටු ඩික්' කියලලු. ඔයාට මතකද ඈන්...?" ඩික් ඈන්ගෙන් ඇසුවා. "ඒ කියන්නේ එයාගේ නමත් ඩික් තමයි."

"එහෙනම් ඈන් හරි...!" ජූලියන් නැවතත් කිව්වා.

ඈන් ආඩම්බරයට පත් වුණා. ළමුන් ටික වේලාවක් නිහඬවම ඩික්ගේ කතාව ගැන කල්පනා කරමින් පසු වුණා.

"කිළුටු ඩික්ට පණිවිඩය අරන් ආවේ හිරෙන් පැනපු හිරකාරයා වෙන්න බැරිද?" ජෝර්ජ් කල්පනා කරමින් කිව්වා.

"වෙන්න පුළුවන්....!" ජූලියන් කිව්වා. "කිළුටු ඩික්ට පණිවිඩය අරගෙන ආවේ හිරෙන් පැනපු හිරකාරයා වෙන්න ඇති කියලා මටත් හිතෙනවා."

"ඩික්, පණිවිඩය එවපු කෙනා කවුද කියලා එයා කිව්වෙ නැද්ද...?" ජූලියන් ඩික්ගෙන් ඇසුවා.

"කිව්වා....! ටෙයිලර්ගෙන් පණිවිඩයක් තියෙනවා කියලා තමයි ඒ මනුස්සයා මට මේ පණිවිඩේ දුන්නේ." ඩික් කිව්වා.

"නෙයිලර්ගෙන් පණිවිඩයක්...!" ජූලියන් කිව්වා. "හරි...! මෙහෙම වෙන්න පුළුවන්. නෙයිලර් කියන්නේ හිරේ ඉන්න වෙනත් හිරකාරයෙක්. එයාගෙයි කිළුටු ඩික්ගෙයි කලින් ඉඳලම හිතවත්කමක් තියෙනවා. ඊයේ හිරෙන් පැනපු හිරකාරයා අපේ නෙයිලර් කිළුටු ඩික්ට පණිවිඩයක් එව්වා. මොකක්ද ඔයාලා හිතන්නේ?"

"සමහරවිට නෙයිලර් කිළුටු ඩික් දෙන්නා මේක කලින් සැලසුම් කරගෙන ඉන්න ඇති. හිරකාරයෙක් පැනලා බව මිනිස්සුන්ට දන්වන්න අනතුරු අඟවන සීනුව වදින කොට කිළුටු ඩික් දැන ගන්න ඇති ඒ හිරකාරයා අපේ නෙයිලර් එයාට පණිවිඩයක් එවනවා කියලා. ඉතින් කිළුටු ඩික් රෑ පිදුරු මඩුවට ඇවිත් ඒක ගන්න බලාගෙන ඉන්න ඇති. හිරකාරයා කිළුටු ඩික් එන්න කලින් එතෙන්ට ඇවිත් අපේ ඩික්ට පණිවිඩය දීලා ගියා...! එහෙමයි වෙන්න ඇත්තේ...!"

"හරි...! දැන් සේරම පැහැදිලියි." ඩික් කිව්වා. "මමත් හිතනවා ජූලියන්ගේ අදහස හරි ඇති කියලා. හොඳ වෙලාවට හිරෙන් පැනපු කෙනා දන්නෙ නෑ, එයා පණිවිඩය දුන්නේ හරි කෙනාට නෙමෙයි කියලා."

"මේ හැම දෙයක්ම වුණේ අපි දෙන්නා අතරමං වෙලා අහම්බෙන් ඩික්ට පිදුරු මඩුවක නිදා ගන්න සිද්ධ වුණු නිසා නේ." ඈන් කිව්වා.

"අපි මේ ගැන පොලිසියට කියමු." ජෝර්ජ් කිව්වා. "සමහරවිට හිරකාරයව ආපහු අල්ල ගන්න මේ පණිවිඩය පොලිසියට උදව්වක් වේවි."

"ඒක ඇත්ත...!" ජූලියන් කිව්වා. "අපි සිතියම බලලා ළඟම තියෙන පොලිස් මුරපොළ හොයා ගනිමු."

ළමුන් සිතියම පිරික්සා බලන්නට පටන් ගත්තා.

"හරි...! රිබ්ල්ස් ගමේ පොලිස් මුරපොළක් තියෙනවා." ජූලියන් සිතියමට ඇඟිල්ල දිගු කර පෙන්වමින් කිව්වා. "දවල් කෑම වෙලාව ළං වෙනකොට එතෙන්ට යා ගන්න පුළුවන් වේවි."

ළමුන් සතර දෙනා වාඩි වී සිටි තැනින් නැගිට ආපසු ගමන්





අරඹන්නට සූදානම් වුණා. මෙතෙක් වෙලා කම්මැලිකමින් බිම වැතිර සිටි ටිමී හරිම උනන්දුවෙන් ඔවුන්ට එකතු වුණා.

"දැන් නම් ටිමීගේ කකුල හොඳටම සනීපයි නේද?" ඈන් සතුටින් කිව්වා. "එයා ආයෙ නම් හා ගුල් වලට රිංගන්න යන එකක් නෑ. ඊයේ හොඳ පාඩමක් ඉගෙන ගත්ත නේ."

ඒත් ඈන් කියූ දෙය වැරදි බව වැඩි වේලාවක් ගත වෙන්නට කලින්ම ළමුන්ට පෙනුණා...! අතරමග දී තැනින් තැන තිබූ හා ගුල් හාරා අවුස්සන්නටත්, ඒවාට ඔළුව දමා බලන්නටත් ටිමී අමතක කළේ නෑ...!

ළමුන් දිය පහර දිගේ ටික දුරක් ඉදිරියට ගමන් කර පටු මාවතකට ළඟා වුණා. එතැන් සිට ඔවුන් ඒ මාවත දිගේ රිබ්ල්ස් ගම දෙසට ගමන් කරන්නට පටන් ගත්තා. දහවල් වන විට ඔවුන්ට එහි ළඟා වෙන්නට හැකි වුණා.

"අපි ඉස්සර වෙලාම පොලිස් මුරපොළට ගිහින් බලමු." ජූලියන් කිව්වා. "දවල් කෑම ගැන ඊට පස්සේ බලමු."

# අපූරු පොලිස් නිලධාරියෙක්..... 10

රිබිල්ස් ගමේ කුඩා පොලිස් මුරපොළක් තිබුණා. එහි සිටියේ එකම එක පොලිස් නිලධාරියෙක් පමණයි. ඒ නිසාම ඔහු එහි රාජකාරිය කළේ තරමක් ආඩම්බරයෙන්...!

ළමුන් රිබිල්ස් මුරපොළට ළඟා වන විට ඒ පොලිස් නිලධාරියා සිටියේ දිවා ආහාරය ගනිමින්. ළමුන් පොලිස් මුරපොළට ඇතුළු වෙනවා දැක, ඔහු කෑම පිඟාන මේසය මතම තිබෙන්නට හැර, කට පිස දමමින් මුරපොළෙන් පිටතට ආවා.

නිදහසේ කෑම කන්නට ඉඩ නොදී ළමුන් පිරිසක් එවේලේ මුරපොළට පැමිණීම ගැන ඔහුට තරමක් කේන්ති ගොස් තිබුණා.

"මොකක්ද උවමනාව...?" ඔහු නොරිස්සුම් සහගතව ළමුන් දෙස බලමින් ඇසුවා.

ඔහු ළමුන්ට වැඩි කැමැත්තක් දැක්වූ අයෙක් නෙවෙයි. ගම්බද ළමුන්ගේ අවිනීත හැසිරීම් නිතර දැක පුරුදු නිසා ඔහු සැලකුවේ ළමුන් කරදරකාරයින් පිරිසක් ලෙසටයි.

ජූලියන් පොලිස් නිලධාරියාට ආචාරශීලී අන්දමින් කතා කළා.

"අපි ආවේ ඊයේ හිරෙන් පැනපු හිරකාරයා ගැන තොරතුරක්





දන්වන්න." ජූලියන් කිව්වා. "අපි දන්න දේවල් පොලිසියට කිව්වොත් ඒක හිරකාරයව අල්ල ගන්න පහසුවක් වේවි කියලා අපිට හිතෙනවා."

"පුහ්...! ඔය ළමයිනුත් ඒ හිරකාරයව දැක්කද?" පොලිස් නිලධාරියා සරදම් හඬින් ඇසුවා. "මේ පළාතේ ඒ හිරකාරයව නොදැක්ක කෙනෙක් නෑ... හහ්...! පොලිසියට ලැබුණු ආරංචිවල හැටියට මේ පළාතේ හැම කන්දක්, ගහක්, මුලක් ගානෙම ඒ හිරකාරයා ඉඳලා තියෙනවා...! එකම වෙලාවක ඒ හැමතැනකම පේන්න ඉන්න නම් ඒ හිරකාරයට අරුම පුදුම හැකියාවක් තියෙන්න ඕනේ...!"

"මේ මගේ සහෝදරයාට ඊයේ රෑ ඒ හිරකාරයව හම්බ වෙලා තියෙනවා." ජූලියන් කිව්වා. "ඒ මනුස්සයා මගේ සහෝදරයාට පණිවිඩයකුත් දීලා තියෙනවා."

"හහ්...! හහ්...! ඇත්තට...?" පොලිස් නිලධාරියා සරදම් සිනාවක් පාමින් කිව්වා. "ඒ කියන්නේ මේ හිරකාරයා පැනලා යන ගමන් ඉස්කෝලේ යන වයසේ පුංචි ළමයින්ට පණිවිඩත් දීගෙන ගිහින් තියෙනවා එහෙනම්? මම අහන්නේ මොකක්ද හැබෑටම ඔය දුන්නයි කියන පණිවිඩේ....?"

"ඒක බැලූ බැල්මට නම් කිසිම තේරුමක් නැති පණිවිඩයක්." ඩික් කිව්වා. "මේකයි, 'මහ ගස් දෙක - කළුදිය වීල - දඟකාර ජේන් - මැගී දන්නවා'"

"ආ... ඇත්තට..!" පොලිස් නිලධාරියා සරදමට මෙන් කිව්වා. "එහෙනම් මැගීට මෙහාට එන්න කියන්න කෝ. මටත් ආසයි එයාව හම්බවෙන්න."

"අපි මැගී කියන කෙනාව දන්නෙ නෑ." ඩික් කිව්වා. "අපි හිතුවා මේකේ තේරුම පොලිසිය හොයා ගනියි කියලා. ඒකයි මෙහාට ආවේ. ඒ හිරකාරයා මට මේ කඩදාසි කෑල්ලත් දීලා ගියා."

ඩික් ඔහුගේ කලිසම් සාක්කුවේ තිබූ පොඩි වී ගිය කිළුටු කඩදාසි කැබැල්ල පොලිස් නිලධාරියාගේ අතට දුන්නා. ඔහු කඩදාසි කැබැල්ල අතට ගත්තේ උපහාසයෙන් සිනාසෙමින්.

"දැන් ඔය ළමයි මේ කඩදාසි කෑල්ල දීලා මට මොනවද කරන්න කියන්නේ..?" ඔහු ඇසුවා.

"අපිට තේරෙන්නෙ නෑ." ඩික් කිව්වා. "අපි හිතනවා ඒකෙන් හිරකාරයව අල්ල ගන්න පුළුවන් විදිහේ හෝඩුවාවක් පොලිසියට ලැබෙයි කියලා."

"හහ්....! හහ්....! හිරකාරයා අල්ලගෙන ඉවරයි." පොලිස් නිලධාරියා නැවතත් සරදම් සිනහවක් නගමින් කිව්වා. "දැනට පැය කීපයකට කලින් හිරකාරයා පොලිසියට අහු වුණා. දැන් එයා අපුරුවට හිර ගෙදර ඇති...!"

"ඒත් මේ කඩදාසි කෑල්ලෙත් මොකක් හරි රහසක් ඇති...!" ඩික් කිව්වා.

"මම එකක් කියන්නම්, මට ඔය ළමයින්ගේ විහිළු කතා අහගෙන ඉන්න වෙලාවක් නෑ." ඔහු එකවරම සිනහව නවත්වා තරහින් කිව්වා.

"මේක විහිළුවක් නෙමෙයි." ජූලියන් කිව්වා.

පොලිස් නිලධාරියා තරහින් ඔහු දෙස රවා බැලුවා.

"යනවල යන්න මෙතනින්...!" පොලිස් නිලධාරියා ළමුන්ට රළු ලෙස කිව්වා. "මාව රවට්ටන්න හිතාගෙන තවත් බොරු කතා කිව්වොත් මම ඔය ළමයින්ගේ නම් ගම් සේරම පොලිස් පොතේ ලියා ගන්නවා."

"කැමති නම් ලියා ගන්න." ජූලියන් පොලිස් නිලධාරියාට කිව්වා. "අපි අපේ නම් ගම් සේරම දෙන්නම්. ආපහු යන ගමන් මම දිස්ත්‍රික් පොලිස් කාර්යාලයට මේ ගැන පැමිණිලි කරනවා."

ජූලියන්ගේ කතාවෙන් පසුව පොලිස් නිලධාරියාගේ සැර තරමක් අඩු වී ගියා. ඔහු පෙරට වඩා ආචාරශීලී විදිහට ළමුන්ට කතා කරන්නට පටන් ගත්තා. පිරිසරබද පළාතේ වෙසෙන අනෙක් ළමුන්ට වඩා මේ ළමුන් පිරිස යමක්කමක් දන්නා බව ඔහුට වැටහී තිබුණා.

"දැන් ඔය ළමයි සේරම මෙතනින් ගියොත් හොඳයි." පොලිස්





නිලධාරියා කිව්වා. "ආපහු ඔය වගේ තේරුමක් නැති කතන්දර කියන්න මෙහාට එන්න එපා."

"ආයෙ නම් මෙහාට එන්න කොහොමටවත් අපේ අදහසක් නෑ." ජූලියන් කිව්වා. "අපි කියපු දේවල් විශ්වාස කරන්නෙ නැත්නම් ඔය කඩදාසි කෑල්ල ආපහු අපිටම දෙන්න."

පොලිස් නිලධාරියා ජූලියන් දෙස රවා බැලුවා. ඉන්පසුව කඩදාසි කැබැල්ල හතරට ඉරා විසි කර දැම්මා...!

ඩික් වහා ඉදිරියට පැන ඉරා දැමූ කඩදාසි කැබලි හතර අහුලා ගත්තා. පොලිස් නිලධාරියා ආපසු මුරපොළ ඇතුළට ගොස් ඔහුගේ කෑම පංගුවේ ඉතිරි කොටස රස බලන්නට පටන් ගත්තා.

"මේ ගමේ නීතිය ආරක්ෂා කරන්න ඉන්නේ අපුරු පොලිස් නිලධාරියෙක් තමයි." ඩික් තරහින් කිව්වා.

ඔහු ඉරුණු කඩදාසි කැබලි කිහිපය සාක්කුවේ දමා ගත්තා.

"යමු යන්න..." ජූලියන් කිව්වා.

ළමුන් පොලිස් මුරපොළෙන් පිට වී ගියේ එහි සිටි පොලිස් නිලධාරියාගේ හැසිරීම ගැන හොඳටම කලකිරීමෙන්.

"ඇයි එයා අපි කියපු දේවල් සේරම බොරු කතන්දර කියලා හිතුවේ...?" ජෝර්ජ් තරහින් ඇසුවා. "පුදුම පොලිස් නිලධාරියෙක් තමයි."

"අපේ කතාව එකපාරටම කෙනෙකුට විශ්වාස කරන්න පුළුවන් තරම් සාමාන්‍ය එකක් නෙමෙයි." ජූලියන් කිව්වා. "බැලූ බැල්මට ඒක තේරුමක් නැති ගොතපු කතාවක් වගේ පේනවා. ඩික් ඒ ගැන අපිට කියද්දිත් අපි මුලින්ම ඒක විශ්වාස කළේ නෑ නේ. අපිත් ඩික්ගේ කතාව පිළිගත්තේ කඩදාසි කෑල්ල දැක්කට පස්සෙ නේ."

"මම දොස් කියන්නේ එයා අපේ කතාව පිළිගත්තේ නැති එක ගැන නෙමෙයි. එයා අපිට කතා කරපු විදිහයි, හැසිරුණු විදිහයි

ගැන. හැම පොලිසියකම මේ වගේ පොලිස් නිලධාරීයෝ හිටියොත් කිසිම කෙනෙක් පැමිණිල්ලක් කරන්න පොලිසියකට යන එකක් නෑ."

ජුලියන් දිගටම කතා කරමින් ගමන් කළා.

"කොහොම වුණත් අපිට එයාගෙන් සුබ ආරංචියකුත් ලැබුණා." ඈන් සැහැසුම් සුසුමක් හෙළමින් කිව්වා. "ඒ තමයි පැනලා ගිය හිරකාරයා ආපහු අල්ලා ගත්තා කියන එක... දැන් අපිට බය නැතුව මේ පළාතේ ඇවිදින්න පුළුවන්."

"ඒක ඇත්ත." ඩික් කිව්වා. "ජුලියන්, අපි මේ ගැන මොකද දැන් කරන්නේ....?"

"මට තේරෙන්නෙ නෑ..." ජුලියන් කිව්වා. "අපි දවල්ට කෑම කලා ඊට පස්සේ ඒ ගැන ආපහු කල්පනා කරලා බලමු. මේ ගමේ ගොවිපළවල් කීපයක්ම තියෙනවා. අපිට ඒ එකකින් සල්ලි දීලා කෑම ගන්න පුළුවන් වෙයි."

ළමුන් අතරමග දී හමු වුණු පුංචි ගැහැනු ළමයෙකුගෙන් ඒ ගැන ඇසුවා.

"අර කන්ද උඩ පේන ගොවිපළේ ඉන්නේ මගේ ආච්චි." ඇය කිව්වා. "එයා අමුත්තන්ට කෑම හදලා දෙනවා. ගිහින් එයාගෙන් අහන්න. හදල දේවි."

"ස්තූතියි...!" ජුලියන් කිව්වා.

ළමුන් පුංචි ගැහැනු ළමයා පෙන්වූ ගොවි ගෙදර දෙසට ගමන් කළා. ඔවුන් ගොවි ගෙදර ගේට්ටුව අසලට ළඟා වනවාත් එක්කම බල්ලන් දෙදෙනෙක් ටිමී දැක බුරන්නට පටන් ගත්තා. ටිමීත් ගොරවන්නට පටන් ගත්තා.

"ටිමී...! ඒ යාළුවෝ...! යාළුවෝ....! අපි එහාට යන්නේ කෑම කන්න. කෑම...! කෑම...!" ජෝර්ජ් ටිමීගේ කරපටියෙන් අල්ලා ගනිමින් කිව්වා. "ටිමීටත් මස් කටුවක් අරන් දෙනවා."





ටිමී වහාම ගෙරවීම නවතා බල්ලන් දෙදෙනාට වලිගය වනන්නට පටන් ගත්තා...!

ගෙවත්තේ ගස් වලට සාත්තු කරමින් සිටි තරුණ මිනිසෙක් ළමුන්ව දැක සිනා සී කතා කළා.

"ආ.... මොකක්ද උවමනාව ළමයිනේ...?" ඔහු ඇසුවා. "බල්ලෝ බිරුවට ගණන් ගන්න එපා."

"අපි ආවේ දවල් කෑම ගන්න පුළුවන්ද කියලා බලන්න." ජුලියන් කිව්වා. "මග දී හම්බ වුණ පුංචි ගෑනු ළමයෙක් තමයි අපිට කිව්වේ මෙහාට එන්න කියලා."

"ආ... මම අම්මගෙන් අහන්නම්." මිනිසා කිව්වා. ඔහු මහා හඬින් කෑ ගසා මවට කතා කළා.

"අම්මේ....! අම්මේ....! ළමයි හතර දෙනෙකුට කෑම වේලක් ලෑස්ති කරන්න පුළුවන්ද?" ඔහු ඇසුවා.

ඉතාමත් මහත වයසක කාන්තාවක් ගොවි ගෙදර මුළුතැන්ගෙයි දොරෙන් පිටතට එබී බැලුවා.

"ආ....! ඇතුළට එන්න කියන්න." ඇය කිව්වා. "කෝකටත් ඔය බල්ලව අල්ල ගත්තොත් හොඳයි නේද?"

ළමුන් ගොවි ගෙදරට ඇතුළු වුණා. ජෝර්ජ් ටිමීගේ කරපටියෙන් අල්ලාගෙන සිටියා. ඒත් ටිමී ගෙරවුයේ නෑ. වලිගය වනමින් සිටියා. ටික වේලාවකින් ගොවි ගෙදර බල්ලන් දෙදෙනාත් බිරීම නවතා වලිගය වනන්නට පටන් ගත්තා.

මහත වයසක කාන්තාව කඩිසර ලෙස ඒ මේ අත ඇවිදිමින් ළමුන්ට කෑම පිළියෙළ කළා.

"අද පුඩින් නම් නෑ." ඇය කිව්වා. "ඒ වෙනුවට කෑම කාලා ඉවර වුණාට පස්සේ මම ගෙදර හදපු රසකැවිලි වගයක් දෙන්නම්."

"ආ.... ඒකට කමක් නෑ." ඩික් කිව්වා. "තියෙන කෑමවල සුවඳ දැනුනම විතරක් බඩ පිරෙනවා...!"

ළමුන්ට රසවත් කෑම වේලක් ලැබුණා. ඔවුන් මස් බැදුම් දීසිය සම්පූර්ණයෙන්ම අවසන් කළා...! ඉන්පසුව එළවළු සලාදයකටත් ඒ ඉරණමම අත් වුණා...!

ටිමීත් රසවත් මස් පිඟානක රස බැලුවා.

"ගමේ ගොවි ගෙවල්වල කෑම නගරේ කෑමවලට වඩා රස ඇයි දන්නෙ නෑ." ජෝර්ජ් කිව්වා.

"එක්කෝ නගරේ අය කෑම උයන්න දන්නෙ නැතුව ඇති. නැත්නම් රසට උයන්න ඕනෙ කමක් නැතුව ඇති." ඈන් කිව්වා.

ඒ අතර ගොවි ගෙදරට එන්නට ළමුන්ට මග කියූ පුංචි ගෑනු ළමයා ඔවුන් සිටි තැනට ආවා.

"මම මෙග්...! මම ඉන්නේ ආච්චිත් එක්ක." ඇය සිනාසෙමින් කිව්වා. "ඔයාලා කවුද...?"

ජූලියන් ඇයට අනෙක් ළමුන් එකිනෙකාව හඳුන්වා දුන්නා. මේ අතර ජූලියන්ට අපූරු අදහසක් ආවා...!

"මෙග්, අපි මේ පළාතේ ඇවිදින්න ආවා." ජූලියන් කිව්වා. "මෙහේ හරිම ලස්සන තැන් තියෙනව නේ. ඒත් අපිට තවම යන්න බැරි වුණ තැනක් තියෙනවා. 'මහ ගස් දෙකක්' තියෙන තැනක් ගැන ඔයා දන්නවද?"

"මම නම් දන්නෙ නෑ. සමහරවිට ආච්චි දන්නවා ඇති..." මෙග් කල්පනා කරමින් කිව්වා.

"ආච්චී...! ඔයා දන්නවද මහ ගස් දෙකක් තියෙන තැනක් ගැන...?" ඇය කෑ ගසා ඇසුවා.

වයසක කාන්තාව ළමුන් කෑම කමින් සිටි තැනට ආවා. ඇය ටික





වේලාවක් කල්පනා කළා. ඉන්පසුව ළමුන් දෙසට හැරුණා.

"මී... මී... මහ ගස් දෙකක් තියෙන තැනක්... ආ...! ඔව්. එහෙම තැනක් තියෙනවා. හරිම ලස්සන තැනක්. එතන ගොවිපළකුත් තිබුණා. ගොවි ගෙදර නම් දැන් නටබුන් වෙලා...." ඇය කිව්වා.

ළමුන් උනන්දුවෙන් ඇගේ කතාව අසා සිටියා.

"ඒක තියෙන්නේ මේ කන්දෙන් එහා පැත්තේ තියෙන විලක් ළඟ... ඒ විලට කියන නම මට මතක නෑ..." ඇය කිව්වා.

"කළුදිය විල...!" ඩික් එකවරම කිව්වා.

"අන්න හරි...! කළුදිය විල තමයි." වයසක කාන්තාව කිව්වා. "ඔය ළමයි එතෙන්ට යනව නම් පරිස්සමින් යන්න. ඒ පාර දෙපැත්තෙම වගුරු බිම් තියෙනවා. ඒ වගුරු වල සමහර තැන් එරෙනවා. කල්පනාවෙන් යන්න ඕනේ."

"ආ.... බොහොම ස්තූතියි...!" ජූලියන් කිව්වා. "කෑමත් හරිම රසයි. ඒකටත් ස්තූතියි...!"

ළමුන් කෑම වලට මුදල් ගෙවා ඉක්මනින්ම ගොවි ගෙදරින් සමුගත්තේ ඔවුන්ට ලැබුණු අලුත් තොරතුරු ගැන සතුටින් කල්පනා කරමින්.

# ජූලියන්ගෙන් අපූරු අදහසක්..... 11

ගොවි ගෙදරින් පිට වූ වහාම ජූලියන් අනෙක් ළමුන් දෙස බැලුවා.

"අපි එතෙන්ට ගිහින් බලමු." ඔහු කිව්වා.

හැමෝම ඒ අදහසට එක පයින්ම කැමති වුණා...!

"අපි කොහොමද එතන හරියටම හොයා ගන්නේ....?" ඩික් ඇසුවා. "සිතියමේ සලකුණු කරලා තියෙනවද දන්නෙ නෑ."

"කළුදිය විල ලොකු විලක් නම් සිතියමේ සලකුණු කරලා තියෙන්න ඕනේ." ජූලියන් කිව්වා.

"ළමුන් ගොවි ගෙදර පසු කර ටික දුරක් ඉදිරියට ඇවිද ගොස්, මාවත අද්දර පිහිටි ගසක් යට සෙවණේ බිම වාඩි වුණා. ජූලියන් සිතියම බිම තබා දිග හැරියා. ළමුන් සියලුදෙනාම ඒ වටා එකතු වුණා.

ළමුන් සිතියමේ සෑම අඟලක් පාසාම හොඳින් පිරික්සා බලන්නට පටන් ගත්තා. ජෝර්ජ් එකවරම සතුටින් කෑ ගැසුවා.

"මෙන්න....! කළුදිය විල තියෙනවා...!" ජෝර්ජ් කිව්වා. "මහ ගස් දෙකත් සලකුණු කරලා තියෙනවද දන්නෙ නෑ."

"මම හිතන්නේ නෑ." ජූලියන් කිව්වා. "ලොකු ලොකු විල්, ගංගා,





පාලම්, කරත්ත පාරවල්, වැදගත් ගොඩනැගිලි වගේ දේවල් හැරුණාම පොඩි පොඩි තැන් ගැන විස්තර මේ වගේ සිතියම්වල සලකුණු කරන්නේ නෑ."

"කොහොම හරි කමක් නෑ. සිතියමේ කළුදිය විල තියෙනව නේ. අද හවසට අපිට එතෙන්ට ගිහින් බලන්න පුළුවන් නම් හොඳයි." ඩික් කිව්වා. "මෙතන ඉඳන් කළුදිය විලට කොච්චර දුර තියෙනවද කියලා හරියටම දැනගන්න ඕනේ."

"අපි මේ ගමේ තියෙන තැපැල් කන්තෝරුවෙන් අහලා බලමු." ජෝර්ජ් කිව්වා. "ඉස්සර කළුදිය විල ළඟ ගොවිපළක් තිබුණාලු නේ. ඒ කාලේ එහාට ලියුම් ගෙනියන්න ඇති නේ. අපිට තැපැල් කන්තෝරුවෙන් එතෙන්ට යන පාර හරියටම අහගන්නත් පුළුවන් වෙයි."

ළමුන් රිබිල්ස් ගමේ තැපැල් කන්තෝරුව වෙත ළඟා වුණා. එහි සිටි වයසක තැපැල්කරු නළල රැලි කරමින් පැළඳ සිටි රවුම් කණ්ණාඩි කුට්ටම යටින් ළමුන් දෙස බැලුවා. ළමුන් ඔහුගෙන් කළුදිය විල අද්දර තිබූ පැරණි ගොවිපළ ගැන විස්තර ඇසුවා.

"ආ....! ඒ ගොවිපළ කාලෙකට ඉස්සර ගිනි අරගෙන විනාශ වුණා නේ...!" වයසක තැපැල්කරු කිව්වා. "අයිතිකාරයා ගෙදර හිටියෙ නැති දවසක ඒ ගොවි ගෙදර හදිසියේම ගිනි ගත්තා. ඒක වුණේ කොහොමද කියන්න කවුරුවත් දැනගෙන හිටියේ නෑ. මේ පාළු පළාතට ගිනි නිවන හමුදාව ගෙන්න ගන්නත් බෑ නේ. විල ළඟට යන්න තිබුණේ පුංචි කරත්ත පාරක් විතරයි. කොහොම හරි මිනිස්සු ගිහින් ගින්න නිවන්න ලෑස්ති වෙනකොට ඒ ගින්නෙන් ගොවි ගෙදර සම්පූර්ණයෙන්ම අළු වෙලා ගිහින් ඉවරයි."

"ඉතින් ඊට පස්සේ ආපහු ඒ ගෙදර අලුත්වැඩියා කරලා ගොවිපළ පටන් ගත්තේ නැද්ද?" ජූලියන් ඇසුවා.

"නෑ...!" වයසක තැපැල්කරු කිව්වා. "ඒක වැඩක් නෑ. පාඩුයි. ඒ ගොවිපළ ආපහු මුල ඉඳලම ගොඩ ගන්න නම් සෑහෙන්න මහන්සි වෙන්න වෙනවා. ඉතින් අයිතිකාරයා ගොවිපළ දාලා මෙහෙන් යන්න ගියා. දැන් ඒ ගෙදර වටේටම කැලෑ වැහිලා. කඩා වැටුණු බිත්ති උඩ ලිහිණියෝ කූඩු හදලා. ඒ පැත්තේ දැන් ඉන්නේ කැලෑ සත්තු විතරයි.

ඒ පැත්ත හරිම මුසල පළාතක්...! පරිසරයත් හරිම අඳුරුයි...! විලේ වතුරත් අඳුරුයි...! කළු පාටයි...! නමටම ගැළපෙනවා...!"

"අපිට එතෙන්ට යන්න හරියටම පාර කියන්න පුළුවන්ද? අනිත් එක මෙහේ ඉඳන් කොච්චර දුරද කියලා කියන්නත් පුළුවන්ද?" ජූලියන් ඇසුවා.

"ඔය ළමයි ඒ වගේ කැලෑ වැහුණු පළාතකට යන්නේ ඇයි...?" වයසක තැපැල්කරු ඇසුවා. "ඒ විලේ නාන්නද? ඒ වැඩේ නම් කරන්න එපා. වතුර හරිම සීතලයි."

"අපි නිකමට හිතුවා විලේ කළුපාට වතුර බලන්න." ජූලියන් කිව්වා. "ඒ නමත් හරි අමුතුයි නේ....!"

වයසක තැපැල්කරු ජූලියන්ගෙන් සිතියම ඉල්ලාගෙන කළුදිය විලට යන පාර එහි නිල් පෑනෙන් ලකුණු කළා. ඒ අවට තැන් කිහිපයකම රතු පෑනෙන් කතිර ලකුණු සටහන් කළා.

"මේ කතිර පේනව නේද..?" වයසක තැපැල්කරු ඇසුවා. "ඒ තැන්වල තියෙන්නේ වගුරු බිම්...! ඔය ළමයි හරියටම මම සලකුණු කරපු පාර දිගේ යන්න. බැරි වෙලා හරි වගුරු බිමේ එරෙන තැනකට අඩිය තිබ්බොත් ඉන ළඟටම එරේවි....!"

"ස්තුතියි...! අපි පරිස්සමින් යන්නම්." ජූලියන් සිතියම හකුලා ගනිමින් කිව්වා. "අපිට එතෙන්ට යන්න කොච්චර වෙලාවක් ගත වෙයිද?"

"පැය දෙකකට වඩා යාවි....!" වයසක තැපැල්කරු කිව්වා. "ඔය ළමයි අද හවස එහේ යන්න එපා. ආපහු එනකොට කළුවර වැටේවි."

"හරි...!" ජූලියන් කිව්වා. "අද කාලගුණයත් හොඳ නිසා අපි කල්පනා කළේ එළිමහනේ රැයක් ගත කරන්න. ඒත් නිදා ගන්න ඕනෙ කරන දේවල් කිසිම දෙයක් අපි අරන් ආවේ නෑ. බිමට එළන රබර් ඇතිරිලි දෙකකුයි, පොරෝනා දෙකකුයි කුලියට ගන්න පුළුවන් තැනක් කොහෙද තියෙන්නේ...?"

අනෙක් ළමුන් පුදුමයෙන් ජූලියන් දෙස බැලුවා.





'එළිමහනේ රෑ ගත කරන්න...? ඒ කොහෙද...? මොකටද...? ජූලියන් එකපාරටම එහෙම තීරණයක් ගත්තෙ ඇයි?' අනෙක් ළමුන් පුදුමයෙන් කල්පනා කළා.

ජූලියන් ඔවුන් දෙස බලා සිනාසුණා. කුමක් හෝ අපූරු අදහසක් ඔහුට පහළ වී ඇති බව අනෙක් ළමුන්ට තේරුණා...!

ඔවුන්ට එළිමහනේ රැයක් ගත කරන්නට ඕනෑ කරන දේවල් සියල්ලම සපයා දෙන්නට වයසක තැපැල්කරු කැමති වුණා. ඔහු ගෙනැවිත් දුන් බිමට එළන රබර් ඇතිරිලි දෙකත්, ඝනකම් පොරෝනා දෙකත් වෙන් වෙන්ව නවා, ලණු වලින් ගැට ගසා, ගෙන යන්නට පහසු ලෙස සකස් කර ගන්නට ළමුන්ට සිදු වුණා.

ළමුන් ඒවාත් ඔසවාගෙන තැපැල්කරුගෙන් සමු අරන් මගට බැස්සා. ටික දුරක් ඉදිරියට ගිය පසු ඩික් කතා කළා.

"ජූලියන්....!" ඩික් කිව්වා. "ඇත්තමට මේ මොනවද කරන්න හදන්නේ...?"

"මට එක පාරටම අපූරු අදහසක් ආවා." ජූලියන් කිව්වා. "අපි කළුදිය විල ළඟ නැවතිලා ඒ පළාතේ මොනවා හරි විශේෂ දෙයක් තියෙනවද කියලා හොයලා බලමු."

"ඒක නම් හොඳ අදහස...!" ජෝර්ජ් කිව්වා. "එතකොට ඔයා කියන්නේ ඇවිදින එක නතර කරලා ඉතුරු දවස් දෙකත් කළුදිය විල ළඟම ඉඳිමු කියලද?"

"හ්ම්.... අපිට එහෙදි විශේෂ දෙයක් පේන්න තිබුණේ නැත්නම් අපි ආපහු හෙටම එහෙන් පිටත් වෙලා යමු." ජූලියන් කිව්වා. "කළුදිය විල ළඟට ගියාට පස්සේ ඉතුරු දවස් දෙකත් එතන ඉන්න ඕනේ කියලා හිතුණොත් දිගටම ඉඳිමු. අද හවසම එතෙන්ට ගිහින් රෑ නැවතිලා හිටියොත් අපිට හෙට උදේ ඉඳන් දවසෙම ඒ හරියේ ඇවිදලා බලන්න වෙලාව ඉතුරු වෙනව නේ."

"සමහරවිට අපිට මැගීත් හම්බවෙන්න පුළුවන්...!" ඈන් සිනාසෙමින් කිව්වා.

"ඔව්...! සමහරවිට...!" ජුලියන් කිව්වා. "මැහී කියන කෙනා මොකක් හරි රහසක් දන්නවා නම් පණිවිඩේ හැටියට එයත් කළුදිය විල ළඟට එන්න ඉඩ තියෙනවා."

"මටත් හරි ආසයි මැහී කොයි වගේ කෙනෙක්ද කියලා බලන්න."

ඩික් කිව්වා.

"දැන් අපි වැඩිපුර කෑම ජාති ටිකක් සල්ලි වලට අරගන්න ඕනේ." ජුලියන් කිව්වා. "ඊට පස්සේ මේ සේරම බඩු ටිකත් උස්සගෙන රෑ වෙන්න කලින් කළුදිය විල ළඟට යන්න ඕනේ. අර කැලෑ වැහිලා තියෙනවා කිව්ව ගොවි ගෙදර කඩා වැටුණු බිත්ති අතරේ තැනක් සුද්ද කරලා අපිට රෑට නිදා ගන්න තැනක් පිළියෙළ කර ගන්න පුළුවන් වෙයි."

ළමුන් ටිබ්ලිස් ගමේ වෙළඳ සැලෙන් පාන්, බටර් සහ ලොකු පළතුරු කේක් එකක් මිල දී ගත්තා. ඈන් බිස්කට් ටිකක් සහ චොකලට් කිහිපයකුත් අරගත්තා. අන්තිමේදී ලොකු දොඩම් බීම බෝතලයකුත් ඊට එකතු වුණා.

"මේ ඇති." ජුලියන් කිව්වා. "ඉස්සර ගොවිපළකුත් තිබුණ නිසා ඒ හරියේ ළිඳක් හරි දොළ පාරක් හරි ඇති. දැන් ඕනෙ කරන දේවල් සේරම හරි. අපි යමු."

ළමුන් සතරදෙනාත් ටිමීත් කළුදිය විල බලා ගමන් ඇරඹුවා. ඒත් ඔවුන්ට ගමන් කරන්නට සිදු වුණේ තරමක සෙමින්. හැමෝම ගමන් කළේ බරැති දේවල් ඔසවාගෙනයි. ඉතින් ඔවුන් වරින් වර මග නැවතී හිමින් හරිමින් ගමන් කළා.

ජුලියන්, ඩික් දෙදෙනා ඔවුන්ගේ පිටේ එල්ලාගෙන සිටි ගමන් මල්ලට අමතරව වයසක තැපැල්කරුගෙන් කුලියට ගත් නිදා ගන්නට ඕනෑ කරන බරැති ඇතිරිලි, පොරෝනා ආදියත් ඔසවාගෙන ගමන් කළා. ජෝර්ජ්, ඈන් දෙදෙනාත් ගමන් මලු පිටෙහි එල්ලාගෙන වෙළඳ සැලෙන් මිල දී ගත් කෑම බීම ජාති කූඩයකට දමාගෙන ගමන් කළා.

හිස් අතින්, සැහැල්ලුවෙන් ගමන් කළේ ටිමී විතරයි. ඉතින් ටිමී හරිම සතුටින් ඉදිරියට දිව ගියා.





තරමක් ඉදිරියට ගමන් කළ පසුව ඔවුන් විශාල ගස් වලින් වැසී ගිය වනගත පළාතකට ඇතුළු වී ඇති බව දැක ගන්නට හැකි වුණා. මග දෙපස තිබූ රූස්ස ගස් නිසා පරිසරය අඳුරු සහගත බවක් ඉසිලුවා. ඉදහිට මුවන් කිහිප දෙනෙක් ගස් අතරින් පෙනී නැවත සැඟවී ගියා.

ළමුන් ගමන් කළ කරත්ත පාර කලකට ඉහත දී අතහැර දමා තිබුණු නිසා සම්පූර්ණයෙන්ම පාහේ වල් බිහි වී ගොස් තිබුණා. සමහර තැන් වල දී පාරක් තිබූ බව සොයා ගන්නට බැරි තරමටම වනාන්තරයෙන් පාර වැසී ගොස් තිබුණා. ජුලියන් සිතියම පිරික්සා බලමින්, වයසක තැපැල්කරු සලකුණු කර දුන් මාර්ගයම අනුගමනය කරමින් ඉදිරියට ගමන් කළා. මග දෙපස වගුරු බිම් පෙනෙන්නට තිබුණා.

ටිකෙන් ටික සවස් කාලය ළඟා වුණා. හිරු බැස යමින් තිබුණා. පරිසරය අඳුරු වෙන්නට පටන් ගත්තා. ඔවුන් වගුරු සහිත බිම් කඩවල් කිහිපයක් පසු කරමින් ඒවා මග හැර ඉදිරියටම ගමන් කළා.

එකවරම ඈන් ඈතට අත දිගු කර පෙන්වමින් සතුටින් කෑ ගැසුවා...!

"අන්න....! මහ ගස් දෙක....!" ඇය කිව්වා.

වනාන්තරයේ අනෙකුත් ගස් අතරින් එක ළඟ පිහිටි දැවැන්ත ගස් දෙකක් ඉහළට නැඟී සිටින සැටි ළමුන්ට ඈත දී ම දැක ගන්නට ලැබුණා...! ඒ ගස් වසර සිය ගණනාවක් පැරණි ඒවා වන්නට ඇතැයි පෙනුමෙන්ම සිතා ගන්නට පුළුවන්කම තිබුණා.

ඒ මහ ගස් දෙක...!

ළමුන් මහ ගස් දෙක අසලට ළඟා වුණා. ඒ ඉදිරිපිට තරමක් ඉදිරියෙන් තිබුණේ අඳුරු දිය පිරි නිසල විලක්...!

ඒ කළුදිය විල...!

එය තරමක විශාල විලක්. විල වටා වැවී තිබුණු රූස්ස ගස්වල අඳුරු දිගු සෙවණැලි විලේ නිසල ජල තලය මත වැටී තිබුණා.

ළමුන් තවත් අඩි කිහිපයක් ඉදිරියට ඇදුණා. විල අද්දර පිහිටි තරමක එළිමහන් බිමක් ඔවුන්ට හමු වුණා. එහි දකින්නට තිබුණේ කලකට ඉහත දී අතහැර දැමූ, විනාශ වී, වල් බිහි වී ගොස් තිබෙන ගොවි ගෙදරයි.

ගොවි ගෙදර වහලයත් දොර ජනෙල් සියල්ලත් ගින්නෙන් දැවී විනාශ වී ගොස් තිබුණා. කඩා වැටුණු සුන්බුන් අතර තැනින් තැන උස් බිත්ති කොටස් කිහිපයක් පමණක් ඉතිරිව තිබුණා. ඒ බිත්තිත්, බිම තිබූ අනෙක් සුන්බුන් සියල්ලමත් වසාගෙන විශාල පඳුරු, වැල් ආදිය වැවී ගොස් තිබුණා.

කළුවර වැටීගෙන එමින් තිබූ ඒ සැන්දෑ වේලාවේ ගින්නෙන් පිළිස්සී ගොස් කළු ගැසී තිබුණු බිත්ති දිස් වුණේ නැගී සිටින අඳුරු අවතාර වලට සමානවයි. සුළඟේ සෙළවෙමින් බිත්ති වලින් පහළට එල්ලා වැටෙන වැල් ඒවායේ ගුප්ත පෙනුම තවත් වැඩි කළා.

ළමුන් මේ පාළු, අඳුරු, ගුප්ත, නිහඬ, පරිසරය දෙස ටික වේලාවක් කතා නැතිවම බලා සිටියා.

"මට නම් මේ තැන හිතට ඇල්ලුවේ නෑ." ඈන් කිව්වා. "අපිට මෙහාට එන්නේ නැතුව ඉන්නයි තිබුණේ....!"



# නිදන්නට තැනක් සොයමින්..... 12

ඇත්තෙන්ම ඒ ගුප්ත පාළු, අඳුරු, නිහඬ පරිසරයට ළමුන් කවුරුවත්ම එතරම් කැමති වුණේ නෑ. ටිකෙන් ටික අඳුරු වැටෙමින් තිබුණා. පරිසරය තව තවත් අඳුරු වුණා.

ජූලියන් අනෙක් ළමුන්ට කතා කළා.

"එන්න, ඉක්මන් කරමු. කළුවර වැටෙන්න කලින් නිදාගන්න තැනක් හොයා ගනිමු." ජූලියන් කිව්වා. "සමහරවිට මේ කැලෑ වැහිලා තියෙන ගොවි ගෙදර සුන්බුන් අතරේ හොඳ තැනක් තියෙන්න පුළුවන්."

ළමුන් ගොවි ගෙදර නටබුන් අතරින් ගමන් කරමින් නිදා ගන්නට සුදුසු තැනක් සොයා බලන්නට පටන් ගත්තා. ගොවි ගෙදර සම්පූර්ණයෙන්ම ගින්නෙන් විනාශ වී තිබුණත් මුළුතැන් ගෙයිත් තවත් එක් කාමරයකත් බිත්ති පමණක් ඉතිරි වී තිබුණා. ඒත් වහලයත් දොර ජනෙලුත් පිළිස්සී අළු බවට පත් වී තිබුණා.

ළමුන් ඒ දෙසට ගමන් කළා. ගින්නෙන් පිළිස්සී අඟුරු වී ගිය ගොවි ගෙදර ගෘහ භාණ්ඩවල කොටස් තවමත් තැනින් තැන දකින්නට තිබුණා.

"අපොයි...! මේ සුන්බුන් අතරේ නිදා ගන්නෙ කොහොමද...?" ඈන් ඇසුවා. "මෙතන වටේම පිච්චිලා අඟුරු පාටයි."

"අපි තව ටිකක් බලමු." ජූලියන් කිව්වා. "දැන් හොඳටම කළුවර වැටීගෙනයි එන්නේ. අපි වේලුන කොළ ගොඩක් අරගෙන ඇවිත් ඒ උඩින් රබර් ඇතිරිලි එළලා නිදා ගන්න තැනක් ලෑස්ති කර ගන්න ඕනේ. ඩික්, ජෝර්ජ්, ඉක්මනට ගිහින් කොළ ගොඩක් අරගෙන එමු."

ඔවුන් තිදෙනා පිට වී ගියා. මේ අතර ඈන් තනිවම සුන්බුන් පිරික්සමින් ඒ මේ අත ඇවිදිමින් සිටියා. ටික වේලාවකින් ඈන් අනෙක් ළමුන් තිදෙනා සිටි තැනට දිව ආවා.

"ඉක්මනට එන්න....!" ඈන් සතුටින් කිව්වා. "නිදා ගන්න ෂෝක් තැනක් මට හම්බ වුණා...!"

ඇය අනෙක් ළමුන්ව මුළුතැන්ගෙයි බිත්තියක් අසලට කැඳවා ගෙන ගියා. එහි බිම එක් තැනකින් පොළොව ඇතුළට බසින්නට පියගැට පෙළක් තිබුණා. ඒ පියගැට කිහිපය බැස ගිය විට හමු වුණේ පොළොව යට පිහිටා තිබූ ගොවි ගෙදර පැරණි ගබඩා කාමරයයි.

"පහළ තියෙන්නේ ගබඩා කාමරයක්...!" ඈන් කිව්වා. "ඒත් පොළොව මට්ටමට වඩා පහළින් තියෙන නිසා ඒකට ගින්නෙන් හානියක් වෙලා නෑ. ඇතුළ තෙත නැත්නම් අපිට නිදා ගන්න පුළුවන්."

"බලමු....!" ජූලියන් කිව්වා.

ඔහු පියගැට කිහිපය පහළට බැස කාමරය තුළට විදුලි පන්දම එල්ල කර බැලුවා. එය තරමක විශාල කාමරයක්. ළමුන් සතර දෙනාට නිදා ගන්නට එහි ඉඩකඩ හොඳටම සෑහෙන බව ඔහුට පෙනුණා.

පොළොව යට පිහිටා තිබුණත් ගබඩා කාමරයේ බිත්තිත්, පොළොවත් තෙත් වී තිබුණේ නෑ. ඒ නිසාම එහි පුස් ගඳක් වහනය වුණෙත් නෑ.

අනෙක් ළමුන් තිදෙනාත් ජූලියන් පසුපසින් පියගැට පෙළ දිගේ පහළට බැස්සා. කාමරය දැක ඔවුන් හැමෝම සතුටට පත් වුණා.

ගබඩා කාමරයේ එකමූලක පැරණි මේසයක් හැරෙන්නට වෙනත්





කිසිවක් තිබුණේ නෑ.

"අර බලන්න....! මේසේ උඩ තවම ඉටිපන්දමක් ගහලා තියෙනවා." ඩික් කිව්වා. "අපි ඒක පත්තු කර ගනිමු."

ජෝර්ජ් මේසය අසලට ගමන් කළා. ඇගේ මුහුණෙත් හිසේත් මකුළු දැලක් පැටළුණා. ඇයට මකුළු දැල් පිසදමා ගන්නට ඈන් උදව් කළා. ජෝර්ජ් ඉටිපන්දම දල්වා, මේසය මත තිබූ දූහුවිලි පිස දැම්මා. ඈන් කාමරයේ තැනින් තැන බැඳ තිබූ මකුළුදැල් කඩා දැම්මා.

ජූලියන්, ඩික් දෙදෙනා කාමරයේ බිම පිළිවෙළකට කොළ රොඩු අතුරා ඒ මත ඇතිරිලි එළා නිදා ගන්නට සැප පහසු මෙට්ට සතරක් පිළියෙළ කළා.

ගබඩා කාමරයේ එක් බිත්තියක ඇති බිත්ති අල්මාරිය ළමුන්ට දැක ගන්නට ලැබුණේ ටික වේලාවකට පසුවයි. එහි අගුළු මළ බැඳී විනාශ වී ගොස් තිබුණා. ජූලියන් එහි පියන හැර බැලුවා.

"ඔහ්...! මෙන්න තව ඉටිපන්දම් තියෙනවා." ඔහු සතුටින් කිව්වා. "ආ....! පිඟන් කෝප්පත් තියෙනවා."

ඈන් ගබඩා කාමරයෙන් පිටතට ඇවිත් ගරා වැටී ඇති මුළුතැන්ගෙයි බිත්ති අතර ඇවිදිමින් වටපිට පිරික්සා බලමින් සිටියා. අඳුර වැටීගෙන එමින් තිබූ නිසා ඒ වන විට වටපිටාව පෙනුණේ යන්තමින්.

ඒත් මුළුතැන්ගෙයි අඳුරු කෙළවරක තිබූ කරාමයක් හදිසියේම ඈන්ගේ ඇස ගැටුණා. ඒ කරාමයට අත් පොම්පයක් සවි කර තිබෙන බවත් ඈට පෙනුණා.

"ජූලියන්, මෙන්න වතුර පොම්පයක් තියෙනවා....!" ඈන් සතුටින් කෑ ගැසුවා. "මම හිතන්නේ ඒක තාමත් වැඩ කරනවා ඇති."

ජූලියන් ඉටිපන්දමකුත් දල්වාගෙන එතැනට ආවා. ඔහු අත් පොම්පය කිහිප වරක් ක්‍රියා කරවා බැලුවා.

ළමුන්ව පුදුමයට පත් කරමින් කරාමයෙන් වතුර ගලා එන්නට පටන් ගත්තා...!

ජූලියන් ජල නලයේ රැඳී තිබෙන පැරණි ජලය ඉවත් වී අලුතින් ඊට ජලය එකතු වන තුරුම අත් පොම්පය ක්‍රියා කෙරෙව්වා.

මේ අතර ඈන් පහළ පිහිටි ගබඩා කාමරයට ගොස් අල්මාරියේ අසුරා තිබූ කෝප්ප කිහිපයක් රැගෙන ආවා. ඇය ඒවා කරාමයට අල්ලා සෝදා පිරිසිදු කර ගත්තා.

ජූලියන් වතුර කෝප්පයක් පුරවාගෙන නාසයට ළං කර එහි ගඳ සුවඳ බැලුවා.

"වතුර වල නම් ගඳක් නෑ. පිරිසිදුයි. පැහැදිලියි." ඔහු කිව්වා. "අපිට මේ වතුර පාවිච්චියට ගන්න පුළුවන්. මේ වතුර එනවා ඇත්තේ මේ ළඟම තැනක තියෙන ළිඳකින් වෙන්න ඕනේ."

සෝදා පිරිසිදු කර ගත් කෝප්පත්, පුරවා ගත් වතුර භාජනයකුත් රැගෙන ඔවුන් ආපසු ගබඩා කාමරයට ගියා. ජෝර්ජ් කාමරය පුරා ඉටිපන්දම් කිහිපයක්ම දල්වා තිබුණා. ඉන් කාමරය එළිය වී ඊට අපූරු පෙනුමක් එක් වී තිබුණා.

"දැන් අපිට රෑ කෑම කන්න හොඳ වෙලාව." ජූලියන් කිව්වා.

ජූලියන්, ඩික්, ජෝර්ජ්, ඈන්, ටිමී පස් දෙනා ගබඩා කාමරයේ බිම ඔවුන් පිළියෙළ කරගත් ඇඳන් මත වාඩි වී කෑම කන්නට සූදානම් වුණා.

"ඇත්තටම ජූලියන්, මේ විල ළඟ මොකක් හරි රහසක් හැංගිලා තියෙනවා කියලා ඔයා හිතනවාද?" ඈන් ඇසුවා.

"ඔව්...!" ජූලියන් කිව්වා.

"ඉතින් ඒ මොකක්ද?" ඈන්, ජෝර්ජ් දෙන්නා එකවරම ඇසුවා.





ඒ රහස කුමක්දැයි කියන්නට ජූලියන්, ඩික් දෙදෙනාම අනුමානයෙන් දැන සිටියා. ජූලියන් ඒ ගැන විස්තර කරන්නට පටන් ගත්තා.

"මෙහෙමයි.... හිරගෙදර ඉන්න නෙයිලර් කියන හිරකාරයා එයාගේ හිතවත් අය දෙන්නෙකුට රහස් පණිවිඩයක් එව්වා කියලා අපි දැන් දන්නව නේ. කිළුටු ඩික්ට ඒක හම්බ වුණේ නෑ. ඒත් අනිත් කෙනා මැගීට ඒක හම්බ වෙන්න ඇති. අපි හොයන්න යන්නේ නෙයිලර් එයාගේ යාළුවන්ට එවපු පණිවිඩේ මොකක්ද කියලා." ජූලියන් කිව්වා.

"නෙයිලර් ලොකු හොරකමක් කරලා ඇති. අපි දන්නෙ නෑ හරියටම ඒ හොරකම මොන වගේ එකක්ද කියන්න. ඒත් නෙයිලර් ඒ හොරකම් කරපු බඩු ටික කොහේ හරි හංගන්න ඇති."

"කොහොම හරි නෙයිලර් හිරේට නියම වෙන්න ඇති. ඒත් හොර බඩු ගැන එයා කාටවත් එළි කරන්න නැතුව ඇති. හිරේ ඉඳන් ලියුමකින්වත් ඒ ගැන කාටවත් දන්වන්න විදිහක් නෑ. තැපැල් කරන්න කලින් හිරකාරයින්ගේ ලියුම් බන්ධනාගාරයෙන් කඩලා බලනවා. හිරකාරයෝ බලන්න එන අය මොනවද එයාලත් එක්ක කතා කරන්නේ කියලත් බන්ධනාගාර නිලධාරියෙක් අහගෙන ඉන්නවා. ඒ නිසා නෙයිලර්ට රහස දිගටම රැකගෙන ඉන්න වුණා."

"හිරකාරයෙක් හිරෙන් පැනලා ආවේ ඔය අතරෙදි තමයි." ඩික් කතාවට එකතු වෙමින් කිව්වා. "වෙන කවුරු හරි හොයා ගන්න කලින් හංගලා තියෙන වස්තුව එයාගේ යාළුවෝ දෙන්නට කියලා මෙහෙන් පිට කර ගන්න නෙයිලර්ට ඕනේ වෙලා ඇති. නෙයිලර් ඒ හිරකාරයා අතේ එයාගේ යාළුවෝ දෙන්නෙකුට පණිවිඩයක් එව්වා."

"ඒක හරි...!" ජූලියන් කිව්වා. "නෙයිලර්ගේ පණිවිඩය අරගෙන ආපු හිරකාරයත් මේ පණිවිඩයේ තේරුම හරියටම දන්නෙ නැතුව ඇති. ඒ වුණාට නෙයිලර්ගේ හොරකම ගැන කලින් ඉඳන් දැනගෙන හිටපු කිළුටු ඩික්, මැගී දෙන්නට මේ පණිවිඩය හොඳට තේරෙනවා ඇති."

"දැන් මැගීට පණිවිඩය ලැබිලා ඇති. එයා නෙයිලර්ගේ හොර

බඩු හංගලා තියෙන තැන හොයාගෙන ඉක්මනටම මෙහාට එවි." ඩික් කිව්වා.

"අපි ඊට කලින් ඒවා හංගලා තියෙන තැන කොහොම හරි හොයා ගන්න ඕනේ." ජෝර්ජ් හොඉවසිල්ලෙන් කිව්වා. "අපි මැගීට කලින් මෙහෙන්ට ආව නේ. හෙට උදේන්ම හොයන්න පටන් ගනිමු. ඩික්, ඔයාගේ පණිවිඩයේ රහස් වචන දෙකක් අපි දැනට හොයාගෙන තියෙනවා. 'මහ ගස් දෙක - කළුදිය විල'. ඊළඟ වචනය මොකක්ද?"

"දඟකාර ජේන්...!" ඩික් කිව්වා.

"එහෙම කෙනෙක් නම් මේ හරියේ නැතුව ඇති." ඈන් කිව්වා. "ජේන් කියන්නේ මැගී වගේම මේ රහස් ගැන දන්න තවත් ගෑනු කෙනෙක් වෙන්න බැරිද?"

"මට නම් හිතෙන්නේ, දඟකාර ජේන් කියන්නේ බෝට්ටුවකට කියන නමක් වෙන්න ඇති කියලා." ඩික් කිව්වා.

"ආ....! වෙන්න පුළුවන්." ජෝර්ජ් කිව්වා. "ඒක බෝට්ටුවක් වෙන්න ඇති. මේ විල අවට කොහේ හරි තැනක ඒ බෝට්ටුව ඇති. ඒ කාලේ මේ ගොවිපළේ හිටිය අයට අනිවාර්යයෙන්ම බෝට්ටුවක් තියෙන්න ඕනේ. අපි හෙට උදේන්ම ඒ බෝට්ටුව හොයා ගනිමු. සමහරවිට නෙයිලර් හොරකම් කරපු වටිනා වස්තුව සේරම ඒ බෝට්ටුවේ හංගලා ඇති."

"මං හිතන්නෙ නෑ...!" ඩික් කිව්වා. "බෝට්ටුවක කවුද හොර බඩු හංගන්නේ. මට දීපු කඩදාසි කෑල්ල අරන් බලමු. තවත් මොකක් හරි හෝඩුවාවක් තියෙන්න පුළුවන්."

ඩික් පොලිස් නිලධාරියා ඉරා විසි කළ කඩදාසි කැබලි කිහිපය සාක්කුවෙන් පිටතට ගත්තා. ජෝර්ජ් ළඟ තුවාලවලට දමන බෙහෙත් ප්ලාස්ටර් කිහිපයක් තිබුණා. ඇය ඒවා කඩදාසි කැබලි වල පිටුපසින් අලවා නැවත කඩදාසිය එකලස් කළා.

ළමුන් එහි ඇඳ තිබූ අපැහැදිලි රූප සටහන ඉටිපන්දම් එළියෙන්





පිරික්සා බලන්නට පටන් ගත්තා.

"ජේනවද...? මැදින් තිතක් තියෙනවා." ජූලියන් කිව්වා. "ඒ වටේ හතර පැත්තට කතිරයක් වගේ ඉරි හතරක් තියෙනවා. ඉරි හතර කෙළවරේ පුංචිවට වචන හතරකුත් ලියලා තියෙනවා."

"බලමු, මොනවද ඒ වචන කියලා....!" ජෝර්ජ් කිව්වා. "කඳු මුදුන - මුදුන් කොත...."

"චිමිනිය - ගල් කණුව...." ඈන් ඉතිරි වචන දෙක කිව්වා. "මේ වචනවල තේරුම හොයා ගන්න ලේසි වෙන්නෙ නෑ."

"අපි දැන් නිදා ගනිමු." ජූලියන් කිව්වා. "හෙට උදේ වෙනකොට ඒ ගැන අදහසක් පහළ වෙන්න බැරි නෑ...!"

# විල් තෙරේ රැයක්..... 13

"මේ කඩදාසියේ හැංගිලා තියෙන රහස කොහොම හරි හොයා ගන්න ඕනේ." ජූලියන් කිව්වා. "අපි හෙට උදේ ඉඳන් ඒ ගැනම මහන්සි වෙමු."

"අමතක කරන්න එපා...!" ඩික් කිව්වා. "මැගී ළඟත් මේ ජාතියෙම තව එකක් තියෙනවා. නෙයිලර්ගෙ පණිවිඩය මැගීත් දන්නවා. සමහරවිට මැගී අපිට වඩා හොඳට මේ කඩදාසි කෑල්ලේ තියෙන දේ ගැන දන්නවා ඇති."

"ඔව්, මැගී මේ ගැන හරියටම දන්නව නම් හෙට උදෙන්ම මෙතෙන්ට ඒවි." ඈන් කිව්වා. "අපි ඒ ගැන කල්පනාවෙන් ඉන්න ඕනේ. ජූලියන්, මැගී එනකොට අපි හැංගිලා ඉන්න ඕනෙද?"

ජූලියන් ටික වේලාවක් කල්පනා කළා.

"නෑ, ඕනෙ නෑ." ඔහු අන්තිමේදී කිව්වා. "අපි මේ රහස දන්නවා කියලා මැගී කොහොමටවත් සැක කරන්නේ නෑ. මට ඒක හොඳටම විශ්වාසයි. අපි විනෝදෙට ඇවිදින්න යන ගමන් අහම්බෙන් මේ විල ළඟට ආවා වගේ අඟවමු. අනික.... ඇත්තටම වුණොත් ඒක නේ...!"

"අපි මැගී ගැන ඇහැ ගහගෙන ඉඳිමු. එයා මෙහාට ඇවිත් මොනවද කරන්නේ කියලා අපි බලාගෙන ඉඳිමු." ඩික් කිව්වා.





"මැගී තනියම එන එකක් නෑ." ජූලියන් කිව්වා. "මට හිතෙන විදිහට එයා කිළුටු ඩික්වත් එක් කරගෙන ඒවි. කිළුටු ඩික්ට පණිවිඩය ලැබුණේ නැති බව ඇත්ත. ඒත් එයාගේ පණිවිඩයේ 'මැගී දන්නවා' කියලා තිබුණා වගේම මැගීට හම්බ වුණ පණිවිඩෙයේ 'ඩික් දන්නවා' කියලා තියෙන්න පුළුවන්. මැගී, කිළුටු ඩික් දෙන්නම මේ ගැන හරියටම දන්නවා ඇති. ඒ දෙන්නා ආවොත් අපි එයාලගේ හැසිරීම දිහා බලලා මේ ගැන තේරුම් ගන්න උත්සාහ කරමු."

"කිළුටු ඩික්ට පණිවිඩය හම්බ වුණේ නැත්තේ ඇයි කියලා එයාලා පුදුම වෙනවා ඇති." ජෝර්ජ් කිව්වා. "තාම එයාලා හිතාගෙන ඉන්නව ඇත්තේ පැනල ගිය හිරකාරයට කිළුටු ඩික්ව මග හැරුණා කියලා වෙන්න ඇති."

"මේවා සේරම හරිම සංකීර්ණයි...!" ඈන් ඈනුමක් හරිමින් කිව්වා. "මට නම් දැන් මේ ගැන කතා කරනවා අහගෙන ඉඳලම ඇති වෙලා. අපි දැන් නිදා ගනිමුද? මට නම් නිදිමතයි."

ඩික් ඈනුමක් හැරියා.

"මටත් නිදිමතයි." ඔහු කිව්වා. "අපි දැන් නිදා ගනිමු. මේ ගබඩා කාමරේ ඇතුළේ සීතල නෑ. හොඳට නිදා ගන්න පුළුවන්."

"මහ රෑ ජාමේ මැගී ඇවිත් මේ කාමරේට එකපාරටම කඩා පනියිද දන්නෙ නෑ." ඈන් නිදා ගන්නට සූදානම් වෙමින් කිව්වා.

"පිස්සු කතා කියන්න එපා...!" ජෝර්ජ් කිව්වා. "පුංචි සද්දයක් ඇහුණත් ටිමී බුරනව නේ. ඒ නිසා අපි කිසි දේකට බය වෙන්න ඕනෙ නෑ."

"ඒක මම දන්නවා." ඈන් කිව්වා. "මම නිකමට කිව්වේ."

ජෝර්ජ්, ඈන් දෙදෙනාම බිම සකස් කර තිබූ ඇතිරිලි මත වැතිරී පොරෝනා දෙකකින් හොඳින් සිරුර වසාගෙන නිදා ගන්නට පටන් ගත්තා.

"අපි පස් දෙනා එකතු වුණොත් මොකක් හරි හපන්කමක් කරන්න ලැබෙනවාමයි." ඩික් කිව්වා. "මේ සැරෙත් අපිට අපූරු හපන්කමක්

කරන්න පුළුවන් වෙයි වගේ...!"

ජූලියන් එක් ඉටිපන්දමක් දැල්වී තිබෙන්නට ඉඩ හැර අනෙක් ඒවා නිවා දැම්මා. දැල්වුණු ඉටිපන්දමෙන් කාමරය යන්තම් එළිය වී තිබුණා. ඔහු ඩික් සමග කාමරයේ අනෙක් පස සකස් කර තිබූ ඇතිරිලි මත වැතිරී නිදා ගත්තා.

ජෝර්ජ්, ඈන් දෙන්නාගේ දෙපා අසලින් ටිමීත් වැතිරුණා.

"ටිමී ළඟ ඉන්නකොට මට බය නැතුව නිදා ගන්න පුළුවන්." ඈන් අඩ නින්දෙන් මෙන් කිව්වා.

දවස තිස්සේ ඇවිද වෙහෙස වී සිටි නිසා ඔවුන් සතර දෙනා ඉක්මනින්ම නින්දට වැටුණා. පාළු විල් තෙරේ රැය නිහඬවම ගත වුණා. ළමුන්ගේ නින්දට බාධා කරන්නට කිසිවෙක් හෝ ඒ පළාතේ සිටියේ නෑ.

ඒත් ටිමී එක කනක් ඉහළට ඔසවාගෙන පුංචි හඬකටත් ඇහුම්කන් දෙමින් නිදා ගෙන සිටියා. එක් වරක් ටිමීට සිහින් 'සර සර' හඬක් ඇසුණා.

ටිමී වැතිරී සිටි තැනින් නැගිට, පියගැට කිහිපය නැග එළිමහනට ගමන් කළා. ඉව කරමින් හඬ ඇසුණු දෙසට ළඟා වුණා. ඒ පුංචි ගෙඹි පැටියෙක්...! ටිමී ආපසු ගොස් ජෝර්ජ් ළඟින්ම වැතිරී නිදා ගත්තා.

මැදියම් රැයත් පසු වී ගියා. නිසල නිහඬ පරිසරය රැය පුරාම එක සේ පැවතුණා.

ටිමී එකවරම වැතිරී සිටි තැනින් නැගිට්ටා...! නැවත වතාවක් ටිමීට යම් කිසි සතෙකුගේ ඉවක් දැනී තිබුණා. ඉතින් ටිමී එවරත් එළිමහනට ගොස් ඉව කරමින් ඒ මේ අත සැරිසරන්නට පටන් ගත්තා.

ටිමීට දැනී තිබුණේ විල් තෙර අවට සැරිසරමින් සිටි කැලෑ නරියෙකුගේ ඉවයි. නරියා ටිමීගේ ඉව දැනී සෙමින් කැලයට වැදී නොපෙනී ගියා.

ටිමී ආපසු ගොස් ජෝර්ජ් අසලින්ම වැතිරී නැවතත් නිදා ගන්නට





පටන් ගත්තා. ඉන්පසුව නම් ටිමීත් නැවත අවදි වුණේ නෑ. පසු දා එළි වන තුරු එක දිගටම නිදා ගත්තා.

පසුදා උදෑසන එළැඹුණා. ඒත් ළමුන් තවමත් නිදා ගෙන සිටියා. පොළොව යට පිහිටා තිබූ කාමරයට හිරු එළිය වැටුණේ නෑ. මේසය මත දැල්වුණු ඉටිපන්දමත් නිවී ගොස් තිබුණා. ඉතින් රැය පහන් වී ඇති බව ළමුන් දැන සිටියේ නෑ...!

සෑහෙන වේලාවකට පසු ජූලියන් අවදි වුණා. ඔහු අත් ඔරලෝසුවට විදුලි පන්දම අල්ලා වේලාව බැලුවා.

"ඩික්...! අට හමාරත් වෙලා. නැගිටින්න....!" ඔහු කිව්වා.

ඩික් ඇඟ මැලි කඩමින් නැගිට්ටා. ටිමී සතුටින් වලිගය වනමින් ඔවුන් දෙදෙනා අසලට ආවා. ජෝර්ජ්, ඈන් දෙදෙනාත් අන්තිමේදී අවදි වුණා.

උදෑසන විලට ගොස් ඇඳුම් පැළඳුම් පිරිසිදු කර, නා ගන්නට ළමුන් තීරණය කළා. වතුර හිම මෙන් සිසිල් වුණත් ඔවුන් ඒ ගැන තැකීමක් කළේ නෑ.

නා ගැනීමෙන් අනතුරුව ඔවුන් උදෑසන ආහාරය ගන්නට සූදානම් වුණා. ඈන් අනෙක් ළමුන්ට කෑම බෙදා දුන්නා. පාන්, බටර්, චීස් ටිකෙන් ටික අවසන් වන්නට පටන් ගත්තා...! අන්තිමේදී චොකලට් කිහිපයකටත් ඒ ඉරණමම අත් වුණා...!

ළමුන් කෑම කමින් සිටින අතරතුර එකවරම සීනු නාදයක් ඈතින් ඇසෙන්නට පටන් ගත්තා...! ඈන් කලබල වී අනෙක් ළමුන් දෙස බැලුවා. ඒත් සමගම ඒ සීනු නාදය කුමක්දැයි ඇයත් අනෙක් ළමුනුත් හඳුනා ගත්තා.

"පල්ලියේ සීනුව...!" ජූලියන් කිව්වා. "අද ඉරිදා නේ. ඒ කියන්නේ, මේ අහළ පහළ ගමක පල්ලියක් තියෙනවා."

ළමුන් කෑම ගෙන අවසන් කළා.

"දැන් අපි ඉස්සර වෙලාම කරන්න ඕනේ, 'දඟකාර ජේන්'ව

හොයන එකයි." ජූලියන් කිව්වා. "ඊට කලින් අපි සිතියම අරන් බලමු. කඩදාසි කෑල්ලේ ලියලා තිබ්බ විදිහේ කඳු මුදුනක්, උස ගලක් ගැන මොකක් හරි තොරතුරක් හොයා ගන්න පුළුවන්ද කියලා."

ළමුන් ටික වේලාවක් සිතියම පිරික්සමින් කල් ගත කළත් ඒ ගැන කිසිම හෝඩුවාවක් සොයා ගන්නට ඔවුන්ට හැකි වුණේ නෑ. අන්තිමේ දී ඔවුන් සිතියම හකුලා දමා විල දෙසට ගමන් කළා.

"දැන්...! අපි දඟකාර ජේන් කියන බෝට්ටුව හොයමු." ඩික් කිව්වා. "ඒක විල අහල පහළ කොහේ හරි තැනක තියෙන්න පුළුවන්."



# දඟකාර ජේන්ව සොයමින්.... 14

ළමුන් විල අද්දරට ළඟා වුණා. විල ඉවුරේ වැවී තිබුණු රූස්ස ගස් සහ ඝන පඳුරු නිසා විල අවට බෝට්ටුවක් තිබේදැයි කියා සෙවීම අසීරු වැඩක් බව ළමුන්ට තේරුණා. ඒත් ඔවුන් පඳුරු බිඳ දමමින් විල ඉවුර දිගේ මඳ දුරක් ඈතට ගමන් කළා.

"අර බලන්න....! විලේ ඉඳන් පුංචි ගඟක් ගලනවා....!" ජෝර්ජ් කිව්වා.

"ඒ ගඟක් නෙවෙයි. විලට ගලා ගෙන එන පුංචි දිය පාරක් විතරයි." ඩික් කිව්වා. "සමහරවිට ඒ දිය පාර පැත්තේ බෝට්ටුවක් තියෙන්න පුළුවන්."

ළමුන් දිය පහර දිගේ අඩි කිහිපයක් ඉදිරියට ගමන් කළා. ටික දුරක් යද්දී එකවරම ජූලියන් සතුටින් කෑ ගැසුවා.

"අන්න....! බෝට්ටු නවත්තලා තියන්න හදපු මඩුවක් තියෙනවා." ඔහු කිව්වා. "ජේනවද...! ඒක හොඳටම කැලෑ වැහිලා. වහලෙයි, බිත්තියි පුරාම වැල් දුවලා."

ළමුන් ඒ මඩුව අසලට ළඟා වුණා. එය ලෑලි වලින් ආවරණය කර තිබූ තරමක විශාල ගොඩනැගිල්ලක්. ඒත් එය හොඳටම දිරා ගොස් තිබෙන බව ළමුන්ට පෙනුණා.

ජූලියන් ලෑලි මඩුවට ඇතුළු වුණා. අනෙක් ළමුන් ඔහු පිටුපසින් ආවා. මඩුව ඇතුළත බොහෝ අඳුරු ස්වභාවයක් ගත්තා. ලෑලි බිත්ති දිරා යාමෙන් තැන තැන සැදුණු සිදුරු වලින් එහි ඇතුළට යන්තමින් හිරු එළිය වැටුණා. ඒත් මඩුව ඇතුළත පුස් ගඳක් වහනය වුණා.

"ආ...! මෙතන බෝට්ටු තුනක් තියෙනවා...!" ඩික් සතුටින් කෑ ගැසුවා. "ඉක්මනට බලමු, මේවයින් එක බෝට්ටුවක් දඟකාර ජේන් වෙන්න ඇති."

ළමුන් බෝට්ටු වලට ළං වී ඒවා පිරික්සා බැලුවා. ඉන් දෙකක්ම අබලන් වී අධික සිදුරු වී තිබුණා. ඒත් එක් බෝට්ටුවක් තරමක හොඳ තත්වයෙන් තිබෙන බව පෙනුණා.

ඩික් ඔහුගේ විදුලි පන්දම දල්වාගෙන බෝට්ටුවල බඳ පිරික්සා බැලුවා. පළමුවැනි බෝට්ටුවේ බඳෙහි පින්තාරු කර තිබූ නම බොහෝ දුරට මැකී ගොස් තිබුණා.

"මොකක්ද මේ නම...?" ඩික් ඉතිරිව තිබූ අකුරු කිහිපය කියවන්නට උත්සාහ කරමින් කිව්වා.

"කෙළිලොල්..... තවත් කෑල්ලක් තියෙනවා."

"මෙගී....!" ඈන් කිව්වා. "කෙළිලොල් මෙගී...! නියමයි. මෙයා දඟකාර ජේන්ගේ සහෝදරිය වෙන්න ඇති. එතකොට අනිත් බෝට්ටුවේ නම මොකක්ද?"

විදුලි පන්දම් එළිය ඒ දෙසට එල්ල වුණා. එහි නම පැහැදිලිව දකින්නට තිබුණා. එහි බඳෙහි පින්තාරු කර තිබූ නම ළමුන් සියලු දෙනාම එක හඬින් කිව්වා.

"අවිනීත චාලි...!"

"කෙළිලොල් මෙගීගේ සහෝදරයා....!" ඩික් කිව්වා. "හැබැයි මේ අහිංසක බෝට්ටුවලට 'කෙළිලොල්, අවිනීත' කියලා නම් දාන එක හරිම අසාධාරණයි...!"

"මට හොඳටම විශ්වාසයි, අනිත් බෝට්ටුව දඟකාර ජේන් වෙන්න





ඕනේ...!" ඈන් සතුටින් කිව්වා. "එහෙම වෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා...!"

ළමුන් තුන්වැනි බෝට්ටුව අසලට එකතු වුණා. එහි බඳෙහි පින්තාරු කර තිබූ නම පැහැදිලිව පෙනුණේ නෑ. ජූලියන් ඔහුගේ ලේන්සුව ගෙන බෝට්ටුවේ නම වසාගෙන වැවී තිබූ දියසෙවළ පිස දැම්මා. එවිට නම පැහැදිලිව දකින්නට ලැබුණා. ඒත්...! ඒ දඟකාර ජේන් නම් නොවන බව පෙනුණා...!

"කරදරකාර ජෙරී....!" හැමෝම එක හඬින් කිව්වා.

"ෂත්...! එතකොට කෝ දඟකාර ජේන්...!" ඩික් කණගාටු වෙමින් කිව්වා.

"කෙළිලොල් මෙගී, අවිනීත චාලි, කරදරකාර ජෙරී...! මේ හැමෝම එකම පවුලක අය. දඟකාර ජේන් අයිති වෙන්න ඕනෙත් මේ පවුලටම තමයි." ඈන් කිව්වා.

"සමහරවිට එයා මේ කොහේ හරි අහළ පහළක ඇති...!" ඩික් කිව්වා.

ළමුන් දඟකාර ජේන්ව සොයා මඩුවෙන් පිට වී යන්නට සූදානම් වුණා. ජෝර්ජ් ඊට පෙර කිහිප වතාවක් මඩුව පුරා විදුලි පන්දම එල්ල කරමින් පිරික්සා බැලුවා. මඩුවේ ලෑලි බිත්තියෙහි සවි කර තිබූ කොකුවල හබල් කිහිපයකුත් ලණු කැරලි කිහිපයකුත් එල්ලා තිබුණා. ඊට අමතරව තවත් විශේෂ යමක් ජෝර්ජ්ගේ ඇස ගැටුණා...!

"අන්න...! අර මොකක්ද?" ජෝර්ජ් ඒ දෙස බලමින් කිව්වා. "ප්ලාස්ටික් පහුරක් නේද? ආ... ඒක හබල් ගාන්නෙ නැතුව පැඩල් වලින් පදින පහුරක්...!"

ළමුන් එතැනට වට වී පහුර පිරික්සා බැලුවා.

"මේ පහුරට කිසිම හානියක් වෙලා නෑ." ජූලියන් කිව්වා. "තවම පාවිච්චි කරන්න පුළුවන්. මේක කර තියාගෙන විලට අරන් යන්න පුළුවන්ද කියලා අපි බලමු. මේ පහුර අරන් ගියොත් අපිට විලේ රවුමක් පදින්න පුළුවන්."

"ඔහ්...! නියමයි." ඈන් සතුටින් අත්පොළසන් දෙමින් කිව්වා. "බෝට්ටුවලට වඩා පහුරක් හොඳයි. විල පුරාම නිදහසේ පදින්න පුළුවන්."

"මෙතන තියෙන බෝට්ටු තුනෙන් එකක් විතරයි තවම ප්‍රයෝජනයට ගන්න පුළුවන් තත්වයක තියෙන්නේ...!" ජූලියන් කිව්වා. "අනිත් දෙකේම අඩිය හිල් වෙලා. ඒවා ගිලෙනවා."

"සමහරවිට දඟකාර ජේන් විල ඉවුරේ කොහේ හරි තැනක ඇති." ඩික් කිව්වා. "අපි ගිහින් බලමු."

"එහෙම නම් අපි දැනට පහුර මෙතනම තියෙන්න ඇරලා දඟකාර ජේන්ව හොයන්න යමු." ජූලියන් කිව්වා.

ළමුන් සතරදෙනා විල ඉවුර අද්දරට ළඟා වුණා. විලේ ඉවුර කෙළවරටම රූස්ස ගසුත්, ඝන පඳුරුත් වැවී තිබුණු නිසා ඉවුර දිගේ විල වටා ගමන් කරන්නට අපහසු බව ළමුන්ට පෙනුණා.

ඒත් ජූලියන්, ඩික්, ජෝර්ජ් තිදෙනා පඳුරු බිඳ දමමින් විල ඉවුර දිගේ ඉදිරියට ගමන් කරන්නට පටන් ගත්තා. ඈන් තරමක් පරිස්සමෙන් ඔවුන් සමග පිටුපසින් ගමන් කළා. ඒත් ටිමී නම් ඊට එක් වුණේ හරිම කැමැත්තෙන්.

ළමුන් විල ඉවුර දිගේ අපහසුවෙන් ටික දුරක් ඉදිරියට ගමන් කළා. ඒත් විල් ඉවුරේ නවත්වා තිබූ බෝට්ටුවක් ඔවුන්ට තවමත් ඇස ගැටුණේ නෑ. ඔවුන් ඝන පඳුරු අතරින් ගමන් කර වෙහෙසට පත් වී සිටියා.

"විල අයිනෙන් ඉස්සරහට යන එක හරිම අමාරු වැඩක්...!" ජූලියන් කිව්වා. "පඳුරු වැවිලා නිසා වැඩිය ඈත පෙනෙන්නෙත් නෑ. අපි මේ වැඩේ අතහැරලා දාමු."

"ඒක ඇත්ත...! මේක තේරුමක් නැති වැඩක්." ඈන් කිව්වා.

ළමුන් ආපසු යන්නට හැරුණා.

"අපි පහුරේ නැගලා විල ඉවුරට පුළුවන් තරම් ළඟින් විල වටේ





රවුමක් යමු." ඈන් කිව්වා. "විල අයිනේ කොහේ හරි තැනක බෝට්ටුවක් තිබුණොත් එතකොට අපිට පෙනෙයි නේ."

"ඒක හොඳ අදහස....!" ජූලියන් කිව්වා. "කලින් අපි ඒ ගැන හිතුවේ නෑ නේ."

ළමුන් ආපසු කැලය අතරින් බෝට්ටු නවතා තිබූ මඩුව දෙසට එන්නට පිටත් වුණා. ඔවුන් ටික දුරක් ඉදිරියට එද්දී ටිමී එකවරම සිහින් හඬින් ගොරවන්නට පටන් ගත්තා...!

"ටිමී, මොකද...?" ජෝර්ජ් සෙමින් ඇසුවා.

ටිමී නැවතත් ගෙරෙව්වා.

"කවුරු හරි විල පැත්තට එනවා වගේ...!" ජෝර්ජ් කිව්වා.

ජෝර්ජ් ටිමීව නිහඬ කර, කරපටියෙන් අල්ලා ගත්තා. ළමුන් පඳුරක් අසල බිමට නැමී වාඩි වී බලා සිටියා.

මුලින්ම ගස් අතරින් ගැහැනු රුවක් මතු වුණා...! දෙවැනිව ඒ පිටුපසින් පිරිමි රුවකුත් ඉදිරියට ආවා...!

"මැගී...! මං හිතන්නේ ඒ මැගී...!" ජූලියන් කිව්වා.

"පිටිපස්සෙන් එන්නේ කිළුටු ඩික්...!" ඩික් කිව්වා. "මට එයාව හොඳට අඳුනගන්න පුළුවන්. ඔව්...! ඒ කිළුටු ඩික් තමයි...!"

# 15
# මැගී සහ කිළුටු ඩික්.....

මැගී සහ කිළුටු ඩික් විල අද්දරට ළඟා වන සැටි ළමුන් සැඟවී බලා සිටියා. ඈත් නම් ඔවුන් දෙදෙනාගේ පෙනුමට කොහෙත්ම කැමති වුණේ නෑ.

කිළුටු ඩික් පොඩි වී ගිය පරණ ඇඳුමක් හැඳ සිටියා. ඔහුගේ මුහුණ පුරා තැනින් තැන රැවුල් කොට වැවී තිබුණා. කන් දෙක වැසී යන සේ දික් වූ කොණ්ඩය අවුල් වී ගොස් තිබුණා.

මැගී ඩෙනිම් කලිසමක් සහ හම් කබායක් හැඳ, තද කළු පැහැති අව් කණ්ණාඩියක් පැළඳ සිටියා. ඇය හිසකෙස් කොටට කපා සිටියා. ඇය දුම්වැටියකුත් උරමින් ඉන්නා බව ළමුන්ට ඈත තියාම දැක ගන්නට ලැබුණා.

"නෙයිලර් කියන හිරකාරයත් මේ දෙන්නගෙම ජාතියේ එක් කෙනෙක් වෙන්න ඇති." ජූලියන් කිව්වා.

ඔහු අනෙක් ළමුන් දෙසට හැරුණා.

"මේ අහන්න....!" ජූලියන් කිව්වා. "අපි දැන් මෙතනින් එළියට යමු. ඔයාලා හයියෙන් කතා කර කර විනෝදයෙන් ඉන්න බව එයාලට පෙන්නන්න ඕනේ. අපි මෙහේ මොකද කරන්නේ කියලා ඒ දෙන්නා ඇහුවොත් මොකක්ද කියන්න ඕනේ කියලා දන්නව නේ... 'අපි විනෝදෙට





ඇවිදින්න ආවා.' එච්චරයි. අපි කාටවත් කරදරයක් නැති අහිංසක ළමයි රංචුවක් බව එයාලට හැඟවෙන්න අරින්න ඕනේ. ඒ දෙන්නා අපෙන් අනවශ්‍ය ප්‍රශ්න අහන්න පටන් ගත්තොත් මම ඒවට උත්තර දෙන්නම්. එහෙමනම් හරි නේ...!"

හැමෝම හිස සොළවා ඊට එකඟ වුණා. ජූලියන් මුලින්ම පඳුර ළඟින් මෑත් වී එළිමහනට ගියා. ඔහු මහා හඬින් කෑ ගසා අනෙක් ළමුන්ට කතා කළා.

"හේයි...! මේ බලන්න කෝ...! මේ පරණ ගේ හොඳටම විනාශ වෙලා ගිහින් තියෙන හැටි. දැන් තමයි ඒක හොඳටම පේන්නේ."

ජෝර්ජ් සහ ටිමී සතුටින් උඩ පනිමින් ජූලියන් සිටි තැනට දිව ආවා. ඈන් ඔවුන්ට පිටුපසින් ආවා. ඒත් ඇගේ හදවත 'ඩිග් - ඩිග්' ගා ගැහෙන්නට පටන් ගත්තා. ඩික් ඇයවත් ඉදිරියට තල්ලු කරමින් ගමන් කළා.

ළමුන්ව දැක මැගී, කිළුටු ඩික් දෙදෙනා තිගැස්සී ගොස් මග නැවතුණා. එකා පසුපසින් එකා බැගින් ඒ දෙසට එන ළමුන් පිරිස දෙස ඔවුන් නොරිස්සුම් සහගතව බලා සිටියා.

මැගී කිළුටු ඩික් දෙසට හැරී යමක් කිව්වා. කිළුටු ඩික් ළමුන් දෙස රවා බැලුවා. ළමුන් ඔවුන් සිටි තැනට ගමන් කළේ එකිනෙකා සමග විහිළු තහළු කර ගනිමින්, කලින් කතා කර ගත් පරිදිම විනෝදයෙන් ඉන්න බව පෙන්වමිනුයි.

මැගී ළමුන් දෙසට හැරී තරමක් තදින් කතා කළා.

"කවුද ඔය ළමයි...? මෙහේ මොකද කරන්නේ...?" ඇය ඇසුවා.

"නිකමට වගේ ඇවිදින්න ආවා." ජූලියන් එතැන නතර වෙමින් කිව්වා. "මේ දවස්වල අපිට ඉස්කෝලේ නිවාඩු නේ."

"ඉතින් මෙහාට ආවේ මොකටද?" මැගී ඇසුවා. "මේක පෞද්ගලික දේපළක් නේ...!"

"ඔහ්...! නෑ." ජූලියන් කිව්වා. "මෙතන ඉස්සර ගොවිපලක් තිබුණා. දැන් ඒක අතහැරලා දාලා ගිහින් නේ. ඉතින් දැන් මේ පළාතම පොඩ්ඩ දේපළක් වෙලා...! ඕනෙ කෙනෙකුට එන්න පුළුවන්. අපි ආවේ මේ අමුතු කළු පාට වතුර තියෙන විල බලන්න. ඒක හරිම ලස්සනයි නේ...!"

මැගී සහ කිළුටු ඩික් මුහුණින් මුහුණ බලා ගත්තා. ළමුන් විල අද්දර ගැවසෙනවාට ඔවුන් දෙදෙනා කොහෙත්ම කැමති නැති බව ඔවුන්ගේ ඉරියව් වලින්ම පෙනුණා. මැගී නැවතත් කතා කරන්නට පටන් ගත්තා.

"ඔය ළමයි මේ විල අවට ඉන්න එපා...!" ඇය කිව්වා. "මේ විල හරිම භයානකයි. මිනිස්සුන්ට මේ විලට එන්න තහනම් කරලයි තියෙන්නේ...! නාන්නත් තහනම්...! බෝට්ටු පදින්නත් තහනම්...!"

"අපිට නම් කවුරුවත් එහෙම කතාවක් කිව්වෙ නෑ." ජූලියන් පුදුම වූ බව පෙන්වමින් කිව්වා. "මග දී හම්බ වුණු අය හැමෝම අපිට කිව්වේ මේ විල හරිම ලස්සන අපූරු තැනක් කියලා විතරයි. මෙහාට එන්න පාර කිව්ව අයත් කිව්වේ එහෙම තමයි. මෙහේ තහනම් කලාපයක් නෙමෙයි. කවුරු හරි ඔය දෙන්නට බොරුවක් කියලා වෙන්න ඇති එහෙනම්...!"

"දැක්කද විලේ දියකාවෝ පීනන හැටි. බලන්න හරිම ලස්සනයි...!" ඈන් එකවරම විල දෙස බලමින් කිව්වා. "අපි සොබා දහමට හරිම කැමතියි...!"

"මේ හරියේ මුවොත් ඉන්නවලු නේද?" ජෝර්ජ් කිව්වා.

"අපි ඊයේ මෙහාට එනකොට මුවෝ දැක්කා." ඩික් කිව්වා. "ඔයගොල්ලොත් දැක්කද?"

ළමුන් සියලු දෙනාම තොරතෝංචියක් නැතිව කතා කරන්නට පටන් ගත්තා. ඒත් සමගම මැගී, කිළුටු ඩික් දෙදෙනාට හොඳටම කේන්ති ගියා.

"ඇති...! ඇති...! ඔය පිස්සු කතා වලින් අපිට වැඩක් නෑ." කිළුටු





ඩික් තරහින් කිව්වා. "මෙහාට මිනිස්සුන්ට එන්න තහනම්. මෙහෙන් පිට වෙලා ගියොත් හොඳයි."

"මිනිස්සුන්ට මෙහාට එන්න තහනම් නම් ඇයි ඔය දෙන්නා මෙහාට ආවේ...?" ජූලියන් ඇහුවා. "අපිට ඔය විදිහට කතා කරන්න එපා...!"

"මම සැරයක් කිව්ව නේ...! මෙහෙන් පිටවෙලා යනවා...!" කිළුටු ඩික් තරහින් කෑ ගැහුවා.

ඔහු ළමුන් ඉදිරියට අඩි කිහිපයක් ඇවිද ආවා. ජෝර්ජ් ටිමීගේ කරපටිය අත හැරියා...!

ටිමී කිළුටු ඩික් දෙසට අඩි කිහිපයක් ගමන් කළා. ඉන්පසුව රුදුරු හඬින් ගොරවන්නට පටන් ගත්තා. කිළුටු ඩික් සිටි තැනම නතර වී ටිමී දෙස බියෙන් බලා සිටියා.

"ඔය බල්ලව අල්ල ගත්තොත් හොඳයි....!" ඔහු ජෝර්ජ්ට කිව්වා.

"මම නම් ආපහු එයාව අල්ල ගන්නෙ නෑ." ජෝර්ජ් කිව්වා. "ඒ ගැන නම් හිතන්නවත් එපා."

ටිමී ගොරවමින්, දත් විළිස්සමින් කිළුටු ඩික් දෙසට තවත් ටිකක් ළං වුණා.

"හරි...! හරි...! ඔය ළමයි ඒ ගැන කරදර වෙන්න ඕනෙ නෑ." මැගී කිව්වා. "මගේ යාළුවට ටිකක් තරහා ගියා. එච්චරයි. ඔය ළමයින්ගේ බල්ලව අහකට ගන්න."

"එහෙම එකපාරටම කරන්න බෑ..!" ජෝර්ජ් කිව්වා. "ඔයගොල්ලෝ කොච්චර කල් මෙහේ නැවතිලා ඉන්නවද?"

"ඒකෙන් ඔය ළමයින්ට වැඩක් නෑ නේ...?" කිළුටු ඩික් තරහින් කිව්වා.

ඒත් සමගම ටිමී තවත් තදින් ගොරවන්නට පටන් ගත්තා...!

කිළුටු ඩික් අඩි කිහිපයක් ආපස්සට පැනුවා...!

ජුලියන් අනෙක් ළමුන්ට කතා කළා.

"අපි මෙතනින් යමු." ඔහු කිව්වා. "ගිහින් දවල් කෑම කමු. අනිත් මිනිස්සුන්ට වගේම අපිටත් මෙහේ ඉන්න අයිතිය තියෙනවා...! අපි මේ ගොල්ලෝ ගැන කරදර වෙන්න ඕනේ නෑ. අපි අපේ පාඩුවේ පැත්තකට වෙලා ඉඳිමු."

ළමුන් සතර දෙනා නටඹුන් වී ඇති ගොවි ගෙදර දෙසට ගමන් කළා. ටිමී කිළුටු ඩික් දෙස හැරී බලා කිහිප වරක් බිරුවා. ඉන්පසුව ආපසු හැරී ළමුන් පසුපස එන්නට පටන් ගත්තා.

"ටිමී, දොර ළඟ මුර කරන්න." ජෝර්ජ් ටිමීට කිව්වා.

ළමුන් මුළුතැන්ගෙයි පොළොව යට ගබඩා කාමරයේ තිබූ ඔවුන්ගේ සුපුරුදු නවාතැනට ඇතුළු වුණා. කිළුටු ඩික් සහ මැගී එතැනට ඇතුළු වී තිබෙන බවට සලකුණක් තිබේ දෝ කියා ඔවුන් විපරම් කර බැලුවා. ඒත් එවැන්නක් පෙනෙන්නට තිබුණේ නෑ.

"ඒ දෙන්නා අපේ පොළොව යට නවාතැන දකින්න නැතුව ඇති." ජුලියන් කිව්වා. "මැගී, කිළුටු ඩික් ජෝඩුව මට නම් ජේන්න බෑ...!"

"ඒක ඇත්ත." ඩික් කිව්වා. "මට නම් මැගී තමයි එපාම කරපු එක්කෙනා."

"මටත් කිළුටු ඩික්ගේ හැටි දැක්කම එපා වෙනවා." ඈන් කිව්වා. "එයා කොණ්ඩේ කපලා, පීරලා, පිළිවෙළකට ඉන්නෙ නැත්තේ මොකද දන්නෙ නෑ."

"ඒ එයා ඉන්න කැමති විදිහ වෙන්න ඇති." ජෝර්ජ් කිව්වා. "නැත්නම් එයා ටාසන් වගේ වනගත පරම්පරාවකින් පැවතගෙන එන කෙනෙක්ද දන්නෙ නෑ. හොඳ වෙලාවට ටිමී හිටියේ...!"

"ඒක ඇත්ත." ඈන් කිව්වා. "ටිමීටත් ඒ දෙන්නව පෙන්නන්න බෑ. ටිමී ඉන්න නිසා ඒ දෙන්නා මේ පැත්තට එන එකක් නෑ."





"ඒ දෙන්නා මොකද කරන්නේ කියලා මම ටිකක් බලලා එන්නම්." ඩික් කිව්වා.

ඩික් පියගැට කිහිපය ඉහළට නැග ළමුන් සිටි කාමරයෙන් පිට වී ගියා. ටික වේලාවකින් ඔහු ආපසු ආවා.

"මම දැක්කා ඒ දෙන්නා බෝට්ටු මඩුව පැත්තට යනවා." ඩික් කිව්වා. "දඟකාර ජේන්ව හොයන්න යන්න ඇති."

"අපි මෙතන වාඩි වෙලා ඒ ගැන කතා කරන ගමන්ම කෑම කමු." ජුලියන් කිව්වා. "දැන් අපි කල්පනා කරන්න ඕනේ, ඊළඟට මොකක්ද කරන්නේ කියලා. අනිත් වැදගත්ම කාරණේ මේකයි.... අර දෙන්නා ඊළඟට මොනවා කරයිද කියලත් අපි කල්පනාවෙන් බලාගෙන ඉන්න ඕනේ."

"අර කඩදාසි කෑල්ලේ ඇඳලා තියෙන රූප සටහන අපිට වඩා හොඳට ඒ දෙන්නට තේරෙනවා ඇති. එයාලා කරන දේවල් ගැන අපි දිගටම ඇහැ ගහගෙන හිටියොත් අපිටත් හෝඩුවාවක් හොයා ගන්න පුළුවන් වෙයි."

"ඒක ඇත්ත." ඩික් කිව්වා. "රහස් පණිවිඩේ වචන දෙක තුනක් තේරුම් ගත්තා වගේම ඉතුරු ටිකත් කොහොම හරි තේරුම් කර ගන්න ඕනේ."

"අපි තව ටික වෙලාවකින් අර පාරුවත් අරගෙන විලේ රවුමක් යමු." ජුලියන් කිව්වා. "ඒකෙන් අර දෙන්නට කරදරයක් නෑ නේ. ඒ යන ගමන් අපිට විලේ ඉවුර වටේ දඟකාර ජේන් හැංගිලා ඉන්නවද කියලත් හොඳට බලන්න පුළුවන්...! මැගී, කිළුටු ඩික් දෙන්නත් බෝට්ටුවක් අරගෙන විලට ආවොත් එයාලා කරන්නේ මොනවද කියලත් අපිට හෙමීට බලාගෙන ඉන්න පුළුවන්...!"

"ඒක හොඳයි." ජෝර්ජ් කිව්වා. "අද කාලගුණයත් හොඳයි. විලේ පාරු පදින්න කියාපු දවස...!"

"ජෝර්ජ්, මට ඔය ඔය කේක් කෑල්ලක් දෙන්න. ඕවා ටිමීට ඉතුරු කරන එකේ තේරුමක් නෑ." ඩික් කිව්වා.

"එහෙම නෑ...! ටිමී කේක්වලටත් කැමතියි...!" ජෝර්ජ් කිව්වා.

"මේ තරම් රස කේක් එකක් ටිමීට දුන්නට වැඩක් නෑ." ඩික් කිව්වා. "එයා ඒක රස බලන්නෙවත් නැතුව ගිලලා දානවා. ටිමීට පාන් දුන්නම ඇති. එයාට පානුයි, කේකුයි අතර වෙනස තේරෙන්නෙ නෑ...!"

"ඈන්, තව කෑම ඉතුරු වෙලා තියෙනවද?" ඩික් කේක් කෑබැල්ලක් කමින්ම ඈන්ගෙන් ඇසුවා.

"ගොඩක් තියෙනවා." ඈන් කිව්වා. "චොකලට් ටිකකුත් තියෙනවා."

"ඒක හොඳයි." ඩික් කිව්වා. "ජෝර්ජ් චොකලට් වලට හරිම කෑදරයි නේ...!"

"එතකොට ඔයා....? ඔයත් එහෙම නේ." ජෝර්ජ් කිව්වා.

"ඔය ඇති....!" ජූලියන් කිව්වා. "ඔය දොඩම් බීම බෝතලෙන් ටිකක් මේ ජෝගුවට දාන්න. මම ටිමීටත් කෑම දීලා එන්නම්. එයා අද වලියේ මුර නේ."

ළමුන් කෑම ගෙන අවසන් වී ටික වේලාවකට පසුව බෝට්ටු මඩුව දෙසට යන්නට පිටත් වුණා.

"අන්න...! අර දෙන්නා බෝට්ටු මඩුවේ තිබුණු බෝට්ටු වලින් එකකුත් අරන් විල මැදට ගිහින්." ජූලියන් කිව්වා. "පදින්න පුළුවන් බෝට්ටු එකයි තිබුණේ. ඒක අරන් යන්න ඇති. අනිත් දෙකේම අඩිය හිල් වෙලයි තිබුණේ."

"කිළුටු ඩික් වේගයෙන් බෝට්ටුව පදිනවා. මං හිතන්නේ දාගකාර ජේන්ව හොයන්න යනවා ඇති." ජෝර්ජ් කිව්වා.

විලේ ජල තලය මතින් ඈතට ඇදෙන බෝට්ටුව දෙස ළමුන් ටික වේලාවක් බලා සිටියා.

'මේ දෙන්නා අපිට කලින් ඉස්සර වුණොත් අපේ මහන්සිය වතුරේ.' ඩික් තනිවම කල්පනා කළා. 'කොහොම හරි ඒ දෙන්නට කලින් මේක





විසඳගන්න ඕනේ.'

"යමු...!" ජූලියන් කිව්වා. "අපි ඒ දෙන්නා ගැන ඇහැ ගහගෙන ඉන්න නම් දැන්මම පහුරත් අරගෙන පිටත් වෙන්න වෙනවා. නැත්නම් අපිට මග ඇරිලා එයාලගේ බෝට්ටුව ඈතට ගිහින් තියෙයි."

ළමුන් ඉක්මනින්ම බෝට්ටු මඩුවට ගොස් පහුර බිමට බා ගත්තා. ජූලියන්, ඩික් දෙදෙනා එය දෙපසින් අල්ලා ඔසවාගෙන ඇවිත් දිය පහර මත තැබුවා. ප්ලාස්ටික් වලින් තනා තිබූ නිසා එය සැහැල්ලු ලෙස ඔසවා ගන්නට හැකි වුණා. ඒත් එහි හතර දෙනෙකුට ගමන් කරන්නට තරම් ඉඩ තිබුණා.

"ඉක්මන් කරලා නගින්න...!" ජූලියන් කිව්වා.

# පහුරේ නැග යමින්..... 16

ජූලියන් පළමුවෙන්ම පහුරට නැග්ගා. අනෙක් අය නගින තුරු ඔහු එය නොසෙල්වී තබා ගත්තා. ඈන් සහ ජෝර්ජ් ජූලියන්ට පිටුපසින් වාඩි වුණා. ඩික් අන්තිමටම පහුරට ගොඩ වුණා.

ටිමී පුදුමයෙන් මෙන් මේ අමුතු යාත්‍රාව දෙස බලාගෙන සිටියා...! නිතර බෝට්ටුවේ ගොස් තිබුණත් ටිමී මීට පෙර කවදාවත් පහුරක් දැක තිබුණේ නෑ.

"ටිමී, මේකත් බෝට්ටුවක් වගේ තමයි." ජෝර්ජ් කිව්වා. "බය නැතුව නගින්න."

ටිමී එකවරම පහුරට පැන ගත්තා...! පහුර ගැස්සී ගියා...! ඈන් දියට පෙරළෙන්නේ නැතිව බේරුණේ යන්තමින්. ජූලියන් අපහසුවෙන් නමුත් පහුර හසුරුවා ගන්නට සමත් වුණා.

"ඔහ්...! ටිමී, දඟලන්නෙ නැතුව ඉන්න." ඈන් කිව්වා. "මේ පහුරේ බෝට්ටුවේ තරම් ඉඩ නෑ. පහුර පුරාම ඇවිදින්නෙ නැතුව එක තැනක වාඩි වෙලා ඉන්න."

ප්ලාස්ටික් වලින් තනා තිබූ ඒ සැහැල්ලු පහුර සිහින් දිග එකක්. එහි එකා පසුපස එකා බැගින් සතර දෙනෙකුට වාඩි වී සිටින්නට ඉඩකඩ තිබුණා. සෑම අයෙකුටම පහුර පදින්නට පැඩලය බැගින් ආසන ඉදිරියෙන් සවි කර තිබුණා.





ජූලියන් දිය පහර දිගේ පහුර විල දෙසට පැද යන්නට පටන් ගත්තා.

"ඔන්න අපි යනවා....!" ඔහු සතුටින් කිව්වා. "මම කියන කල් ඔයාලා කවුරුවත් පැඩල් කරන්න එපා...! විලට යනකල් මම විතරක් පහුර පැද්දම ඇති."

ළමුන් එක පෙළට පහුරේ වාඩි වී සිටියා. ටිමී පහුර මත සිටගෙන සිටියා. වරක් ටිමී එක් කකුලක් පහුරින් පිටතට දමා යන්තමින් සීතල ජලයේ ගාවා බැලුවා. ඉන්පසුව පහුර මත දිගාවී නාසය ජලයේ ගෑවෙන නොගෑවෙන තරමට පහතට නැඹුරු කරගෙන ජල තලය දෙස බලා සිටින්නට වුණා...!

ජූලියන් පහුර විල දෙසට පැදෙව්වා. කිළුටු ඩික් සහ මැගී විල මැද සෑහෙන දුරක් ඈතින් බෝට්ටුවේ ගමන් කරන සැටි ඔවුන්ට දැක ගන්නට ලැබුණා.

"අන්න ඉන්නවා...!" ජූලියන් අනෙක් ළමුන්ට ඔවුන් දෙදෙනාව පෙන්වමින් කිව්වා. "එයාලා වේගයෙන් බෝට්ටුව පැදගෙන ඈතට යනවා. අපි ඒ පස්සෙන් යමුද? සමහරවිට දඟකාර ජේන් කොහෙද කියලා එයාලා දන්නව ඇති...!"

"ඔව්...! අපි ඒ පස්සෙන් යමු." ඩික් කිව්වා. "අපිත් දැන් පැඩල් කරන්නද? අපි ඉක්මන් කළේ නැත්නම් ඒ දෙන්නව මග හැරෙන්න පුළුවන්."

ළමුන් සියලු දෙනාම එකවර වේගයෙන් පැඩල සියල්ලම පාගන්නට පටන් ගත්තා...! පහුර ජල තලය මත එකම තැන ඒ මේ අත කැරකුණා...!

"හේයි...! ඕක නවත්තන්න...!" ජූලියන් කලබලයෙන් කෑ ගැසුවා. "අපි එක එක්කෙනා පැඩල් කරන්නේ එක එක විදිහට. එහෙම බෑ...! අපි තාලෙකට එකම විදිහකට පැඩල් කරන්න ඕනේ. ඈන්, ඔයා මගෙත් එක්කම වම් පැත්තෙන් පැඩල් කරන්න පටන් ගන්න. ඩික්, ජෝර්ජ්, ඔයාලා දෙන්නා එකම සැරේට දකුණු පැත්තෙන් පැඩල් කරන්න පටන්

ගන්න. නැත්නම් පහුර ඉස්සරහට යන්නෙ නැතුව එක තැනම කැරකෙනවා. තේරුණාද?"

"ඔන්න එහෙනම්" ඩික් කිව්වා. "එකයි...! දෙකයි...! තුනයි...! හරි...! පටන් ගනිමු....!"

ළමුන් තාලයකට පැඩල පාගමින් පහුර පදින්නට පටන් ගත්තා. එය ළමුන් කලින් සිතා සිටියාටත් වඩා වේගයෙන් විලේ නිසල ජල තලය මත සුව පහසු ලෙස ඉදිරියට ඇදුණා...! එය ළමුන්ට විනෝදජනක කාර්යයක් වුණා...!

"අන්න...! අර දෙන්නා විල මැද බෝට්ටුව නවත්තගෙන ඉන්නවා." ජෝර්ජ් හදිසියේම කිව්වා. "ඒ දෙන්නා මොකක් හරි බලනවා. ඔයාලට පේනවද? සමහරවිට ඒ දෙන්නට හම්බ වුණු රහස් පණිවිඩේ තියෙන කඩදාසි කෑල්ල බලනව වෙන්න ඇති."

ළමුන් පහුර මදකට නවත්වා තරමක් ඈතින් තිබූ බෝට්ටුව දෙස බලා සිටියා. මැගී, කිළුටු ඩික් දෙදෙනා බෝට්ටුව මත වාඩි වී යමක් පිරික්සා බලමින් සිටියා. ඒත් ඒ කුමක්දැයි කියා හරියටම දැක ගන්නට ළමුන්ට පුළුවන් වුණේ නෑ. ඔවුන් සිටියේ බෝට්ටුවට සෑහෙන දුරින්.

"අපි තව ටිකක් ළං වෙලා බලමු." ජූලියන් කිව්වා. "අපි එයාලගේ ළඟට ගියාම ඒ දෙන්නට ටිකක් තරහ යයි. ඒත් ඒකට කරන්න දෙයක් නෑ...!"

ළමුන් ආපසු පහුර පැද යන්නට පටන් ගත්තා. මැගී, කිළුටු ඩික් දෙදෙනා සිටි බෝට්ටුව අසලට ළමුන්ගේ පහුර ළං වන විට ටිමී එකවරම මහා හඬින් බුරන්නට පටන් ගත්තා...!

මැගී, කිළුටු ඩික් දෙදෙනාම තිගැස්සී ගොස් වටපිට බැලුවා...! ළමුන්ගේ පහුර බෝට්ටුව ළඟටම ඇවිත් බව දැක ඔවුන් දෙදෙනා කලබලයට පත් වුණා. ඔවුන් ළමුන් දෙස බලා සිටියේ තරහින් පුපුරමින්...!

"හලෝ...!" ඩික් අත වනමින් කෑ ගැසුවා. "අපි පහුරත් අරන් රවුමක් ආවා. මේක නම් නියමයි...! කොහොමද ඔයගොල්ලන්ගේ බෝට්ටුව...! හොඳද...?"





මැගී තරහින් රතු වී ගියා...!

"අවසර නැතුව පහුර අරගෙන ඔය ළමයි කරලා තියෙන්නේ වැරදි වැඩක්...!" මැගී කෑ ගසා කිව්වා.

"එතකොට ඔයාලා බෝට්ටුව අරගත්තෙ කාගෙන් අවසර අරන්ද?" ජූලියන් කෑ ගසා ඇසුවා. "අපිට ඒක කියන්න කෝ...! එතකොට අපිත් ගිහින් මේ පහුර පදින්න අවසර අරන් එන්නම්."

ජෝර්ජ් ජූලියන්ගේ කතාවට මහා හඬින් සිනාසුණා. මැගී තරහින් ජූලියන් දෙස රවා බැලුවා. කිට්ටු ඩික්ට කොතරම් කේන්ති ගොස් තිබුණා දැයි කිවහොත් අත තිබූ හබලෙන් ළමුන්ට දමා ගසන්නට තරම් ඔහුට සිත් වුණා...!

"මෙතනින් ඈතට වෙලා ඉන්නවලා...!" කිළුටු ඩික් හබල දිගු කරමින් ළමුන්ට කෑ ගැසුවා. "අපි කැමති නෑ, ළමයි ඇවිත් අපේ නිදහසට බාධා කරනවට...!"

"අපි කැමතියි, ඔයාලත් එක්ක හිතවත් වෙන්න....!" ඩික් කෑ ගසා කිව්වා.

ජෝර්ජ් නැවතත් මහ හඬින් සිනාසුණා...!

මැගී කිළුටු ඩික් දෙසට හැරී සෙමින් යමක් කිව්වා. ඉන්පසුව කිළුටු ඩික් එකවරම වේගයෙන් බෝට්ටුව ඈතට පැද යන්නට පටන් ගත්තා.

"හරි...! අපිත් පස්සෙන් යමු...!" ජූලියන් පහුර පදවමින් කිව්වා. "සමහරවිට එයාලා කරන්න හදන දේ ගැන අපිට හෝඩුවාවක් හොයා ගන්න පුළුවන් වෙයි."

ඒත් සිදු වූයේ වෙනත් දෙයක්...! කිළුටු ඩික් විලේ බටහිර ඉවුර දෙසට වේගයෙන් බෝට්ටුව පැදෙව්වා. ළමුන් හැකි තරම් වෙර යොදා ඔහුගේ බෝට්ටුව පසුපස පහුර පැදගෙන ගියා.

කිළුටු ඩික් නැවත වරක් ඔහුගේ බෝට්ටුව විල මැදට පැද ආවා.

ආවා. ඒත් ළමුන් විල ළමුන් ඒ පසුපසින් ආපසු පහුර පදවාගෙන ආවා. ඒත් ළමුන් විල මැදට ළං වනවාත් සමගම ඔහු විලේ අනෙක් පැත්තට බෝට්ටුව පදවාගෙන යන්නට පටන් ගත්තා...! ළමුන් එවරත් ඔහු පසුපස පන්නා ගියා...!

කිළුටු ඩික්, මැගී දෙන්නාගේ බෝට්ටුව ආපසු විලේ මැද දෙසට ගමන් කරන්නට පටන් ගත්තා. එවර නම් ළමුන් ඒ පසුපස යන්නට උත්සාහ කළේ නෑ. ඒ වන විට ළමුන් හොඳටම වෙහෙසට පත් වී සිටියා...!

"අපි විලේ ඉන්නකල් ඒ දෙන්නා දඟකාර ජේන්ව හොයන එකක් නෑ." ජූලියන් කිව්වා. "අපරාදේ අපි නිකරුණේ මහන්සි වුණා. එයාලට ඕනෙ වුණේ අපිව මහන්සි කරලා අපිට පාඩමක් උගන්වන්න. අපිත් ඒ පාඩම ඉගෙන ගත්තා...!"

"මට නම් දැන් හොඳටම මහන්සියි...!" ඩික් කිව්වා.

"මටත්....!" ජෝර්ජ් කිව්වා.

"මගේ කකුල් දෙක හොඳටම රිදෙනවා." ඈන් කිව්වා.

ළමුන් සතර දෙනා ටික වේලාවක් එතැනම නැවතී විවේක ගත්තා. මේ අතර මැගී, කිළුටු ඩික් දෙදෙනා ගමන් කළ බෝට්ටුව විල ඉවුර දෙසට ඇදී ගියා. ඔවුන් ආපසු විල මැදට එන බවක් පෙනුණේ නෑ.

"එයාලා යන්නේ බෝට්ටු මඩුව පැත්තට....!" ජූලියන් ඈත බලමින් කිව්වා. "අපිත් දැන් ආපහු ගොඩට යමු. දැන් හොඳටම හවස් වෙලා. ඉර බහින්නත් ළඟයි."

"ඔව්, අපි ආපහු යමු." ජෝර්ජ් කිව්වා. "ටිම්, දඟලන්නෙ නැතුව ඉන්න. ආපහු සැරයක් මගේ කකුල් දෙක උඩට නැග්ගොත් මම ඔයාව වතුරට තල්ලු කරලා දානවා ඔන්න...!"

එකවරම 'ජබොක්...!' හඬක් ඇසුණා. ළමුන් ඒ කුමක්දැයි බැලුවා. ටිම් පහුරෙන් ජලයට පැන සතුටින් ඒ මේ අත පිහිනමින් සිටියා.

"අන්න...! ටිම්ව තල්ලු කරන්න ඕනෙ නෑ. එයාටම හිතිලා වතුරට





පැනලා...!" ඩික් සිනාසෙමින් කිව්වා.

"ඔයා තමයි ටිම්ව වතුරට තල්ලු කළේ...!" ජෝර්ජ් කිව්වා.

"මම තල්ලු කළේ නෑ...!" ඩික් කීව්වා. "එයාට හිතිලා පනින්න ඇති. ටිම්ගෙ කරේ ලණුවක් බැඳලා පහුර ගැට ගැහුවා නම් අපිට ලේසියෙන්ම ගොඩබිමට යන්න තිබුණා...!"

ජෝර්ජ් ඩික්ට පයින් ඇන්නා.

"ටිම්ට ආයේ මොනවා හරි කිව්වොත් මම ඔයාවත් වතුරට තල්ලු කරලා දානවා." ජෝර්ජ් කිව්වා.

"හරි...! පුළුවන් නම් තල්ලු කරමු බලන්න." ඩික් කිව්වා. "මම ඊට කලින් ඔයාව වතුරට දානවා...!"

ජෝර්ජ් ඩික්ගේ අභියෝගය බාර ගත්තා...! පහුර දිය මත ඒ මේ අත වැනෙන්නට පටන් ගත්තා...! ජූලියන් කෑ ගැසුවා...!

"ඕක නවත්වන්න....!" ඔහු කිව්වා. "දැන් ඇති...!"

ළමුන් විල් ඉවුර දෙසට ආපසු පහුර පැද යන්නට පටන් ගත්තා. ටිම් වහා පිහිනා ඇවිත් පහුරට පැන ගත්තා. ඉන්පසුව ළමුන්ව ජලයෙන් නැහැවී යන සේ සිරුර ගසා දැම්මා...!

ඈන් ඇගේ සිරුර පුරා විසිරුණු ජල බින්දු පිස දමමින් පහුරේ පැඩලය පාගන්නට පටන් ගත්තා.

සැන්දෑ හිරු එළිය වැටී විලේ අඳුරු නිසල ජල තලය රිදී පැහැයෙන් දිළිසෙමින් තිබුණා. දියකාවුන් කිහිප දෙනෙක් ළමුන්ගේ පාරුව අසලින්ම පිහිනා ගියා.

විල ඉවුරේ ඇති ගස්වල පිළිබිඹුව නිසල විල් ජලය මත වැටී ඇති අයුරුත්, සිතිජය තෙක් ඈතට විහිදී ඇති වනාන්තරය සහ කඳු මුදුන් සැඳෑ හිරු එළියෙන් නැහැවී ඇති අයුරුත් නරඹමින් ඈන් සතුටින් ගමන් කරමින් සිටියා.

එකවරම අපූරු යමක් ඇගේ ඇසට හසු වුණා...! ඒ විලේ බටහිර

ඉවුරේ ගස් අතරින් ඈතින් ඉහළට මතු වී පෙනෙන, තරමක උස් ගල් කණුවක්...!

"අර බලන්න...!" ඈන් එය අනෙක් ළමුන්ට පෙන්නුවා. "අර පේන්නේ ගල් කණුවක් නේද..? ඒක මොකක්ද?"

ළමුන් ඇය පෙන්වූ දිශාවට හැරී බැලුවා.

"කොහෙද...?" ජූලියන් ඇසුවා. "ආ...! ඔව්මයි. ගල් කණුවක්...! සමහරවිට රජ කාලේ මිනිස්සුන්ට ගම්වර දෙනකොට සීමාව ලකුණු කරන්න හිටවපු එකක් වෙන්න ඇති."

"ඒක සෑහෙන්න උස ගල් කණුවක්...!" ඩික් කිව්වා. "ගස් අතරින් දුරට පේනවා."

"ගල් කණුවක්...!" ඈන් සෙමින් කිව්වා.

ඇය ටික වේලාවක් කල්පනා කළා.

"ගල් කණුවක්...! ඔහ්...! ඔයාලට මතකද, ඩික්ට හම්බවුණු රහස් පණිවිඩේ...! ඒ කඩදාසි කෑල්ලේ ලියලා තිබුණු වචනවලින් එකක් තමයි 'ගල් කණුව...!'"

"ඔව්මයි...!" ඩික් සතුටින් කිව්වා. "ගල් කණුව...!"

පහුර කෙටි දුරක් ඉදිරියට ගමන් කළ විට දී ගල් කණුව ළමුන්ගේ දසුනින් ඈත්ව නොපෙනී ගියා.

"ගල් කණුව...!" ජූලියන් කිව්වා. "ඒක ඈන් අහම්බෙන් හරි දැකපු එක කොච්චර දෙයක්ද? දැන් අපි බලන්න ඕනේ හෙයිලර් හංගලා තියෙන වස්තුව හොයා ගන්න මේ ගල් කණුව උදව් වෙන්නේ කොහොමද කියලා...!"

"හෙයිලර් හොරකම් කරපු දේවල් ටික ගල් කණුව යට වළලලා තියෙනවද දන්නෙ නෑ." ජෝර්ජ් කිව්වා.

"වෙන්න බෑ...!" ජූලියන් කිව්වා. "ඒක හංගලා තියෙන තැන තමයි කඩදාසි කෑල්ලේ මැද තිතකින් සලකුණු කරලා තිබුණේ. ගල්





කණුව කියන්නේ එතන හරියටම හොයා ගන්න උදව් වෙන බිම් සලකුණක් විතරයි."

"දැන් අපි ඉක්මනට ගොඩබිමට යන්න ඕනේ." ජූලියන් නැවතත් කිව්වා. "කළුවරත් වැටීගෙන එනවා. ඊට කලින් පහුර පදිමු...! ඉක්මන් කරමු...!"

# එකට එක.....

## 17

ළමුන් විලේ ඉවුර වෙත ළඟා වන විට අඳුර වැටෙමින් තිබුණා. කිළුටු ඩික්, මැගී දෙන්නාගේ බෝට්ටුව බෝට්ටු මඩුව අසල කණුවක ගැට ගසා තිබුණා.

"එයාලා දෙන්නා මේ වෙලාවේ මොනවා කරනවද දන්නෙ නෑ." ජූලියන් කිව්වා. "අපි මේ පහුර එයාලට පේන්නේ නැති වෙන්න පඳුරු අස්සේ හොඳ තැනක් බලලා හංගමු...!"

"ඒක හොඳ අදහසක්...!" ඩික් කිව්වා. "අපි විලට එන එක එයාලට කරදරයක් නිසා එයාලා අපේ පහුර විනාශ කරලා දාන්න වුණත් ඉඩ තියෙනවා."

ළමුන් විල අද්දර වැවී තිබුණු පඳුරු අතරට පහුර ඇද දැම්මා. එය එතැන අපූරුවට සැඟවී තිබුණා.

ඉන්පසුව ඔවුන් කිළුටු ඩික් සහ මැගී පෙනෙන්නට ඉන්නවාදැයි විපරම් කර බලමින් නටබුන් වූ ගොවි ගෙදර තිබෙන තැනට ගමන් කළා. ටිමී ඉදිරියෙන්ම ගමන් කරමින් සිටියා. ඒත් කිළුටු ඩික් සහ මැගී පෙනෙන්නට සිටියේ නෑ.

ටිමී පියගැට කිහිපය බැස ඔවුන්ගේ සුපුරුදු නවාතැන වූ





පොළොව යට තිබූ ගබඩා කාමරයට ඇතුළු වුණා. ළමුන් ඒ පිටුපසින් එමින් සිටියා.

ඒත් හදිසියේම ටිමී සිහින් හඬින් ගොරවන්නට පටන් ගත්තා...!

"මං හිතන්නේ, කිළුටු ඩික් සහ මැගී දෙන්නා මෙහාට ඇවිත් ගිහින් තියෙනවා." ජෝර්ජ් කිව්වා. "ටිමීට එයාලගේ ඉව දැනිලා. ඒ නිසයි ගොරවන්නේ."

ජූලියන් කාමරය පුරා විදුලි පන්දම එල්ල කර පිරික්සා බැලුවා. ඔවුන්ගේ ඇතිරිලි සහ පොරෝනා, පිඟන්, කෝප්ප සියල්ලම කලින් තිබූ විදිහටම තිබුණා. වෙනසක් පෙනෙන්නට තිබුණේ නෑ.

ඒත් ටිමී බිම තැනින් තැන ඉව කරමින් සෙමින් ගොරවමින් කාමරය පුරා ඒ මේ අත ඇවිදිමින් සිටියා.

"අර දෙන්නා මෙහාට ඇවිත් ගිය බව ටිමීට ඉවෙන් දැනිලා." ඩික් කිව්වා. "ටිමී ඉන්නේ තරහින්...!"

ළමුන් රාත්‍රී ආහාරය ගන්නට සූදානම් වුණා. ජූලියන් කාමරයේ බිත්ති අල්මාරිය ඇරියා.

"ඔහ්...! විනාසයි...!" ඔහු කිව්වා. "මේ බලන්න..! අපේ කෑම සේරම අර දෙන්නා හොරෙන් අරන් ගිහින්..! තිරිසන්නු...! කවුද හිතුවේ මේ මිනිස්සු ඔය වගේ පහත් වැඩක් කරයි කියලා...!"

"එයාලා දන්නවා කෑම නැතුව අපිට මෙහේ නැවතිලා ඉන්න බැරි බව." ඩික් කිව්වා. "අපිව මෙහෙන් එළවගන්න ලේසිම ක්‍රමය තමයි අපේ කෑම ටික හොරෙන් අරන් යන එක. දැන් හොඳටම කළුවර වැටිලා. ටිබ්ලිස් ගමට ගිහින් කෑම අරන් එන්න වෙලාවක් නෑ. හෙට උදේ තමයි යන්න වෙන්නේ."

"හෙට උදේ අපි ගිහින් කෑම අරන් එනකොට කිළුටු ඩික්, මැගී දෙන්නා අපි නැති අතරේ එයාලගේ වැඩේ කරගෙන මෙහෙන් පිට වෙලා ගිහින් ඉඳියි." ජෝර්ජ් කිව්වා.

ළමුන් සියලු දෙනාම බලාපොරොත්තු සුන් වී ගොස් කණගාටුවෙන්

කල්පනා කරන්නට පටන් ගත්තා. ඔවුන් සිටියේ බඩගින්නෙන්, මහන්සියෙන්. ඒ වගේම සිදු වී ඇති දේ ගැන තරහින්.

ඈත් නිදා ගන්නට සූදානම් වුණා.

"මගේ ළඟ චොකලට් කෑල්ලක්වත් නෑ." ඇය දුකින් කිව්වා. "ටිමීටත් බඩගිනි ඇති...!"

"මැගී, කිළුටු ඩික් දෙන්නා මේ වෙලාවේ මොකද කරන්නේ කියලා බලන්න ඕනේ." ජූලියන් තරහින් කිව්වා. "මම එයාලට හොඳ දෙකක් කියලා එන්නම්."

ටිමී 'වූෆ්...!' කියා ජූලියන්ගේ කතාව අනුමත කළා...!

ජූලියන් පියගැට කිහිපය ඉහළට නැග කාමරයෙන් පිට වී ගියේ හොඳටම තරහින්. ටිමී ඔහු පසුපසින් ආවා.

කිළුටු ඩික් සහ මැගී විල අද්දර ගසක් යට එළිමහන් බිමක පුංචි හකුලන කූඩාරම් දෙකක් ගසාගෙන තිබුණා. ජූලියන් ඒ දෙසට ගමන් කළා.

ජූලියන් කූඩාරම් දෙකටම එබී බැලුවා. ඒත් කිළුටු ඩික්වත් මැගීවත් පෙනෙන්නට සිටියේ නෑ. ඔවුන්ගේ බඩු මුට්ටු පමණක් කූඩාරම් තුළ අසුරා තිබුණා.

ජූලියන් වටපිට ඇවිදිමින් ඔවුන් දෙදෙනාව සෙව්වා. විල අද්දර තරමක් ඈතින් දිරා ගිය ලී කොටයක් මත වාඩි වී කිළුටු ඩික් සහ මැගී දෙදෙනා කතා බහ කරමින් සිටින බව ජූලියන් දැක්කේ ටික වේලාවකට පසුවයි. ජූලියන් ආපසු ඔවුන්ගේ නවාතැනට ආවා.

"ඒ දෙන්නා කූඩාරම් දෙකක් ගහගෙන...!" ජූලියන් අනෙක් ළමුන්ට කිව්වා. "මම යද්දී කූඩාරම්වල හිටියේ නෑ. විල ඉවුරේ තැනක වාඩි වෙලා ඉන්නවා මම දැක්කා."

"ටිමී කෝ...?" ජෝර්ජ් ඇසුවා. "ජූලියන්, එයත් ඔයාගේ පස්සෙන් ගියා නේ...!"





ඒත් සමගම ටිමී එන හඬ ඇසුණා.

"ඔය එන්නේ...!" ජූලියන් කිව්වා.

ටිමී පියගැට කිහිපය බැස කාමරයට ඇතුළු වුණා. ටිමී යමක් කටෙහි රඳවාගෙන සිටින බව ළමුන් දැක්කා.

"ඔහ්...! ටිමී මොනවද ඔය කටින් අරගෙන එන්නේ...?" ජෝර්ජ් පුදුමයෙන් ඇසුවා.

ටිමී කටින් ඔසවාගෙන ආ කුමක් හෝ පාර්සලයක් ජෝර්ජ්ගේ උකුල මතට දැම්මා. ජෝර්ජ් පුදුමයෙන් ටිමී දෙස බලමින් ඒ පාර්සලය අතට ගත්තා.

"ඔහ්...! මේකේ තියෙන්නේ පාන්...! කොහෙන්ද මේක ටිමීට හම්බවුණේ...!" ජෝර්ජ් ඇසුවා.

සිදුවී ඇති දෙය ජූලියන්ට සැණෙකින් තේරුම් ගියා...! ජූලියන් සිනාසෙන්නට පටන් ගත්තා.

"ටිමී ඕක අරගෙන එන්න ඇත්තේ, මැගී, කිළුටු ඩික් දෙන්නගේ කූඩාරමකින්...!" ඔහු කිව්වා. "කූඩාරම ඇතුළේ එයාලගෙ බඩු මුට්ටු තියෙනවා මම දැක්කා. මං හිතන්නේ ටිමී එතනින් පාන් පාර්සලයක් අරගෙන එන්න ඇති, ටිමී නම් හරිම අපූරු වැඩ තමයි කරන්නේ. එයාලා අපේ කෑම ගත්තා. දැන් ටිමී එයාලගේ කෑම අරන් එනවා. එකට එක...!"

"හොරකමක් නෙමෙයි. හුවමාරුවක් නේ...!" ඩික් සිනාසෙමින් කිව්වා. "අන්න...! ටිමී ආයෙත් සැරයක් යනවා...!"

ටිමී පිට වී ගොස් ටික වේලාවකින් ආපසු ආවා. එවර ටිමී රැගෙන ආවේ තරමක විශාල කඩදාසි මල්ලක්. ළමුන් එය දිග හැර බලා මහා හඬින් සිනාසෙන්නට පටන් ගත්තා. එහි තිබුණේ ලොකුම ලොකු කේක් ගෙඩියක්...!

එතෙක් වේලා දුකින් බලා සිටි ළමුන් දැන් සතුටට පත් වී සිටින බව ටිමීට තේරුණා. ඉතින් ටිමී තවත් වරක් කාමරයෙන් පිට වී ගියේ

හරිම සතුටින්. එවර ටිමී රැගෙන ආවේ ලොකු චීස් කුට්ටියක්...!

"ටිමී, ඔයා නම් හරිම ෂෝක් වැඩ තමයි කරන්නේ...!" ඈන් එය අතට ගනිමින් කිව්වා. "මං හිතුවේ හෙට උදේ වෙනකල්ම අපිට බඩගින්නේ ඉන්න වෙයි කියලා. දැන් අපි මේ චීස් එක්ක පාන් කමු...!"

ඈන් චීස් කුට්ටිය ඔතා තිබූ කඩදාසිය ගලවා දමන්නට පටන් ගත්තා.

"හේයි...! ටිමී, දැන් ඔය ගෙනාවා ඇති. ආපහු යන්න එපා...!" ජූලියන් කිව්වා.

ඒත් ඒ වන විටත් ටිමී එතැනින් පිට වී ගොස් තිබුණා. ටිමී එවර රැගෙන ආවේ පිසින ලද මස් පාර්සලයක්...! ටිමී එය පරිස්සමින් ගෙනැවිත් ළමුන් සිටි තැනින් තබා වලිගය වනමින් ඔවුන් දෙස බලා සිටියා...!

"පුදුමයි...! ටිමීට මේවා අරගෙන එන ගමන් ටිකක් කාලා බලන්න හිතුණේ නැති එක ගැන මට හරිම පුදුමයි...!" ඩික් කිව්වා. "ටිමී...! බලාගෙන ගියාම ඔයා මට වඩා හොඳයි නේ. මම මේ වගේ බඩගින්නේ ඉන්න වෙලාවක කෑම අරන් ආවා නම් අතරමග දී ටිකක් හරි කාලා බලනවා ම යි."

"දැන් අපි ටිමීගේ වැඩේ නතර කරමු...!" ජූලියන් කිව්වා. "අපේ කලින් තිබුණු කෑම වලටත් වැඩිය දැන් එයා කිළුටු ඩික්, මැගී දෙන්නාගෙන් කෑම අරන් ඇවිත් තියෙනවා."

ටිමී ඊළඟ වතාවටත් යන්නට හැරුණා.

"මේ වතාවෙත් ගිහින් ආවට පස්සේ නවත්තමු." ජෝර්ජ් සිනාසෙමින් කිව්වා. "බලමුකෝ මේ සැරේ මොනවද එයා ගේන්නේ කියලා...?"

ටිමී කඩදාසිවලින් ඔතා තිබුණු තවත් ලොකු පාර්සලයක් කටින් රැගෙන ආවා. ජෝර්ජ් එය දිග හැර බැලුවා.

"ගෙදර හදපු බනිස් වගයක්...!" ඈය කිව්වා. "ටිමී, ඔයා හරිම...





හරිම... දක්ෂයි...! ඒත්.... දැන් මේ ගෙනාපු දේවල් හොඳටම ඇති. ආපහු කිසිම දෙයක් ගේන්න එපා. දැන් මෙතනින් වාඩි වෙලා අපිත් එක්ක කෑම කමු."

ටිමී ජෝර්ජ්ට කීකරු වුණා. ළමුන් කෑම කන්නට පටන් ගත්තා. ටිමීත් ඔවුන්ට එකතු වී ගෙනා කෑම වල රස බැලුවා.

" මේ ඉතුරු කෑම අපි තව දවසකට දෙකකට ඇති." ඈන් කෑම කා අවසානයේ කිව්වා.

ඈය ජූලියන් සමග එක් වී ගරා වැටුණු මුළුතැන්ගෙයි මුල්ලක තිබූ වතුර පොම්පයෙන් වතුර බඳුනක් පුරවා ගත්තා. ටිමීත් වතුර බීගෙන බීගෙන යන්නට පටන් ගත්තා.

මේ අතර කිළුටු ඩික් අඳුරේම ළමුන් සිටි තැනට එමින් සිටින බව දකින්නට ලැබුණා.

"අපේ කූඩාරමෙන් මොනව හරි මෙහාට අරන් ආවද?" ඔහු ඈත තියාම කෑ ගසා ඇසුවා.

"අපෙන් ඔහේලා අරන් ගිය දේවල් වලට වඩා වැඩි දෙයක් අරන් ආවෙ නෑ...!" ජූලියන් ඔහුට කෑ ගසා පිළිතුරු දුන්නා. "ඒක හුවමාරුවක් විතරයි...!"

"කාගෙන් අහලද අපේ කූඩාරම් වලට රිංගුවේ...?" කිළුටු ඩික් තරහින් කෑ ගැසුවා.

"අපි රිංගුවේ නෑ...! අපේ බල්ලා තමයි රිංගලා අරගෙන ආවේ...!" ජූලියන් කිව්වා. "ඔතනින් මෙහාට ආවොත් මම අපේ බල්ලව උසි ගන්නනවා. මතක තියාගත්තොත් හොඳයි...! අද රෑට එහෙම ආයේ මේ පැත්තට එන්න එපා...! අපේ බල්ලා හරිම සැරයි...!"

"ගර්....ර්...ර්...ර්...ර්...ර්...!"

ටිමී බිහිසුණු හඬින් ගොරවන්නට පටන් ගත්තා.

කිළුටු ඩික් තවත් යමක් නොකියාම වහා ආපසු හැරී ඔවුන්ගේ

කුඩාරම දෙසට ගමන් කළා.

ළමුන් ආපසු පියගැට කිහිපය බැස පහළින් පිහිටි කාමරය වෙත ගියා. විම් පියගැට පෙළ පාමුල, කාමරයට ඇතුළු වන දොරටුව ඉදිරිපිට බිම වැතිරුණා.

"එයාට රෑට එතන නිදා ගන්න දෙමු." ජූලියන් කිව්වා. "මට කිව්වු ඩික්, මැගී දෙන්නව පොඩ්ඩක්වත් විශ්වාස නෑ."

"දැන් අපි අර කඩදාසි කෑල්ලේ ලියලා තියෙන අනිත් වචන ටිකේ තේරුම හොයා ගන්න බලමුද?" ඈන් තවත් ඉටිපන්දමක් දල්වමින් කිව්වා. "ගල් කණුව අපි දැනටමත් හොයා ගෙන නේ තියෙන්නේ."

"ඔව්. මේ රේඛා හතරෙන් එක රේඛාවක් අග 'ගල් කණුව' කියලා ලියලා තියෙනවා." ජූලියන් කඩදාසි කැබැල්ල මේසය මත දිග හරිමින් කිව්වා. "විරුද්ධ පැත්තෙන් ලියලා තියෙන්නේ 'කඳු මුදුන' කියලා. අපි බලමු සිතියමේ කන්දක් සලකුණු කරලා තියෙනවද කියලා."

ළමුන් සිතියම දිග හැර බැලුවා. ඈන් සිතියමේ එක් තැනකට ඇඟිල්ල තබමින් සතුටින් අනෙක් අය දෙස බැලුවා.

"මේ බලන්න...! කළුදිය විලට නැගෙනහිර පැත්තෙන් කන්දක් තියෙනවා...!" ඇය කිව්වා. "ගල් කණුව තිබුණේ බටහිර පැත්තෙන්...!"

"මේ අහන්න...!" ඩික් එකවරම කිව්වා. "මම දන්නවා ඔය සැලැස්මෙන් කියවෙන රහස මොකක්ද කියලා...? ඒක හරිම ලේසි දෙයක්...!"

අනෙක් ළමුන් ඩික් දෙස පුදුමයෙන් බලා සිටියා.

"එහෙනම් කියන්න බලන්න." ජූලියන් කිව්වා.



# රහස සොයා ගැනෙයි..... 18

"ඔන්න එහෙනම් අහගන්න." ඩික් කිව්වා. "අපි දැන් මහ ගස් දෙකයි කළුදිය විලයි හොයා ගත්තා. තව හොයා ගන්න ඉතුරු වෙලා තියෙන්නේ දඟකාර ජේන්ව විතරයි නේ...! දඟකාර ජේන් - ඒ බෝට්ටුව තියෙනව ඇත්තේ කළුදිය විල මැද කොහේ හරි තැනක වෙන්න ඕනේ...! මට හිතෙන විදිහට නෙයිලර් හොරකම් කරපු වටිනා වස්තුව හංගලා ඇත්තේ ඒ බෝට්ටුවේ...!"

"'මැගී දන්නවා' රහස් පණිවිඩයේ තිබුණේ එහෙමයි. ඒ කියන්නේ අපිට හම්බ වුණු කඩදාසි කෑල්ලේ ඇඳලා තියෙන රූප සටහනේ තේරුම මැගී හරියටම දන්නවා...!"

එසේ කියමින් ඩික් කඩදාසි කැබැල්ල අතට ගත්තා.

"මේ බලන්න....!" ඔහු කිව්වා. "විලේ බටහිර පැත්තෙන් ගල් කණුවක් තියෙනවා අපි අද හවස දැක්කා. ඒක මේ කඩදාසියේ සටහන් කරලා තියෙනවා. සිතියමේ හැටියට ඒකට විරුද්ධ පැත්තෙන්, ඒ කියන්නේ විලේ නැගෙනහිර පැත්තෙන් කන්දකුත් තියෙනවා. මේ කඳු මුදුන කියලා සටහන් කරලා තියෙන්නේ ඒ කන්දේ මුදුනට වෙන්න ඕනේ. එතකොට අනිත් දෙපැත්තෙන් චිමිනියකුයි, මුදුන් කොතකුයි තියෙන්න ඕනේ...!"

"මේකෙන් කියන්නේ... 'විලේ මැද එක තැනක් තියෙනවා, හතර

පැත්තෙන් තියෙන ගල් කණුවයි, කඳු මුදුනයි, වම්හියයි, මුදුන් කොතයි එතෙන්ට එක සැරේටම පේනවා.' අන්න එතන තමයි වස්තුව හංගලා තියෙන තැන...!"

අනෙක් ළමුන් ටික වේලාවක් ඩික් දෙස පුදුමයෙන් බලා සිටියා. ජූලියන් සතුටින් ඩික්ගේ පිටට පහරක් ගැසුවා...!

"ෂහ්...! හියමයි...!" ජූලියන් කිව්වා. "විලේ ඔය කියන තැන අපි ඊයේ දවසම හොයන්න මහන්සි වුණු දඟකාර ජේන් - බෝට්ටුව තියෙනවා ඇති. අපි හෙට උදේම ගිහින් ඒක හොයමු."

"ඔව්...! හොයන්න නම් ඕනේ තමයි. ඒත් අමතක කරන්න එපා...! කිළුටු ඩික්, මැගී දෙන්නා මේකේ තේරුම හරියටම දන්නවා." ඩික් කිව්වා. "අවස්ථාවක් ලැබුණු ගමන්ම එයාලා අපිට කලින් ඒක හොයා ගනීවි. ඒ දෙන්නා බෝට්ටුවේ හංගලා තියෙන වටිනා වස්තුව අර ගත්තොත් අපිට කරන්න දෙයක් නෑ. මේ ළඟ පාතක පොලීසියක්වත් නෑ. මැගී, කිළුටු ඩික් දෙන්නා ඒවත් අරන් අඳුරුවට මෙහෙන් පැනලා යාවි."

ළමුන් සියලු දෙනාම නොඉවසිල්ලට පත් වී කළ යුත්තේ කුමක්දැයි කල්පනා කරන්නට පටන් ගත්තා.

"හෙට අපි පුළුවන් තරම් උදෙන් නැඟිටලා මේක හොයා ගන්න පිටත් වෙන්න ඕනේ." ජූලියන් කිව්වා. "යන්තම් එළිය වැටීගෙන එනකොටම විලට යන්න ඕනේ. නැත්නම් මැගී, කිළුටු ඩික් දෙන්නා අපිට කලින් එතෙන්ට යාවි. ෂහ්...! අපිට එලාම් ඔරලෝසුවක් තිබුණා නම්...!"

"අපි පහුර විල මැදට පැදගෙන ගිහින්, ඈන් ගල් කණුව දැකපු හරියට යමු." ඩික් කිව්වා. "චුට්ටක් එහාට මෙහාට පැදලා කඳු මුදුනකුයි, චිම්නයකුයි, මුදුන් කොතකුයි පේනවද කියලා ඊළඟට බලමු."

"හෙයිලර් හොරකම් කරපු වස්තුව හංගලා තියෙන්නෙ හරිම දක්ෂ විදිහට." ඈන් කිව්වා. "මට නම් හිතා ගන්නවත් බෑ...!"

"කතා කර කර හිටියා ඇති." ජූලියන් කිව්වා. "හෙට උදෙන්ම නැඟිටින්න ඕනෙ නිසා දැන් වේලාසනින්ම නිදා ගනිමු."





ළමුන් නිදා ගන්නට සූදානම් වුණා. ටිමී කාමරයට බසින පියගැට පෙළ පාමුල වැතිරී නිදා ගත්තා. මහන්සි වී සිටි නිසා ළමුන්ට ඉක්මනින්ම නින්ද ගියා. ඒත් ටිමී නම් නිදා ගත්තේ ඉඳහිට ඇසෙන සිහින් හඬක් ගැන වුවත් අවධානයෙන්.

පසුවදා උදයෙන්ම ජූලියන් නින්දෙන් අවදි වුණේ ටිමී ඇවිත් ඇඟට පැන ඔහුගේ නින්දට බාධා කළ නිසයි.

ජූලියන් අවදි වී අත් ඔරලෝසුවට විදුලි පන්දම අල්ලා වේලාව බැලුවා.

"ඔහ්...! උදේ හතත් වෙලා...! ඩික්, ඉක්මනට නැඟිටින්න...!" ඔහු කලබලයෙන් කිව්වා.

ඩික් අවදි වී වටපිට බලා ජෝර්ජ්, ඈන් දෙදෙනාවත් අවදි කළා. ළමුන් කලබලයෙන් දත් මැද මුහුණ සෝදා ගමනට ලෑස්ති වුණා. කෑම ස්වල්පයක් පමණක් යන්තමින් ගිල දමා ඉක්මනින්ම පහුර තිබෙන තැනට යන්නට පිටත් වුණා.

අතරමග දී ඔවුන් මැගී සහ කිළුටු ඩික්ගේ කූඩාරම් දෙස බැලුවා. ඔවුන් දෙදෙනා තවමත් අවදි වී නැති බව පෙනෙන්නට තිබුණා.

"නියමයි...!" ජූලියන් සතුටින් කිව්වා. "අපි එයාලට කලින් වැඩ පටන් අරගෙන...!"

ඔවුන් පඳුරු අතර සඟවා තිබූ පහුර පිටතට ගෙන විල දෙසට පදින්නට පටන් ගත්තා. හැමෝම සිටියේ හරිම නොඉවසිල්ලකින්. ටිමීත් කලබල වී සිටියා. ටිමීටත් ළමුන්ගේ නොඉවසිලිමත් බව දැනී තිබුණා.

"ඈන්...! ගල් කණුව පේනවද බලන්න." ජූලියන් විල මැදට පහුර පදිමින් කිව්වා.

ළමුන් විල මැද ඒ මේ අත පහුර පදිමින් ගල් කණුව පෙනෙන්නට තිබෙනවා දැයි කියා බැලුවා. ඔවුන්ට එය ඇසට හසු කර ගන්නට සෑහෙන වේලාවක් ගත වුණා.

ඩික් එකවරම සතුටින් කෑ ගැසුවා...!

"අන්න...! ඒක එකපාරටම පෙනුණා...!" ඩික් කිව්වා. "අපි ඉස්සරට ආව ගමන්ම ඒක ගස් වලින් වැහිලා ගියා. දැන් පේන්නෙ නෑ. ආපහු පහුර ටිකක් පිටිපස්සට ගහමු...! හරි... හරි... දැන් ඇති. අන්න...! ඒ සැරේ පේනවා...!"

"එහෙනම් හරි...!" ජූලියන් කිව්වා. "පහුර හෙළවෙන්නේ නැතුව තියා ගනිමු. මම දිගටම ගල් කණුව දිහා බලාගෙන ඉන්නම්. ඩික්, ඔයා දකුණු අත පැත්තෙන් කඳු මුදුනක් පේනවද කියලා බලන්න. පේන්නෙ නැත්නම් අඩි දෙක තුනක් පහුර එහාට මෙහාට පදවලා බලන්න. ඒ අතරේ ගල් කණුව නොපෙනී ගියොත් මම කියන්නම්."

"හරි...!" ඩික් කිව්වා.

ඔහු ටික දුරක් පහුර විල මත එහා මෙහා ගෙන ගියා. එවිට ඔහුට පහසුවෙන්ම කඳු මුදුන දැක ගන්නට පුළුවන් වුණා.

"අහුවුණා...!" ඩික් සතුටින් කිව්වා. "අර පේන්නේ ඒ කඳු මුදුන වෙන්න ඕනේ. මගේ දකුණු අත පැත්තෙන්. ජූලියන් තවම ඔයාට ඔය පැත්තෙන් ගල් කණුව පේනවා නේද..?"

"ඔව්...!" ජූලියන් කිව්වා. "ඩික්...! ඔයා දිගටම කඳු මුදුන දිහා ඇහැ ගහගෙන ඉන්න. ජෝර්ජ්...! පහුර පොඩ්ඩක් එහාට මෙහාට පැදගෙන ගිහින් කොතක් වගේ දෙයක් ඉස්සරහින් පේනවද කියලා බලන්න."

"මට දැන්මම ඒක පේනවා...!" ජෝර්ජ් සතුටින් කිව්වා.

ජූලියන්, ඩික් දෙදෙනා කඳු මුදුනෙනුත් ගල් කණුවෙනුත් මොහොතකට ඇස් ඉවතට ගෙන ජෝර්ජ් පෙන්වූ දිශාවට හැරී බැලුවා.

පහුරට ඉදිරි දිශාවෙන් විල වටා වැවී ඇති ඝන වනාන්තරය අතරින් දේවස්ථානයක මුදුන් කොතක් දිස් වුණා...! එය හිරු රැස් වැටී සුදු පැහැයෙන් බැබළුණා.

"අපිට රීයේ ඇහුණේ ඒ පල්ලියේ සීනුව වෙන්න ඕනේ." ඈන් කිව්වා.





ජූලියන් ගල් කණුව දෙසත්, ඩික් කඳු මුදුන දෙසත්, ජෝර්ජ් මුදුන් කොත දෙසත් බලා සිටින්නට වුණා.

"ඈන්...! දැන් ඔයාගෙ වාරේ...!" ජූලියන් ගල් කණුව දෙස බලා ගත් වන ම කිව්වා. "අපිට පිටිපස්සෙන් චිමිනියක් පේනවද බලන්න...! ගස් අතරින් ඈතින් පේනවද කියලා හොඳට බලන්න...!"

"තවම නම් නෑ...!" ඈන් කිව්වා. "ජෝර්ජ්, තව ටිකක් පහුර වම් පැත්තට පදින්න. තව ටිකක්...! ආ...! තව ටිකක්... හරි...! හරි...! දැන් ඇති. මට චිමිනියක් පේනවා...! ඒක ඈත තියෙන ගොවි ගෙදරක චිමිනියක් වෙන්න ඕනේ. පහුර ඔහොම නවත්ත ගන්න...!"

ළමුන් පහුර එතැනම නවතා ගත්තා. ඒත් ඒ වන විට ජෝර්ජ්ගේ මුදුන් කොත නොපෙනී ගොස් තිබුණා...!

අන්තිමේදී කෙසේ හෝ සලකුණු හතරම එකවර පෙනෙන තැනට පහුර ගෙන එන්නට ළමුන්ට හැකි වුණා. විලේ නිසල ජල තලය මත පහුර පහසුවෙන්ම එක තැන රඳවා තබා ගන්නට පුළුවන් වීම ළමුන්ගේ සතුටට කරුණක් වුණා.

"මෙතන හරියටම සලකුණු කර ගන්න ක්‍රමයක් මට කල්පනා වුණා." ජූලියන් කිව්වා. "ජෝර්ජ්, ටික වෙලාවකට මුදුන් කොත ගැන බලන ගමන්ම මගේ ගල් කණුව ගැනත් බලන්න ඔයාට පුළුවන්ද? මට පොඩි වැඩක් කරන්න තියෙනවා."

"බලන්නම්...!" ජෝර්ජ් කිව්වා.

ඇය ඉදිරියෙන් පෙනෙන මුදුන් කොතත්, වම් පසින් පෙනෙන ගල් කණුවත් දෙස මාරුවෙන් මාරුවට බලමින් සිටියා.

මේ අතර ජූලියන් අපූරු වැඩක් කරන්නට පටන් ගත්තා. ඔහු සාක්කුවේ තිබුණු නූල් පන්දුව ගෙන නූලෙහි එක් කෙළවරක අත තිබූ විදුලි පන්දමත්, සාක්කු පිහියත් එකට තබා ගැට ගැසුවා.

"ඈන්, මට ඔයාගෙ කොණ්ඩේ ගහලා තියෙන පුංචි කොණ්ඩ බෝලයක් දෙනවද?" ඔහු ඈන්ගෙන් ඇසුවා.

ඇය ඉන් එකක් ගලවා ජූලියන් අතට දුන්නා. ඒ අතර චිම්නිය දෙසින් මොහොතකටවත් ඇස් ඉවතට ගන්නේ නැතිව බලා සිටින්නටත් ඇය වග බලා ගත්තා.

ජූලියන් නූල කෙළවර ගැට ගැසූ විදුලි පන්දමත්, සාක්කු පිහියත් පතුරෙන් පිටතට දැම්මා. ඉන්පසුව එය විලේ පතුලෙහි ගැටෙන තුරුම ටිකෙන් ටික පහත් කළා.

අන්තිමේදී බරැති විදුලි පන්දමත්, සාක්කු පිහියත් විලේ පතුලෙහිම ගැටී නතර වුණා. විල එතරම් ගැඹුරු නැති බව ජූලියන්ට තේරුණා. ඒත් ජලය අඳුරු පැහැයෙන් යුක්ත වූ නිසා එහි පතුළ පැහැදිලිව පෙනුණේ නෑ.

ජූලියන් නූලේ ඉහළ කෙළවරට ඈන්ගෙන් ඉල්ලා ගත් කොණ්ඩා බෝලය ගැට ගසා එය වතුරට දැම්මා. සැහැල්ලු කොණ්ඩා බෝලය එක තැනම පාවෙමින් ජල තලය මත රැඳී තිබුණා.

"ඒ වැඩේ හරි...!" ජූලියන් සතුටින් කිව්වා. "දැන් ඔය සලකුණු වලින් ඇස් අහකට ගන්නට කමක් නෑ. මම තැන හරියටම සලකුණු කර ගත්තා. දැන් අපිට ඒක මග හැරෙන්නෙ නෑ."

අනෙක් ළමුන් සියලු දෙනාම ජූලියන් දෙස බැලුවේ ඉන්පසුවයි. ජූලියන් ඔහු කළ දෙය අනෙක් ළමුන්ට විස්තර කළා. ළමුන් ඔහුගේ කතාව අසමින් ජල තලය මත පාවෙන සැහැල්ලු කොණ්ඩා බෝලය දෙස සතුටින් බලා සිටියා.

"නියමයි...!" ඩික් ඒ දෙස බලමින් කිව්වා. "ඒත්... අපි ඈතට ගිහින් ආපහු සැරයක් ආවොත් අපිට මේ පුංචි කොණ්ඩ බෝලේ හොයා ගන්න අමාරු වෙයි. අපි තව මොකක් හරි වතුරේ පාවෙන දෙයක් මේකටම තියලා ගැට ගහමුද..?"

"මගේ ළඟ එහෙම දෙයක් නෑ නේ...!" ජූලියන් කිව්වා. "ඔයා ළඟ තියෙනවද..?"

"මගේ ළඟ තියෙනවා...!" ජෝර්ජ් කිව්වා.

ඇය පුංචි ප්ලාස්ටික් පෙට්ටියක් ජූලියන් අතට දුන්නා. ඒ ඇය





ඇවිදින්නට යන විට රසකැවිලි දමාගෙන යන පෙට්ටිය බව අනෙක් ළමුන් දැන සිටියා.

ජූලියන් එය කොණ්ඩා බෝලය සමගම එකට තබා නූලේ ඉහළ කෙළවරෙන් ගැට ගැසුවා. නූලේ පහළ කෙළවර විල් පතුලේ ගිලී තිබූ විදුලි පන්දමේත්, සාක්කු පිහියේත් ගැට ගසා ඇති නිසා කොණ්ඩා බෝලයත්, ප්ලාස්ටික් පෙට්ටියත් විල් ජලය මත හොසෙල්වී එක තැන පාවෙමින් තිබුණා.

"ආ...! දැන් මේක හොයා ගන්න ලේසියි." ජූලියන් කිව්වා. "අපිට හම්බ වුණු කඩදාසි කෑල්ලේ ඇඳලා තියෙන සැලැස්ම හරි නම් දඟකාර ජේන් ගිලිලා ඉන්නව ඇත්තේ හරියටම මෙතන තමයි...!"

ළමුන් සියලු දෙනාම පහළට නැමී විල් පතුළ නරඹන්නට උත්සාහ කළා. ඒ වන විට හිරු එළිය තදින් වැටී තිබුණු නිසා විලේ පතුළ තරමක් එළිය වී පැහැදිලිව පෙනෙන්නට තිබුණා.

විල් පතුලේ තිබූ අඳුරු ඡායාවක් යන්තමින් ඔවුන්ගේ ඇස ගැටුණා...! එය හරියටම පැහැදිලිව පෙනුණේ නැති වුණත් එය බෝට්ටුවක හැඩයට සමාන බව ඔවුන්ට වැටහුණා:

"දඟකාර ජේන්....!" ජූලියන් සතුටින් කිව්වා. "නෙයිලර් හොරකම් කරපු වටිනා වස්තුවත් පටවගෙන 'දඟකාර ජේන්' බෝට්ටුව පැදගෙන විල මැදට එන්න ඇති...! ඊට පස්සේ... ගල් කණුව, කඳු මුදුන, මුදුන් කොත, චිම්නිය හතර පැත්තෙන්ම ජේන තැනට ඇවිත් ඒ වස්තුවත් එක්කම බෝට්ටුව ගිලෙන්න අරින්න ඇති. එහෙම කරලා විලෙන් එගොඩට පීනලා යන්න ඇති...!"

"බලාගෙන ගියාම නෙයිලර් හරිම දක්ෂයෙක් නේ...!" ඩික් කිව්වා. "ඒක නෙමෙයි ජූලියන්, දැන් අපි මේ බෝට්ටුව ගොඩ ගන්නේ කොහොමද...?"

"මට හිතා ගන්නවත් බෑ...!" ජූලියන් කිව්වා. "මාත් ඒ ගැන මෙච්චර වෙලා හිතලා තිබුණේ නෑ...!"

මේ අතර ටිමී හදිසියේම ගොරවන්නට පටන් ගත්තා...! ඒ ඇයි දැයි කියා ළමුන් වටපිට බැලුවා. මැගී සහ කිච්චු ඩික් දෙදෙනාගේ

බෝට්ටුව එතැන ආසන්නයටම පැමිණ සිටින බව ළමුන් දැක්කේ එවිටයි...!

ඔවුන් දෙදෙනා කඩදාසි කෑබැල්ල අතේ තබාගෙන ළමුන් කළාක් මෙන්ම ගල් කණුව, කඳු මුදුන ආදී සලකුණු පෙනෙන්නේ කොතැනටදැයි බලමින් විල මත බෝට්ටුව ඒ මේ අත පදවමින් සිටින බව ළමුන්ට පෙනුණා.

"එයාලා කරන්නෙත් අපි කරපු වැඩේම තමයි." ජූලියන් කිව්වා. "ඒ දෙන්නා කීයටවත් හිතන එකක් නෑ, එයාලා හොයන දේ අපි කලින් හොයාගෙන ඉන්නේ කියලා...! හැබැයි, ඒ දෙන්නා සලකුණු හතර හොයාගෙන තව ටිකකින් එන්නේ මෙතෙන්ටමයි."

"එයාලට ඕනෙ කරන තැන හොයාගෙන බලනකොට හරියටම අපිත් ඒ උඩම අපේ පහුර නවත්තගෙන ඉන්නවා දැක්කම ඒ දෙන්නට හොඳටම කේන්ති යාවි....!"



# ජූලියන්ගේ උපාය..... 19

මැගී සහ කිළුටු ඩික් ඈතින් පෙනෙන ගල් කණුව, කඳු මුදුන ආදී සලකුණු දෙස බලාගත් වනම බෝට්ටුව ටිකෙන් ටික ළමුන් සිටි දෙසට පැද එන්නට පටන් ගත්තා. ඔවුන්ගේ අවධානය බිම් සලකුණු දෙසටම යොමු වී තිබුණු නිසා ළමුන්ගේ පහුර ඔවුන්ගේ ඇසට හසු වුණේ නෑ.

බෝට්ටුව පහුරට ආසන්න වන තුරු ළමුන් නිහඬවම ඒ දෙස බලා සිටියා. ජෝර්ජ් ටිමීගේ කරපටියෙන් අල්ලාගෙන ටිමීට සද්ද නැතිව ඉන්නට කියා සංඥා කළා.

බෝට්ටුව ටිකෙන් ටික ළමුන්ගේ පහුර අසලටම ළං වුණා. මැගී වරින් වර එහාටත්, මෙහාටත්, පිටුපසටත් හැරී බලමින් ගල් කණුව, කඳු මුදුන, චිමිනිය යන සලකුණු තුනම එක වර දැක ගන්නට උත්සාහ කළා. ඒ අතරම බෝට්ටුව වමට, දකුණට, ඉදිරියට, පිටුපසට හරවන ලෙස වරින් වර කිළුටු ඩික්ට නියෝග කළා. ඇයට තනිවම ඒ කාර්ය කරන්නට අපහසු බව පෙනුණා. ඒත් කිළුටු ඩික්ගෙන් ඇයට සැලකිය යුතු තරම් සහයෝගයක් ලැබුණේත් නෑ.

ඒ මේ අත හැරෙමින් සෑහෙන වේලාවක් ගත කර වෙහෙස වී සිටි නිසාත්, කිළුටු ඩික් විටෙක උවමනා පමණටත් වඩා බෝට්ටුව එහා මෙහා පැදවූ විට ඇයට පෙනෙන්නට තිබූ බිම් සලකුණු පවා ආපසු මග හැරී ගිය නිසාත් මැගී කිළුටු ඩික් සමග තරමක් කේන්තියෙන්

සිටියා. මැගී නියෝග කරන කරන වෙලාවට ඒ පැත්තට, මේ පැත්තට, ආයෙත් අනිත් පැත්තට ආදී වශයෙන් කිහිප වරක්ම බෝට්ටුව එහා මෙහා පැදවීමෙන් වෙහෙසට පත් වී සිටි කිළුටු ඩික් සිටියේත් මැගී සමග කේන්තියෙනුයි.

මැගීගේ නියෝගය අනුව කිළුටු ඩික් බෝට්ටුව ටික දුරක් පිටුපසට පැදෙව්වා. මැගී තුන් පැත්තකින්ම තිබෙන බිම් සලකුණු මාරුවෙන් මාරුවට නරඹමින් ඒවා මග හැරෙන්නේ නැතිව සතර වැනි සලකුණ හඳුනා ගන්නට දුෂ්කර උත්සාහයක් ගනිමින් සිටියා...!

ටිකෙන් ටික පසුපසට ආ ඔවුන්ගේ බෝට්ටුව එකවරම ළමුන්ගේ පහුරේ හැපී ගියා...! ඒත් සමගම ටිමී කලබල වී මහා හඬින් බුරන්නට පටන් ගත්තා...!

මැගී සහ කිළුටු ඩික් තිගැස්සී ගොස් වටපිට බැලුවා...! ළමුන් පහුරේ නැගී විලට ඇවිත් සිටින බව ඔවුන් දැක්කේ එවිටයි. ඒත් සමගම මැගී මෙතෙක් වේලා වෙහෙස මහන්සියෙන් ඇස ගසාගෙන සිටි බිම් සලකුණු සියල්ල ඇගේ දසුනින් ඉවත්වී ගියා...!

මැගී සහ කිළුටු ඩික් ළමුන් දෙස බලා සිටියේ ඉහ වහා ගිය කේන්තියෙන්...! බෝට්ටුව හැපීමත් සමගම පහුර සෙලවී ගොස් ඈන් වතුරට ඇද වැටෙන්නට ගිය නිසා ළමුන්ටත් තරමක් කේන්ති ගියා...!

"හේයි...! මොනවද මේ කරන්නේ...?" ජූලියන් කෑ ගැසුවා. "මේ විලේ මෙච්චර ඉඩ තියෙද්දී අපේ පහුරේ හැප්පෙන්නෙ නැතුව බෝට්ටුව පදින්න බැරිද?"

"ඔය පහුර අපේ පාරෙන් අහකට ගන්නවලා...!" කිළුටු ඩික් කෑ ගැසුවා.

"මේ විලේ වෙන ඉඩ නැතුව ද...?" ජූලියන් ආපසු ඔහුට කෑ ගසා කිව්වා. "අපි අපේ පාඩුවේ ඉන්නැද්දී ඇවිත් ඇගේ හැප්පෙන්නේ මොකටද?"

ටිමී තව තවත් ගොරවන්නටත් බුරන්නටත් පටන් ගත් නිසා කිළුටු ඩික් ඔවුන්ගේ බෝට්ටුව පහුරෙන් තරමක් ඈතට කර ගත්තා.





"අපි පොලීසියට කියනවා...!" මැගී කිව්වා.

ඇගේ මුහුණ තරහින් රතු වී ගොස් තිබුණා.

"අනුන්ගේ පහුරක් අවසර නැතුව අරගෙන, අනුන්ගේ ගෙදරක නැවතිලා... ඒ මදිවට කෑමත් හොරකම් කරලා. තව..." ඇය කිව්වා.

"පිස්සු කතා කියන්න එපා...!" ජූලියන් කිව්වා. "තවත් අපිට කරදර කළොත් මම අපේ බල්ලව ඔය බෝට්ටුවට එවනවා."

"ගර්ර්ර්ර්ර්....!"

ටිමී දත් විළිස්සා පෙන්වමින් ගෙරෙව්වා.

කිළුටු ඩික් මැගී දෙසට හැරී යමක් සෙමින් කිව්වා. මැගී ආපසු ළමුන් දෙසට හැරී පෙරට වඩා හොඳින් කතා කළා.

"මේ අහන්න, ළමයිනේ...! මමයි මගේ මේ යාළුවයි මෙහාට ආවේ නිදහසේ සති අන්ත නිවාඩුවක් ගත කරන්න." මැගී කිව්වා. "අපි යන යන තැන ඉන්න එපා...! පැත්තකට වෙලා ඉන්න. දැන්ම මෙතනින් අයින් වෙලා ගියා නම් ප්‍රශ්නේ ඉවරයි නේ. එතකොට අපි අපේ කෑම හොරකම් කරපු එක ගැන පොලීසියට කියන්නෙත් නෑ...!"

"අපි මෙතනින් යන්නේ අපිට ඕනෙ වෙලාවට...!" ජූලියන් කිව්වා. "අපි මෙහේ ඉන්න කල් අපිට ඕනෙ විදිහට නිදහසේ ඉන්නවා."

"හරි...! එහෙනම් ඔය ළමයි මෙහෙන් යන්නෙ කවදාටද?" මැගී ඇසුවා.

"අපි හෙට උදෙන්ම යනවා." ජූලියන් කිව්වා. "ඊට පස්සේ ඔයාලා ඕනෙ දෙයක් කර ගන්න. එතකල් අපිට අපේ පාඩුවේ නිදහසේ ඉන්න දෙන්න."

මැගී, කිළුටු ඩික් දෙන්නා නැවතත් සෙමින් යමක් කතා කළා. ඉන්පසුව කිළුටු ඩික් ඉක්මනින්ම බෝට්ටුව ආපසු හරවා ගෙන ගොඩට පදවන්නට පටන් ගත්තා.

"මම දන්නවා එයාලගේ තීරණය මොකක්ද කියලා....!" බෝට්ටුව තරමක් ඈතට ගිය පසු ජූලියන් අනෙක් ළමුන් දෙසට හැරී කිව්වා.

"හෙට උදෙන්ම අපි මෙහෙන් ගියාට පස්සේ නිදහසේ එයාලගේ වැඩේ කර ගන්න පුළුවන් කියලා ඒ දෙන්නා තීරණය කරන්න ඇති. දැන් ආපහු ගියේ ඒ නිසයි. අපි ඉන්නැද්දී මේ වස්තුව ගොඩ අර ගත්තොත් අපිත් ඒ ගැන දැන ගනීවි කියලා එයාලා බයයි. හෙට අපි මෙහෙන් ගියාට පස්සේ ආපහු වැඩ පටන් ගන්න එක එයාලට ලේසියි නේ...!"

"ඉතින් ඔයා ඔය තරම් සතුටින් කතා කරන්නේ ඇයි...?" ජෝර්ජ් ඇසුවා.

"අපි මෙතැන දියේ ගිලිලා තියෙන වටිනා වස්තුව සේරමත් අරන් ඒ ගැන ඒ දෙන්නා දැන ගන්න කලින් හෙට උදෙන්ම මෙහෙන් පිටත් වෙලා යමු." ජූලියන් සතුටින් කිව්වා.

"ඒ කොහොමද...?" අනෙක් ළමුන් තිදෙනාම එක වර ඇසුවා.

ඒ හඬ ඇසී ටිමීත් ජූලියන් දෙසට හැරුණා...!

"මෙහෙමයි...!" ජූලියන් කිව්වා. "අපිට මෙතන ගිලිලා තියෙන බෝට්ටුව ගොඩ ගන්න ඕනෙ වෙන්නෙ නෑ. අපිට ඕනේ ඒකේ තියෙන වටිනා වස්තුව විතරයි නේ. ඉතින් මම කල්පනා කළේ මෙතන කිමිදිලා ඒ ටික ගොඩ ගන්න. ඒවා පෙට්ටියක හරි, මල්ලක හරි දාලා ඇති නේ. අපි පහුරේ ඉඳන් කඹයක් දාලා ගැට ගහලා ඒක උඩට ඇදල ගනිමු."

"ඔහ්...! එහෙම කරන්න පුළුවන් නම් හරිම ෂෝක්...!" ඈන් සතුටින් කිව්වා.

"ඒත්... ඒක හිතන තරම් ලේසි වෙන්නෙත් නෑ...!" ජූලියන් කිව්වා. "අපි උත්සාහ කරලා බලමු."

ඔහු හැඳ සිටි ජර්සිය ගලවා තබා වතුරට පැන්නා. අනෙක් ළමුන් පහුරේ සිට පහතට එබී ජූලියන් දියෙන් උඩට මතු වන තුරු බලා සිටියා. ටික වේලාවක් ගත වී ගියා.





"ජූලියන්ට මේ තරම් වෙලාවක් හුස්ම අල්ලගෙන ඉන්න පුළුවන්ද?" ඈන් බියෙනුත් පුදුමයෙනුත් විල් පතුළ දෙස එබී බලමින් කිව්වා.

ඒත් සමගම ජූලියන් ඉහළට මතු වුණා. ඔහු වේගවත් හුස්මක් පිට කර පහුරේ එල්ලුණා. ඉන්පසු ටික වේලාවක් හති හැරියා.

"ඒක එතන තියෙනවා....!" ජූලියන් සතුටින් කිව්වා.

"ෂා...! ඇත්තද...?" අනෙක් ළමුනුත් සතුටින් කිව්වා.

"ඔව්...! මම පහළට කිමිදිලා බැලුවා. බෝට්ටුව තියෙනවා. ඒ බෝට්ටුව උඩ ලොකු මල්ලකුත් තියෙනවා. මම ඒක ටිකක් හොළවලා බැලුවා. යන්තම් හෙල්ලුණා. ඇදගෙන එන්න අමාරුයි. ටිකක් බරයි. මට ඒක හොඳට බලාගන්න තරම් වෙලාවක් ලැබුණෙ නෑ. හුස්ම අල්ලගෙන ඉන්න බැරි නිසා ඉක්මනට උඩට ආවා." ජූලියන් හති දමමින් කියාගෙන කියාගෙන ගියා.

"ඒ මල්ලට වතුර යන්නේ නැති විදිහට හදලා ඇති." ඔහු කිව්වා. "අපි ඒක කොහොම හරි ගොඩ ගනිමු...!"

ජූලියන් සීතලෙන් වෙවුලමින් පහුරට ගොඩ වුණා.

ඊළඟ කරන්නේ කුමක්දැයි කියා ඔවුන් ටික වේලාවක් පහුර මත වාඩි වී සාකච්ඡා කරමින් සිටියා.

"මම බයේ හිටියේ, මෙතන පාවෙවී තියෙන ඈන්ගේ කොණ්ඩ බෝලෙයි ජෝර්ජ්ගේ ප්ලාස්ටික් පෙට්ටියයි අර දෙන්නා දකීවිද කියලා." ඩික් කිව්වා. "හොඳ වෙලාවට එයාලා ඒක දැක්කෙ නෑ. ඒක දැක්ක නම් ඒ දෙන්නා අපි ගැන සැක හිතනවා."

"බෝට්ටු මඩුවේ බිත්තියේ කඹ කැරලි දෙක තුනක් එල්ලලා තිබුණා නේද...?" ජූලියන් ඇසුවා. "අපි ඒවා අරන් ඇවිත් මේ මල්ල ගොඩ ගන්න බලමු...!"

මේ වන විට මැගී, කිළුටු ඩික් දෙදෙනා ඔවුන්ගේ බෝට්ටුවෙන් විලේ ඉවුර අසලට ළඟා වී සිටියා. ජූලියන් විලේ කිමිදෙනවා ඔවුන්ගේ ඇස ගැටුණේ නෑ. ළමුන් සිටියේ ඔවුන්ට සෑහෙන තරම් ඈතකින් විල

මැද ප්‍රදේශයට එන්නටයි.

ළමුන් පහුරේ සිට විල ඉවුරට ළඟා වන බෝට්ටුව දෙස බලා සිටියා. ඔවුන්ටත් එය පැහැදිලිව පෙනුණේ නෑ. ඒත් ටික වෙලාවකින් ඉවුර දෙසින් හිරු එළිය වැටී යමක් තදින් දිළිසෙන සැටි ළමුන්ට කිහිප වරක්ම දැක ගන්නට ලැබුණා.

"දැක්කද...?" ජූලියන් කිව්වා. "මැගී, කිළුටු ඩික් දෙන්නා අපි කරන්නෙ මොනවද කියලා දුර බලන කන්නාඩියකින් බලාගෙන ඉන්නවා. ඒ ඉර එළියට දිළිසෙන්නේ දුර බලන කන්නාඩියේ වීදුරුව. අපි ආපහු සැරයක් කිමිදිලා බැලුවොත් එයාලට පෙනේවි."

"ඒ දෙන්නා අද දවසම ඉවුරට වෙලා අපි දිහා බලාගෙන ඉඳීවි." ජෝර්ජ් කිව්වා. "අපි මේක ගොඩ ගත්තොත් එයාලා දකීවි."

"ඔව්...! දැන් අපි මෙතනින් යන එක හොඳයි." ජූලියන් කිව්වා. "කොහොමටත් දැන් අපි ළඟ කඹයකුත් නෑ නේ."

"ඒත් අපි මේක කොයි වෙලාවෙ හරි ගොඩ ගන්න ඕනේ...!" ඩික් කිව්වා. "නැත්නම් ඒ දෙන්නා හෙට උදේන්ම මෙතෙන්ට ඒවි...!"

"මෙතෙන්ට ඇවිල්ලා කිමිදිලා ගිලිලා තියෙන වස්තුවත් ගොඩට අරගෙන ඒ දෙන්නටත් නොපෙනී මෙහෙන් පිට වෙන්න නම් කරන්න තියෙන්නේ එක දෙයයි." ජූලියන් කිව්වා. "අද රෑටම මෙතෙන්ට එන්න ඕනේ...!"

"රෑට...?" ඈන් බියෙන් කිව්වා.

"හඳ තියේවි...!" ජෝර්ජ් සතුටින් කිව්වා.

"නියම අදහස...!" ඩික් ජූලියන්ගේ පිටට පහරක් ගසමින් කිව්වා.

"එහෙනම් අපි දැන් ආපහු යමු." ඩික් කිව්වා. "රෑට ඇවිත් මේ වැඩේ කරන්න බලමු. හැබැයි අපි ආපහු ගියාට පස්සේ මැගී, කිළුටු ඩික් දෙන්නා අද හවසම බෝට්ටුවෙන් ආපහු මෙතෙන්ට එයිද දන්නෙ නෑ."





"මං හිතන්නෙ නෑ...!" ජූලියන් කිව්වා. "එයාලා ලෑස්ති වෙලා ඉන්නේ, අපි හෙට උදේන්ම මෙහෙන් ගියාට පස්සේ වැඩ පටන් ගන්න. අපිට පේන්න මේක ගොඩ ගන්න ඒ දෙන්නා කැමති නෑ. ඒක එයාලට අවදානමක්...!"

"ඔව්...! අපි හෙට උදේන්ම මෙහෙන් යනවා...!" ජෝර්ජ් කිව්වා. "ඒත් එක්කම වටිනා වස්තුව සේරමත් මෙහෙන් අරන් යනවා...! මම කල්පනා කළේ ටිම් අරන් ආව කෑම වලින් ඉතුරු ටිකත් අර දෙන්නා අදත් ආපහු අරන් ගියාද දන්නෙ නෑ."

"බය වෙන්න එපා...!" ජූලියන් කිව්වා. "මම කෑම ටික මගේ බෑග් එකේ දාලා පහුරට පටවා ගත්තා...!" ජූලියන් ඔහු වාඩි වී සිටි තැන තිබූ ගමන් මල්ල පෙන්වමින් කිව්වා.

"ඔයා අපිට ඒ ගැන කලින් කිව්වෙ නෑ නේ...!" ජෝර්ජ් කිව්වා. "ඔයාට ඒ වගේ කල්පනාවක් පහළ වුණු එක කොච්චර හොඳද? ඇත්තටම ඔයා හරිම දක්ෂයි ජූලියන්...!"

# සඳ ඇති රැයේ.....

## 20

ළමුන් හැකි තරම් ඉක්මනින් පාරුව විල ඉවුර දෙසට පැද යන්නට පටන් ගත්තා. ඩික් අතරමග දී තවත් වරක් ආපහු හැරී දිය මත පාවෙන කොණ්ඩ බෝලය සහ ප්ලාස්ටික් පෙට්ටිය දෙස බැලුවා. එය හරියටම දියේ ගිළුණු බෝට්ටුවට උඩින් විලේ ජල තලය මත පාවෙමින් නිසලව තිබුණා.

"අද රෑට අහස වලාකුළු වලින් පිරිලා හඳ එළිය වැටෙන්නේ නැතුව තිබුණොත් තමයි වැඩේ." ජෝර්ජ් කිව්වා. "එහෙම වුණොත් අපිට තැන හරියටම හොයා ගන්න බැරි වෙයි."

"එහෙම වෙන එකක් නෑ...!" ජූලියන් කිව්වා. "මේ දවස්වල කාලගුණය ඒ තරම්ම නරක නෑ."

ළමුන්ගේ පාරුව ගොඩබිමට ළං වනවා දුටු ගමන්ම මැගී සහ කිළුටු ඩික් වාඩි වී සිටි තැනින් නැගිට ගොස් ඔවුන්ගේ කූඩාරම් වලට රිංගා ගත්තා...!

"අපි ආපහු එනවා දැක්කම ඒ දෙන්නගේ හිත් වලට සැහැල්ලුවක් දැනෙන්න ඇති." ජූලියන් අනෙක් ළමුන් දෙසට හැරී සිනාසෙමින් කිව්වා. "අපි එයාලගේ රහස ගැන මොනවා හරි දන්නවා කියලා එයාලා සැක කරනවද දන්නේ නෑ."

ළමුන් පහුර විල ඉවුරේ පඳුරු අතර නොපෙනෙන තැනක සඟවා





තබා ඔවුන්ගේ සුපුරුදු නවාතැන වූ පොළොව යට පිහිටි ගබඩා කාමරය වෙත ගමන් කළා.

ටිමී සිහින් හඬින් ගොරවමින් බිම ඉව කරමින් කාමරය පුරා ඇවිදින්නට පටන් ගත්තා...!

"මං හිතන්නේ අදත් අර දෙන්නා මෙහාට ඇවිත් ගිහින් වගේ." ජෝර්ජ් කිව්වා. "ජූලියන්, ඔයා හොඳ වෙලාවට ඉතුරු කෑම ටික පරිස්සම් කර ගත්තේ. මට නම් දැන් හොඳටම බඩගිනියි."

ඇත්තෙන්ම ළමුන් සියලු දෙනාටම තදින් බඩගිනි දැනී තිබුණා. ඔවුන් ටිමීත් සමග එක් වී ඉක්මනින්ම කෑම කන්නට පටන් ගත්තා. ඒ වන විට ඔවුන් ගෙන ආ දොඩම් බීම බෝතලයම අවසන් වී තිබුණු නිසා බොන්නට තිබුණේ සිසිල් ජලය විතරයි. කෑමෙන් පසුව ඈන් සියලු දෙනාටම කෝප්පවලට ජලය පුරවා දුන්නා.

ළමුන් එදින උදේ වරුව පුරාම විල මත පහුර ඒ මේ අත පැද යාම නිසා වෙහෙසට පත් වී සිටියා. ඒ නිසා ඔවුන් දවල් කෑමෙන් පසුව එළිමහනේ ගසක් යට සෙවණේ ටික වේලාවක් වැතිරී විවේක ගනිමින් කාලය ගත කළා.

"ඔහ්...! හවස් වීගෙනත් එනවා." ටික වේලාවකට පසුව ජූලියන් අත් ඔරලෝසුව දෙස බලමින් කිව්වා. "වෙලාව හරිම ඉක්මනට ගත වෙනවා. තව ටික වෙලාවකින් කළුවරත් වැටේවි. රෑ එකොළහ විතර වෙනකොට හඳ මුදුන් වෙලා, හොඳට එළිය වැටිලා තියේවි. අපි ඒ වෙලාවට හොරෙන්ම අපේ ගමන පිටත් වෙමු."

"අපි කළුවර වැටෙන කල් ක්‍රිකට් සෙල්ලම් කරමු." ඩික් කිව්වා. "මේ කඩා වැටුණු ගෙදර සුන්බුන් අතරේ බැට් එකකට ගැළපෙන ලෑලි කෑල්ලක් ලේසියෙන්ම හොයා ගන්න පුළුවන්. මගේ බෑග් එකේ බෝලයක් තියෙනවා."

"ඒක නම් හොඳ අදහස...!" ජූලියන් කිව්වා. "විලේ වතුර හරිම සීතලයි. මම විලේ කිමිදුණ වෙලාවේ ඉඳන් තවමත් මට ටිකක් සීතලයි. මම කල්පනා කළේ දවල්ට මෙහෙම නම් රෑට කිමිදෙන කොට කොහොම සීතලක් තියෙයිද...?"

"ජූලියන්, එහෙම නම් අද රෑට මම කිමිදෙන්නම්." ඩික් එහා ඉදිරිපත් වෙමින් කිව්වා.

"නෑ...! අපි දෙන්නටම කිමිදෙන්න වෙනවා." ජූලියන් කිව්වා. "කඹයක් අරන් ගිහින් මල්ලේ ගැට ගහන්න මට ඔයාගේ උදව් ඕනෙ වෙනවා."

"හරි...!" ඩික් සතුටින් ඊට එකඟ වෙමින් කිව්වා. "අපි දැන් සෙල්ලම් කරන්න පටන් ගනිමු."

ළමුන් විල ඉවුර අද්දර එළිමහනේ තැනක ක්‍රිකට් සෙල්ලම් කරන්නට පටන් ගත්තා. හවස් වරුව හරිම විනෝදයෙන් ගත වී ගියා. ඈතට දුව ගොස් බෝලය අහුලා ළමුන්ට ගෙනැවිත් දෙමින් ටිමීත් සතුටින් සෙල්ලමට සහභාගි වුණා.

ටිකෙන් ටික අඳුර වැටෙමින් තිබුණා; හිරු බැස යද්දී විල අවට පරිසරය පාළු අඳුරු මූසල ස්වභාවයකට හැරුණා.

ජූලියන් තනිවම බෝට්ටු මඩුවට ගොස් එහි තිබූ දිග කඹයක් රැගෙන ආවා. ඔහු එය පඳුරු අතරේ සඟවා තිබූ පහුරට දමා ආපසු අනෙක් ළමුන් සිටි තැනට ආවා.

ළමුන් එදින රැයේ ටික වේලාවක් නිදා ගන්නට උත්සාහ කළා. ඒත් කළුදිය විලේ ගිලී ඇති වටිනා වස්තුව ගොඩ ගන්නට තිබෙන නොඉවසිල්ල නිසාම ඔවුන්ට නින්ද ගියේ නෑ.

ටිකෙන් ටික මැදියම් රෑ ළඟා වුණා. ළමුන් සෙමින් නැගිට රහසේම ගමනට සූදානම් වුණා.

"ටිමී...! සද්ද නැතුව ඉන්න ඕනේ...! තේරුණා නේද..?" ජෝර්ජ් ටිමීට රහසින් කිව්වා.

ටිමීට ජෝර්ජ් කියූ දෙය හොඳින් තේරුම් ගියා...! ටිමී නිහඬවම ළමුන් සමඟ පිටත් වුණා...!





හොඳින් හඳ පායා මුළු පරිසරය එළිය වී තිබුණා. තුනී වලාකුළු කිහිපයක් පමණක් අහසේ පාවෙමින් තිබුණා. ඒත් අහසත් පරිසරයත් හොඳින් පැහැදිලිව තිබෙන බව ළමුන්ට පෙනුණා. ඉඳහිට වලාකුළු වලින් සඳ යන්තමින් වැසී ගිය විට පරිසරය තරමක් අඳුරු වුණත් ඉක්මනින්ම වලාකුළු මැකී ගොස් නැවත සඳ එළිය වැටුණා.

"මැගී, කිළුටු ඩික් දෙන්නා නිදි ඇති නේද...?" ඩික් රහසින් ජූලියන්ට කිව්වා.

ජූලියන් නිහඬවම ටික වේලාවක් කූඩාරම් දෙක දෙස බලා සිටියා. ඒ දෙසින් කිසිදු හඬක් ඇසුණේ නෑ.

"අපි කෝකටත් ටිකක් පරිස්සමින් යන එක හොඳයි." ජූලියන් රහසින් කිව්වා. "මැගී, කිළුටු ඩික් දෙන්නා අහම්බෙන් හරි අපිව දැක්කොත් අපේ මහන්සිය සම්පූර්ණයෙන්ම වතුරේ...! හඳ එළියට පේන්න යන්න එපා...! ගස් අස්සෙන්, අඳුරු හෙවණැලි වලට වැහිලා සද්ද නැතුව විල ළඟට යමු."

"ජෝර්ජ්, ටිමීව බලා ගන්න. එයාට සද්ද කරන්න දෙන්න එපා...!" ඩික් කිව්වා.

"හරි. මම බලා ගන්නම්." ජෝර්ජ් කිව්වා.

ළමුන් සතර දෙනාත් ටිමීත් ගස් වල අඳුරු සෙවණැලි වලට මුවා වෙමින් නිහඬවම විල අද්දරට ළඟා වුණා.

දහවල් කාලයේදී විල් ජලය අඳුරු පැහැයෙන් දිස් වුණත් රැයේදී සඳ එළිය වැටී විල මතුපිට රිදී පැහැයෙන් බැබළුණා. පරිසරය ඉතාමත් නිහඬව පැවතුණා. සුළඟක්වත් හමා ගියේ නැති නිසා ගස් සෙළවෙන හඬවත්, ගසකින් කොළයක් වැටෙන හඬක්වත් ඇසුණේ නෑ...! විලේ ජලය වීදුරු මතුපිටක් මෙන් නොසෙල්වී තිබුණා.

ළමුන් විල ඉවුරේ පඳුරු අතර සඟවා තිබූ පහුර පිටතට ගෙන ඊට නැග ගත්තා. ජූලියන් එය සෙමින් විල දෙසට පදවන්නට පටන් ගත්තා. ටික දුරක් ගිය පසු අනෙක් ළමුනුත් පැඩල පාගමින් ඔහුට උදව් වුණා.

හඳ එළියේ විල මත සැරිසරන්නට ලැබීම ගැන ටිම් සතුටින් සිටින බව ළමුන්ට පෙනුණා. ටිම් ජෝර්ජ් ළඟින් වැතිරී නිහඬවම බලා සිටියා.

"කිසිම සද්දයක් නෑ...!" ඈන් කිව්වා. "පහුර පදිනකොට විලේ වතුර කැළැත්තෙන සද්දෙ විතරයි ඇහෙන්නේ."

ඒත් සමගම විල වටා වැවී තිබුණු උස් අඳුරු ගස් පෙළ දෙසින් ඇසුණු බකමූණෙකුගේ කෑ ගැසීම් හඬක් පරිසරය සිසාරා පැතිරී ගියා...! ඒ හඬින් ඈන් තිගැස්සී ගිය බව පෙනුණා...!

"කිසිම සද්දයක් නෑ කියලා ඈන් කිව්ව විතරයි, දැක්කද ඒක ඇහුණ බකමූණෙක් සද්ද කරලා පෙන්නුවා...!" ජූලියන් ඈන්ට සරදම් කරමින් කිව්වා. "ඈන් කිව්වෙ නම් ඇත්ත තමයි. මුළු පරිසරයම හරිම නිහඬයි...!"

"හා... හා.... ටිම්, මගේ කන ලෙවකන්න එපා...!" ඩික් එකවරම ටිම්ව ඉවතට තල්ලු කරමින් කිව්වා. "මගේ කන ඔයාගේ කෙළ වලට දිය වෙලා යයි. ඕක නවත්තන්න."

"අපි යන පැත්ත හරි ඇති නේද...?" ජූලියන් කිව්වා. "මම හිතන හැටියට නම් දැන් අපිට අර බිම් සලකුණු එක එක පේන්න පටන් ගන්න ඕනේ."

ජූලියන් කියූ විදිහටම ළමුන්ට බිම් සලකුණු පෙනෙන්නට පටන් ගත්තා. ජෝර්ජ් පළමුවෙන්ම උස ගල දැක්කා. එය අඳුරු ගස් වල සෙවණැලි අතරින් මතු වී පෙනුණා. ඒත් සමගම පල්ලියේ මුදුන් කොත සඳ එළිය වැටී සුදු පැහැයෙන් දිදුලමින් තිබෙන සැටි අනෙක් ළමුන්ට ඈතින් දැක ගන්නට ලැබුණා.

"මං හිතන්නේ නෙයිලර් බෝට්ටුව ගිල්ලවන්න විල මැදට එන්න ඇත්තෙත් මේ වගේ හඳ තියෙන රෑක වෙන්න ඇති." ජූලියන් කිව්වා. "දවල්ටත් වැඩිය හොඳට ඒ බිම් සලකුණු රෑට හඳ එළියෙන් පැහැදිලිව පේනවා."

"ඔන්න...! දැන් චිමිනියත් පේනවා." ඈන් කිව්වා. "දැන් අපි හරි තැනට ගොඩක් ළං වෙලා වගේ...!"





"ඔව්...! අර තියෙන්නේ...!" ඩික් කිව්වා.

ජූලියන් නූලක ගැට ගසා රඳවා තිබූ කොණ්ඩා බෝලය සහ ප්ලාස්ටික් පෙට්ටිය විල් ජලයේ පාවෙමින් තිබුණා. ළමුන්ට එය හඳ එළියෙන් පැහැදිලිවම හඳුනා ගන්නට හැකි වුණා.

"ඇත්තටම අපි පස්දෙනා මේ වැඩේ හරිම දක්ෂ විදිහට සැලසුම් කළා." ඩික් කිව්වා. "ඒ ගැන අපි ආඩම්බර වෙන්න ඕනේ...!"

"ඔය කතා නවත්තලා කිමිදෙන්න ලෑස්ති වෙමු." ජූලියන් ජර්සිය ගලවමින් කිව්වා. "හැබැයි සීතලයි...!"

ජූලියන්, ඩික් දෙදෙනා ඇඳුම් ගලවා ඈන් අතට දී පහුරෙන් ජලයට බැස ගත්තා.

"ඩික් කඹය ගත්ත නේද?" ජූලියන් ඇසුවා. "හඳ එළියට විලේ පතුළ නම් පේන්නෙ නෑ. ඒ වුණාට මේ ප්ලාස්ටික් පෙට්ටියේ ගැට ගහලා තියෙන නූල කෙළින්ම පහළට කිමිදුණාම හරියටම ගිලිලා තියෙන බෝට්ටුව අහු වෙයි. එහෙම නම්.... ඔන්න මං ගියා...!"

ජූලියන් දියේ කිමිදී අතුරුදන් වුණා. ඩික් ඒත් සමගම දිගු හුස්මක් ගෙන කිමිදුණා.

ජූලියන් පළමුවෙන්ම විල් පතුළට ළඟා වුණා. යන්තම් අඳුරු සෙවණැල්ලක් ලෙස ගිලී තිබුණු බෝට්ටුව ඔහුට දිස් වුණා. ඔහු අඳුරේම අතපත ගා බෝට්ටුව මත තිබූ විශාල හම් මල්ල අතට හසු කර ගත්තා.

ඒ සමගම ඩික් කඹයත් රැගෙන එතැනට කිමිදී ආවා. ඔවුන් දෙදෙනාම පාසැලේ දී පිහිනීමටත්, දිය යට කිමිදීමටත් දක්ෂ ළමුන් දෙදෙනෙක්. ඒත් විල් පතුලේ තිබූ හම් මල්ල කඹයේ කෙළවරක හරි හැටි ගැට ගසා ගන්නට තරම් වේලාවක් ඔවුන් දෙදෙනාට දිය යට සිටින්නට හැකි වුණේ නෑ.

හුස්ම අල්ලාගෙන සිටින්නට නොහැකි වූ නිසා ඩික් කඹය ගැට ගැසීම අතරමග නවතා දමා ඉක්මනින්ම දිය මතුපිටට ආවා. ජූලියන්

ඒ පිටුපසින්ම ඉහළට ආවා. ඔවුන් දෙදෙනා පහුරේ එල්ලී වේගයෙන් හුස්මක් පිට කළා...!

ජෝර්ජ්, ඈන් දෙදෙනා නොඉවසිල්ලෙන් ඔවුන් දෙදෙනා දෙස බලා සිටියා. ජූලියන්, ඩික් දෙදෙනා හති දමමින් ටික වේලාවක් කල් ගත කළා.

අන්තිමේදී ජූලියන් සතුටින් ගැහැනු ළමුන් දෙදෙනාට කතා කළා.

"හැම දෙයක්ම හරි...!" ඔහු කිව්වා. "තව පොඩි වැඩයි කරන්න තියෙන්නේ. අපි ආපහු කිමිදෙනවා. ඔන්න එහෙනම්.... අපි ගියා...!"

ජූලියන්, ඩික් දෙදෙනා දෙවැනි වරටත් දිය යට කිමිදී නොපෙනී ගියා. ජෝර්ජ්, ඈන් දෙදෙනා පහුර මත වාඩි වී නොඉවසිල්ලෙන් බලා සිටියා.



# වටිනා වස්තුව අත් කර ගනිමින්.....

## 21

ජූලියන්ටත්, ඩික්ටත් විල් පතුලේ තිබූ මල්ල කඹයේ කෙළවර ගැට ගසා ගන්නට සිතූ තරම් ලෙහෙසි වුණේ නෑ. වරින් වර කිහිප වරක්ම දිය මතුපිටට ඇවිත් හුස්ම ගෙන ආපසු කිමිදෙන්නට ඔවුන්ට සිදු වුණා.

අන්තිමේදී ඔවුන් දෙදෙනා එක් වී කෙසේ හෝ මල්ල කඹයේ ගැට ගසා ගත්තා.

කඹයේ අනිත් කෙළවරත් අතින් ගත් ඩික් මුලින්ම සීතලෙන් වෙව්ලමින් පහුරට නැග ගත්තා. ජූලියන් ඒ පිටුපසින් ආවා. ඔහුත් සීතල නිසා වෙව්ලමින් සිටියා.

විනාඩි කිහිපයක් හති දමමින්, වෙව්ලමින් සිටි පිරිමි ළමුන් දෙදෙනා ටික වේලාවකට පසු කතා කරන්නට පටන් ගත්තා.

"හරි...! දැන් තියෙන්නෙ උඩට අදින්න." ජූලියන් කිව්වා.

"අදිමු...!" ඩික් කිව්වා.

ඔවුන් දෙදෙනා එක් වී කඹය සෙමින් සෙමින් ඉහළට ඇද්දා. එහි අනෙක් කෙළවරේ ගැට ගසා තිබූ මල්ල ටිකෙන් ටික දියෙන් ඉහළට ආවා...! මල්ල පහුරට පටවා ගන්නට ළමුන් සියලු දෙනාම එක් වී

කිහිප වරක්ම උත්සාහ කළත් එය ඉතා අපහසු කරුණක් බව පෙනුණා.

ඈන්, ජෝර්ජ් දෙදෙනාත් දියෙන් තෙමී ගියා. ඔවුන් සතර දෙනාම එක් වී මල්ල පහුරට ඔසවා ගන්නට උත්සාහ කරන විට පහුර එක් පැත්තකට ඇල වෙන්නට පටන් ගත්තා...! අන්තිමේදී ළමුන් මඳකට ඒ උත්සාහය අත හැරියා.

"අපි මල්ල පහුරට තියලා ගැට ගහලා කඹයෙන් ඇදගෙනම පහුර ගොඩට පදිමු...!" ජූලියන් කිව්වා.

හැමෝම ඒ අදහසට කැමති වුණා.

ජූලියන්, ඩික් දෙදෙනා ඉක්මනින් ඇඳුම් ඇඟලා ගෙන පාරුව විල් ඉවුරට පැද යන්නට සූදානම් වුණා.

"මගේ ඇඟිලි සීතලට හිරි වැටිලා." ජූලියන් වෙවුලමින් කිව්වා. "ඉක්මනට යමු. හුළඟ වදින කොට තවත් සීතලයි...!"

"මාවත් සීතලට ගල් වෙලා...!" ඩික් කිව්වා. "මගෙ අත පය හිරි වැටිලා...!"

හැකි තරම් ඉක්මනින් විල් තෙරට ළඟා වන බලාපොරොත්තුවෙන් ළමුන් පහුර වේගයෙන් පදවන්නට පටන් ගත්තා. එහි කඹයෙන් ගැට ගසා තිබූ මල්ලත් ඒ සමගම පිටුපසින් ඇදී එන්නට වුණා.

ඈන් වරින් වර ආපසු හැරී පහුර පිටුපසින් ඇදී එන කළු පැහැති විශාල මල්ල දෙස බැලුවා.

"මල්ල ඇතුළේ මොනවද දන්නේ නෑ තියෙන්නේ...!" ඇය කිව්වා. "අපි ඉක්මනට ගිහින් ඒක ලිහලා බලමු. මට ඒක බලනකල් ඉවසිල්ලක් නෑ...!"

මල්ලේ ඇති දේ දකින තුරු ළමුන් සියලු දෙනාම සිටියේ හරිම නොසන්සුන්කමකින්. අන්තිමේදී ඔවුන් විල් තෙරට ළඟා වුණා. ජූලියන් පහුරෙන් බිමට බැස එහි ගැට ගසා තිබූ මල්ල කඹයෙන් ලිහා ගත්තා. ඔහු ඩික් සමග එක් වී එය ඔසවා විල් ඉවුරෙන් තැබුවා.





"මේක හරි බරයි වගේ...!" ඩික් කිව්වා.

"අපි පහුර කලින් තිබ්බ තැනම හංගලා තියන්න ඕනේ." ජූලියන් කිව්වා. "මැගී, කිළුටු ඩික් දෙන්නට කිසිම සැකයක් ඇති වෙන්න ඉඩ දෙන්න හොඳ නෑ."

ඔවුන් පහුර ඇදගෙන ගොස් පෙර පරිදිම පඳුරු අස්සෙහි සඟවා තැබුවා. ජෝර්ජ් ටිමීත් සමග ඉස්සර වුණා. ජූලියන්, ඩික් දෙදෙනා මල්ලත් ඔසවාගෙන ඒ පිටුපසින් ගමන් කළා. ඈන් ඔවුන්ට පිටුපසින් ආවා.

ළමුන් සතර දෙනාත් ටිමීත් හැකි තරම් නිහඬව, ඉක්මන් ගමනින් ඇවිත් පොළොව යට පිහිටි ගබඩා කාමරයට රිංගා ගත්තා...!

ටිමී කාමරයට බසින පියගැට පෙළ පාමුල මුර කරමින් නතර වුණා. ළමුන් සතර දෙනා කාමරයට ඇතුළු වුණා.

ජූලියන්, ඩික් දෙදෙනා ඔසවාගෙන ආ මල්ල කාමරයේ බිම තබා ජයග්‍රාහී සිනාවක් පෑවා...!

ඈන් සැනසුම් සුසුමක් හෙළා ඔවුන් දෙදෙනා සමග සිනාසුණා...!

ජෝර්ජ්ගේ ඇස් සතුටින් දිලිසුණා...!

"ජෝර්ජ්...! ඉක්මනට තව ඉටිපන්දමක් දෙකක් පත්තු කරන්න." ජූලියන් ඇයට සෙමින් කිව්වා. "අපි මේ මල්ල ඉක්මනට ලිහලා බලමු. මැගී, කිළුටු ඩික් දෙන්නා අපි ගැන කිසිම සැකයක් හිතන්නෙ නැතුව දැන් හොඳට නිදි ඇති...!"

ජෝර්ජ්, ඈන් දෙදෙනා එක් වී ඉටිපන්දම් කිහිපයක් දල්වා මේසය මත රැඳෙව්වා.

මෙතෙක් දවස් බොහෝ වෙහෙස මහන්සි වී සොයා ගත් ඒ වටිනා වස්තුව සහිත මල්ල විවර කර බලන්නට ළමුන් සැරසුණා...!

ජූලියන් වෙවුලන ඇඟිලි වලින් මල්ල ලිහන්නට පටන් ගත්තා.

ජෝර්ජ්ට තවත් බලා සිටින්නට තරම් ඉවසිල්ලක් තිබුණේ නෑ. ඇය ඇගේ සාක්කු පිහිය ගෙන ජූලියන් අතට දුන්නා.

"මට නම් තවත් බලාගෙන ඉන්න බෑ...!" ජෝර්ජ් කිව්වා. "මල්ල කපලා හරි අරින්න...!"

ජූලියන් සිනාසෙමින් මල්ල බැඳ තිබූ හම් පටිය කපා දමන්නට පටන් ගත්තා. දියසෙවල බැඳුණු අඳුරු පැහැති හම් මල්ල ලිහා බැලූ ඔවුන්ට ඒ ඇතුළත තිබූ තවත් මල්ලක් දකින්නට ලැබුණා.

"මේක ඇතුළට වතුර යන්නෙ නැති විදිහට හදපු මල්ලක්...!" ජූලියන් කිව්වා.

ඔහු ඒ මල්ලත් කපා විවර කළා.

"ඉක්මනට...!" ඩික් නොඉවසිල්ලෙන් කිව්වා.

එය ඇතුළත තිබුණේ තරමක ලොකු පාර්සලයක්...! ඔහු එය පිටතට ගත්තා. අනතුරුව පාර්සලය ඔතා තිබූ ඝනකම් රියම් කොළය ඉරා දමන්නට පටන් ගත්තා.

අනෙක් ළමුන් නොඉවසිල්ලෙන් ඒ දෙස බලා සිටියා. පාර්සලය ඇතුළට ජලය කාන්දු නොවන සේ එය හොඳින් ආවරණය වන පරිදි කිහිප වරක්ම රියම් කොළ වලින් ඔතා තිබුණා.

පාර්සලය ඔතා තිබූ රියම් කොළ කිහිපය ඉරා දැමූ පසු ඔවුන්ට හමු වුණේ ඝනකම් කැන්වස් රෙද්දකින් ඔතන ලද පෙරට වඩා තරමක කුඩා පාර්සලයක්...! ජූලියන් කැන්වස් රෙද්ද කපා දමා ඒ පාර්සලයත් විවර කළා.

එහි ඇතුළත තිබුණේ කුඩා පෙට්ටි කිහිපයක්...! ඒවා ස්වර්ණාභරණ අසුරන පෙට්ටි බව ළමුන් දුටු සැණින්ම හඳුනා ගත්තා.

"එහෙනම් මේ පෙට්ටිවල තියෙන්නේ ආභරණ...!" ඈන් ඇස් ලොකු කර බලමින් කිව්වා.

ඇය ඉන් එක් පෙට්ටියක් අතට ගෙන විවර කර බැලුවා.





එහි තිබුණේ කළු පැහැති වෙල්වට් ආවරණයක් මත අසුරා තබා තිබුණු වටිනා කර මාලයක්...! ඊට ඔබ්බවා තිබුණු නිල් පැහැති දියමන්ති කැට ඉටිපන්දම් එළියෙන් දිළිසෙන අපූරුව දෙස ළමුන් ටික වේලාවක් කතා නැතිවම බලා සිටියා...!

"මම හිතන්නේ මේක ෆෙලෝනියා රැජිනට අයිති දියමන්ති මාලේ වෙන්න ඕනේ." ජෝර්ජ් කිව්වා. "මීට අවුරුද්දකට විතර කලින් ෆෙලෝනියා රැජිනගේ මාළිගාව හොරු බිඳලා වටිනා ආභරණ සේරම අරන් ගිහින් තිබුණා. ඒක හරි ප්‍රසිද්ධයි...! පත්තරේ ඒ ගැන පින්තූර පළ වෙලා තියෙනවත් මම දැක්කා. මේ දියමන්ති මාලේ පින්තූරෙකුත් පත්තරේ තිබුණා මට මතකයි."

"ඔහ්...! එතකොට මේ දියමන්තිද....?" ඈන් පුදුමයෙන් ඇස් ලොකු කර ගනිමින් කිව්වා. "ජූලියන් මේක කොච්චර විතර වටිනවද ඇද්ද...? පවුම් දාහක්...!"

"සමහරවිට ඊට වැඩිය වටිනව ඇති...!" ජූලියන් කිව්වා. "පවුම් දහ දාහක් වුණත් වෙන්න පුළුවන්. පවුම් දස ලක්ෂයක් වෙන්නත් පුළුවන්...! මට හරියටම කියන්න බෑ."

"බලාගෙන ගියාම නෙයිලර් කරලා තියෙන්නේ ලොකු හොරකමක් නේ. මේ තරම් වටින මේ ආභරණ ටික මැහීටයි, කිළුටු ඩික්ටයි හම්බ වුණා නම් මොනවා වෙයිද...? අපි බලමු අනිත් පෙට්ටිවල තියෙන්නේ මොනවද කියලා...!"

ළමුන් එහි තිබූ අනෙක් කුඩා පෙට්ටි කිහිපයත් විවර කර බැලුවා. සෑම එකකම තිබුණේ වටිනා දියමන්ති, මැණික් ආදිය ඇල්ලූ ස්වර්ණාභරණයි...!

"ආ...! රතු ගල් අල්ලපු කරාබු දෙකක්...!" ඈන් එක් පෙට්ටියක් විවර කර බලමින් කිව්වා. "මෙච්චර ලොකු මැණික් ගල් දෙකක් මොකට කනේ පළඳිනවද මන්දා...? මේක හරිම බරයි නේ. එල්ලගෙන ඉන්න කොට රැජිනගේ කන් දෙක රිදෙන්නෙ නැද්ද දන්නෙ නෑ."

"මේ තරම් වටිනා ආභරණ මට නම් කවදාවත් අයිති වෙන්න එපා කියලයි මම ප්‍රාර්ථනා කරන්නේ." ඈන් නැවතත් කිව්වා. "එතකොට කවුරු හරි ඒවා හොරකම් කරයි කියලා හැමදාම බයෙන් ජීවත් වෙන්නයි

සිද්ධ වෙන්නේ. මේව සේරම අයිති ගෙලෝහියා රැජිනටද දන්නෙ නෑ...!"

"නෑ...! සමහර ආභරණ අයිති රජ පවුලේ අහිත් අයට කියලයි මම අහලා තියෙන්නේ." ජූලියන් කිව්වා. "ඇත්තටම ඈන්, ටික වෙලාවකටවත් මේ වගේ වටිනා දේවල් මගේ භාරයේ තියෙනවට මමත් නම් කැමති නෑ. ඒක හිතට හරිම බරක්...!"

"ඒ වුණාට මේවා මැගී, කිළුටු ඩික් දෙන්නගෙ භාරයේ තියෙනවට වැඩිය අපි ළඟ තියෙන එක හොඳයි නේ...!" ඩික් කිව්වා.

"මේ තරම් වටිනා වස්තුවක් මේ පාළු පළාතේ විලක් මැද කාලයක් තිස්සේ හැංගිලා තියෙනවා කියලා කිසි කෙනෙක් හිතන්න නැතුව ඇති." ජෝර්ජ් කිව්වා.

"දැන් අපි කල්පනා කරලා බලමු ඊළඟට මොකද කරන්නෙ කියලා. දැන් පාන්දරටත් ළඟයි." ජූලියන් කිව්වා. "අනිද්දා උදේ ඉස්කෝලේ පටන් ගන්නවා. අපි හෙට හවසට ඉස්කෝලේ නේවාසිකාගාරයට යන්න ඕනේ. මේ දේවල් ගැන කිව්වට ඉස්කෝලේ කවුරුවත් විශ්වාස කරන එකකුත් නෑ...!"

"කවුරුවත් නෙමෙයි...! මටත් තාම මේක විශ්වාස කරන්න අමාරුයි...!" ඈන් කිව්වා.

"අපි හෙට උදේ පාන්දරින්ම මේ ටිකත් අරගෙන ඉක්මනටම මෙහෙන් පිට වෙලා යමු." ජූලියන් කිව්වා. "අපි මේවා පරිස්සමින් අරන් ගිහින් පොලීසියට බාර දෙන්න ඕනේ....!"

"අර එදා හම්බ වුණු නපුරු පොලිස් නිලධාරියට නම් බාර දෙන්න එපා...!" ජෝර්ජ් තරහින් කිව්වා.

"අපොයි නෑ...!" ජූලියන් සිනාසෙමින් කිව්වා. "මං හිතන්නේ අපි රිබ්ල්ස් ගමට ගිහින්, කුලියට අරන් ආපු ඇහිරිලි, පොරෝනා ටිකත් ආපහු දීලා, තැපැල් කන්තෝරුවෙන්ම ගස්ටන් මහත්මයට ඇමතුමක් දීලා මේ ගැන කතා කළොත් හොඳයි කියලා."

"මොකද දන්නවද? මේවත් අරන් බස් එකේ යන එක භයානකයි...! අපි ගස්ටන් මහත්මයට කියමු කාර් එකත් අරන් එන්න කියලා. අපිට





එතකොට මේ ටික ආරක්ෂා ඇතුව අරන් ගිහින් පොලීසියට බාර දෙන්න පුළුවන්...!"

"අපි මේ සේරම පෙට්ටි ටික අරන් යන්නෙ කොහොමද?" ජෝර්ජ් කල්පනා කරමින් කිව්වා.

"අතරමග දී මේවා කවුරු හරි දැක්කොත් විනාසයි." ඩික් හිසෙහි අත ගසා ගනිමින් කිව්වා.

"නෑ. අපි පෙට්ටි ටික මෙතනම දාලා ආභරණ ටික විතරක් අපේ බෑග් වල අඩියේ හංගාගෙන මෙහෙන් පිට වෙලා යමු. ඒවා පොලීසියට භාර දුන්නට පස්සේ අපේ රාජකාරිය ඉවරයි. ඊට පස්සේ ඕනෙ නම් පොලීසිය මෙතෙන්ට ආපහු ඇවිත් හිස් පෙට්ටි ටික අරන් යාවි නේ."

ළමුන් සියලු දෙනාම ජූලියන්ගේ කතාව අනුමත කළා.

ඔවුන් සතර දෙනා තම තමන්ගේ පිටෙහි එල්ලාගෙන යන ගමන් මලු වල පතුලේ ලේන්සුවලින් ආරක්ෂිතව එතූ ස්වර්ණාභරණ සියල්ලම පරිස්සමින් ඇසිරුවා. ඊට උඩින් ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් අසුරා ගමන් මලු වසා දැම්මා.

"දැන් අපි මේවා පරෙස්සමට ළඟින්ම තියාගෙන නිදා ගනිමු." ඩික් ඔහුගේ මල්ල අතට ගනිමින් කිව්වා.

"අපේ ආරක්ෂාවට ටිමී ඉන්නව නේ." ජෝර්ජ් කිව්වා. "බය වෙන්න දෙයක් නෑ."

"ඔව්, අපි දැන් නිදා ගනිමු." ජූලියන් කිව්වා. "අපි ළඟ තව බනිස් දෙක තුනක් විතරයි තියෙන්නේ. කෑමත් ඉවරයි. ඒ නිසා උදේ නැගිට්ට ගමන්ම මෙහෙන් පිටත් වෙමු."

"මට නම් හෙට උදේට කන්න ඕනෙත් නෑ." ඈන් කිව්වා.

"හෙට වෙනකොට ඔයාගේ ඔය අදහස වෙනස් වෙලා තියෙයි...!" ජූලියන් සිනාසෙමින් කිව්වා. "දැන් නිදා ගන්න කෝ...!"

ළමුන් නිදා ගන්නට සූදානම් වුණා. ඒත් ඔවුන් හැමෝගේම සිත්වල විශාල බරක් තිබෙන බව ඔවුන්ට දැනුණා...! ටික වේලාවක් යන තුරු

...! කාටත් සැහැල්ලු ළමුන් සතර දෙනාම වැතිරී කල්පනා කරමින් සිටියා...! කාටත් සැහැල්ලු සිතින් නිදා ගන්නට පුළුවන් වුණේ නෑ.

"සුබ රාත්‍රියක් හැමෝටම...!" ජූලියන් ඈනුමක් හරිමින් කිව්වා. "ජීවිතේටම ආයේ කවදාවත් හොලැබෙන තරමට අපිට පොහොසත් වෙන්න අවස්ථාවක් ලැබිලා...! ඒත්.... අපි කවුරුවත් ඒකට කැමති නෑ...! හැමෝටම ඕනේ මේ වටිනා වස්තුව ඉක්මනටම බාරදීලා නිදහස් වෙන්න...!"

"ඩික්...! මේ සේරම වුණේ අපි දෙන්නා අතරමං වුණු නිසා නේ." ඈන් කිව්වා. "අහම්බෙන් හරි, මෙහෙම වටිනා වස්තුවක් හම්බ වෙන්නෙ නැතුව හිටිය නම් අපිට අද හිතේ සැහැල්ලුවෙන් නිදා ගන්න තිබුණා...! අපරාදේ...!"

"සුබ රාත්‍රියක්....!"



# අපූරු හපන්කම නිම වෙයි..... 22

පසුවදා උදයේ ළමුන් අවදි වුණේ ටිම් බුරන හඬ ඇසීම නිසයි. ජූලියන් වහා කාමරයෙන් පිටතට දිව ගොස් ඒ ඇයිදැයි කියා බැලුවා.

මැගී ළමුන් නිදා සිටි නටඹුන් නිවස අසලට ඇවිත් සිටියා.

"ඔය ළමයින්ගේ බල්ලා හරිම නපුරුයි නේ." ඇය ඈත තියාම කිව්වා. "මම ආවේ ඔය ළමයින්ට උදේ කෑම ඕනෙද කියලා අහන්න...! ඕනෙ නම් ටිකක් දෙන්නම්...!"

"මොකද මේ එකපාරටම අමුතු කරුණාවන්තකමක් පහළ වුණේ...!" ජූලියන් කිව්වා. "අපිට ඔයගොල්ලන්ගේ කෑම ඕනෙ නෑ...! අපි දැන් මෙහෙන් යන්නයි ලෑස්තිය...!"

"එහෙනම් ඉක්මන් කළොත් හොඳයි." මැගී අහස දෙස බලමින් කිව්වා. "වැස්සක් එන්නත් ළඟයි වගේ...!"

ජූලියන් මැගීට සරදම් සිනාවක් පා ආපසු හැරුණා...!

මැගීට ඕනෑ වී තිබෙන්නේ ළමුන්ව ඉක්මනින්ම කඳුදිය වීල අසලින් පිට කර ගැනීමට බව ජූලියන්ට තේරුණා. ඔහුටත් ඕනෑ වී තිබුණේ ඉක්මනින්ම එතැනින් පිටත් වී යන්නටයි...!

තවත් යමක් කියන්නට පෙර ජූලියන් ආපසු හැරුණු නිසා මැගීත්

ආපසු හැරී ඇගේ කූඩාරම දෙසට ගමන් කළා.

විනාඩි කිහිපයක් ගත වන්නට කලින් ළමුන් සතර දෙනා ඔවුන්ගේ ගමන් මලු පිටෙහි එල්ලාගෙන, ඇතිරිලි, පොරෝනා සියල්ලත් හකුලා මිටි බැඳගෙන, ගමනට සූදානම් වුණා. පිටත් වන්නට පෙර ඔවුන් ඉතිරි වී තිබූ බනිස් කිහිපයත් ඉක්මනින් කා අවසන් කළා. ඉන්පසුව මගට බැස්සා.

"දැන් නම් මගේ හිතට පුදුම සැහැල්ලුවක් දැනෙනවා." ඈන් කැළඳිය විල දෙස ආපසු හැරී බලමින් අතරමග දී කිව්වා. "නිවාඩු දවස් ටිකේ මොනවද කළේ කියලා ඉස්කෝලේ යාළුවෝ ඇහුවම මම මේ කතාව කොහොම කියන්නද? කවුරුවත් මාව විශ්වාස කරන එකක් නෑ...!"

"සමහරවිට හෙට ගුරුතුමිය අපිට 'මම නිවාඩුව ගත කළ හැටි' කියලා රචනාවක් ලියන්න කියයි." ජෝර්ජ් සිනාසෙමින් කිව්වා.

"පීටර්ස් ගුරුතුමිය මගේ රචනාව බලලා 'කතාව නම් ලස්සනට ගොතලා ලියලා තියෙනවා. ඒත්... මම කිව්වේ කතන්දරයක් ගොතන්න නෙමෙයි නේ. ඔය ළමයි ඇත්තටම කරපු දේවල් ලියන්න කියලා නේ...!' කියලා කියාවි...!"

ළමුන් සියලු දෙනාම ජෝර්ජ්ගේ කතාවට සිනාසෙන්නට පටන් ගත්තා. ඒත් සමගම ටිමී එකවරම ආපසු හැරී බුරන්නට පටන් ගත්තා...! ළමුන් පුදුමයෙන් ආපසු හැරී බැලුවා.

"අන්න...! මැගී, කිළුටු ඩික් දෙන්නා පිස්සු හැදිලා වගේ මේ පැත්තට දුවගෙන එනවා." ඩික් කිව්වා. "ඒ මොකද...? එයාලට අපි මෙහෙන් යන එක ගැන දුක හිතිලවත් ද...?"

"එයාලා අපිව අල්ලන්නයි එන්නේ...!" ජූලියන් කලබලයෙන් කිව්වා. "අර බලන්න...! ඒ දෙන්නා පාර දිගේ එන්නෙ නැතුව කෙටි පාරවල් දිගේ කෙළින්ම මේ පැත්තට දුවගෙන එනවා. පාර දෙපැත්තේ හැමතැනම වගුරු බිම්. ඒ දෙන්නට පිස්සුද මන්දා...! වැරදිලා හරි කලබලේට වගුරු බිමක එරෙන තැනකට කකුල තිබ්බොත් ඉවරයි...!"

මැගී සහ කිළුටු ඩික් දෑත් වනමින් කේන්තියෙන් කෑ ගසමින් ඈතින් ළමුන් දෙසට දිව එමින් සිටියා...! කිළුටු ඩික් දෑත් මිට





මොළවාගෙන දත් මිටි කමින් දිව ආවා...! මැගී දෑතින් හිසට ගසා ගනිමින් කෑ ගසමින් ඒ පසුපසින් දිව ආවා...!

"ඒ දෙන්නා පිස්සු වැටිලා....!" ඈන් කිව්වා.

"මම දන්නවා වෙලා තියෙන දේ..!" ජෝර්ජ් කිව්වා. "අපි එහෙන් පිට වුණාට පස්සේ එයාලා අපි හිටපු ගබඩා කාමරේ ඇතුළට ගිහින් බලන්න ඇති. එතන තිබුණු හිස් ආභරණ පෙට්ටි ටිකයි, මලු දෙක තුනයි දැක්කම වෙලා තියෙන දේ එයාලට තේරුම් යන්න ඇති...!"

"ඔහ්...! ඒක තමයි වෙලා තියෙන්නේ...!" ජූලියන් කිව්වා. "හිස් පෙට්ටි ටිකයි, මලු දෙක තුනයි බිත්ති අල්මාරිය ඇතුළට දාලා වහලා එන්න අපිට බැරි වුණා නේ...! කලබලය නිසා මට ඒක අමතක වුණා. ඒ දෙන්නා මෙච්චර දවසක් හොයන්න මහන්සි වුණු වටිනා වස්තුව සේරම අපි අරන් ගිහින් කියලා දැනගත්තම ඒ දෙන්නට පිස්සු හැදෙන එක අහන්නත් දෙයක්ද?"

"දැන් අපි මොකද කරන්නේ....?" ඩික් ඇසුවා. "අපේ ආරක්ෂාවට ටිමී ඉන්නවා තමයි. ඒත්... මේ වෙලාවේ හැටියට කිළුටු ඩික් ටිමී එක්ක වුණත් පොර බදන්න ලෑස්ති වෙයි...!"

"ඒක ඇත්ත...!" ජූලියන් ඈතින් දිව එන කිළුටු ඩික් දෙස බලමින් කිව්වා. "ඒත් අපිට බෑ කලබල වෙලා පැනලා දුවන්න. ඒක භයානක වැඩක්...! වගුරේ එරෙන්න පුළුවන්. අපි වගුරු මගහැරලා පුරුදු විදිහට අඩි පාර දිගේම කල්පනාවෙන් යන්න ඕනේ. පුළුවන් තරම් ඉක්මනට යමු. හැබැයි...! හරි පාරෙන්....!"

ළමුන් ඉක්මන් ගමනින් යන්නට පිටත් වුණා. ජූලියන් වරින් වර ආපසු හැරී බලමින් පිටුපසින්ම ගමන් කළා.

"අන්න...! මැගී වගුරකට පැනලා....!" ජූලියන් හදිසියේම පිටුපස හැරී බලමින් කිව්වා.

ළමුන් ගමන මදකට නවතා ආපසු හැරී බැලුවා. මැගී දණහිස දක්වා වගුරේ එරී සිටියා...! ඇය දෑත වනමින් කිළුටු ඩික්ගෙන් උදව් ඉල්ලා කෑ ගැසුවා...!

ඒත් කිළුටු ඩික් ඈට උදව් කරන්නට ආපසු හැරුණේ නෑ...! ඒ වෙනුවට ඔහු ඉක්මනින් ළමුන්ව අල්ලා ගන්නා බලාපොරොත්තුවෙන් ඉදිරියටම දිව ආවා...!

ඒත් ළමුන් දෙසම බලාගෙන උමතුවෙන් මෙන් ඉදිරියට දිව ආ කිළුටු ඩික් අතරමග දී පය පැකිළී වගුරට ඇද වැටුණා...! ඔහු අපහසුවෙන් වගුරෙන් ගොඩ එන්නට උත්සාහ කළා. ඒත් එන්න එන්නම ඔහුවත් වගුරේ හිළෙන්නට පටන් ගත්තා...!

වැඩි වේලාවක් ගත වෙන්නට පෙර මැගී, කිළුටු ඩික් දෙදෙනාම ඉණ දක්වාම වගුරේ එරී සිටියා...! ඔවුන් දෙදෙනා දෑත වනමින් කෑ ගසමින් උදව් ඉල්ලුවා...!

"අපි එයාලට උදව් කරමුද...?" ඈන් අනුකම්පාවෙන් ඇසුවා.

"අපොයි එපා...!" ජූලියන් කිව්වා. "ඒ දෙන්නා ඔහොමම හිටපුවාවේ...! ඔයිට වැඩිය මේ වගුර එරෙන එකක් නෑ. අපි ඉක්මනට ගිහින් මේ ගැන පොලීසියට දන්වමු. පොලීසිය ඇවිත් මේ දෙන්නව බේරා ගනීවි."

"මට නම් ඒ දෙන්නා වගුරේ එරිලා ඉන්නවා දැක්කට දුක හිතෙන්නෙ නෑ." ඩික් කිව්වා. "හොඳ පාඩම...! පොලීසියෙන් ඇවිත් අල්ලගෙන යන කල් ඔහොමම හිටපුවාවේ...!"

ළමුන් ආපසු හැරී ඉක්මන් ගමනින් එතැනින් පිටත්ව යන්නට පටන් ගත්තා. ඒත් ඔවුන් ටිබ්ල්ස් ගමට එන විට පැය දෙකකට වඩා ගත වී තිබුණා.

"අපි කෙළින්ම තැපැල් කන්තෝරුවට යමු." ජූලියන් කිව්වා.

වයසක තැපැල්කරු ළමුන්ව දැක සතුටට පත් වුණා.

"ආ... කොහොමද ළමයි නේ...! නිවාඩුව සතුටින් ගත කළාද?" ඔහු ඇසුවා. "කළුදිය විල ලස්සනයි නේද...?"

අනෙක් ළමුන් තැපැල්කරු සමග කතා බහ කරන අතරේ ජූලියන් දුරකථන නාමාවලිය පෙරළා බලා ගස්ටන් මහතාගේ දුරකථන අංකය සොයා ගත්තා.





ජූලියන් ගස්ටන් මහතාට ඇමතුමක් ගත්තා. අනෙක් අන්තයෙන් ගස්ටන් මහතා කතා කළා...!

"හලෝ...! ආ... ඔව්...! ඔව්...! මට මතකයි ඔය ළමයව. ඇයි මොකක් හරි උදව්වක් ඕනෙ ද?" ගස්ටන් මහතා ඇසුවා.

ජූලියන් සිදුවූ දේ ඔහුට කෙටියෙන් පැහැදිලි කළා.

"මොනවා...! ෆෙලෝනියා රැජිනගේ ආභරණ ඔය ළමයින්ට හම්බ වුණා...! මට නම් ඒක විශ්වාස කරන්නත් අමාරුයි. මොකක්...! ඒවා දැන් ඔය ළමයි ළඟ තියෙනවා කිව්වා...!" ගස්ටන් මහතා පුදුමයෙන් ඇසුවා.

ජූලියන් ඔහුට කරුණු පැහැදිලි කළා.

"හරි...! හරි...! මම ඔය ළමයින්ව පොලීසියට ගිහින් ඇරලා වන්නම්. මේ ළඟම තියෙන්නේ 'ගැදර් කෝම්බ්' පොලීසිය. මම එහේ පොලිස් ස්ථානාධිපතිවරයාව අඳුනනවා." ගස්ටන් මහතා කිව්වා. "පොඩ්ඩක් ඉන්න...! දැන් කොහෙද ඔය ළමයි ඉන්නවයි කිව්වේ...? ආ...! තැපැල් කන්තෝරුව ළඟද...? මම දැන්මම කාර් එකෙන් එතෙන්ට එන්නම්. ඔව්..! ඔව්...! පැය බාගයකින් එනවා...!"

ජූලියන් ගස්ටන් මහතාට ස්තුති කර රිසිවරය ආපසු තැබුවා. ඔහු අනෙක් ළමුන් සිටි තැනට එන විට ඩික් ඔවුන් කුලියට ගත් රබර් ඇතිරිලි, පොරෝනා සියල්ල වයසක තැපැල්කරුට ආපසු බාර දී තිබුණා.

"දැන් නම් මට හොඳටම බඩගිනියි." ජෝර්ජ් කිව්වා. "ගස්ටන් මහත්මයා එනකල් අපි උදේ කෑම කන්න තැනක් හොයා ගනිමු නේද..?"

"දැන් හොඳටම දවල් වෙලා...!" ජූලියන් අත් ඔරලෝසුව දෙස බලමින් කිව්වා. "අපි දැන් උදේ කෑමයි දවල් කෑමයි දෙකම එකට කමු...!"

ළමුන් තැපැල් හල අසල තිබූ පුංචි වෙළඳ සැලකට ගොඩ වැදී එහි තිබූ සැන්විච්, බනිස්, බිස්කට්, ජින්ජර් බියර් ආදී කෑම වර්ග

කිහිපයක්ම මිල දී ගත්තා. ඔවුන් ඒ කෑම සියල්ලම කා අවසන් වනවාත් සමගම ගස්ටන් මහතාගේ විශාල කාරය තැපැල් හල ඉදිරිපිට නතර වුණා...!

ළමුන් වහා එතැනට දිව ආවා. ජූලියන් මුලින්ම ඩික් සහ ඈන් දෙදෙනාව ගස්ටන් මහතාට හඳුන්වා දුන්නා.

ගස්ටන් මහතා දැක වඩාත් සතුටු වුණේ ටිම්. ටිම්ගේ කකුල සනීප කළේ ඔහු බව ටිම්ට හොඳින් මතක තිබුණා. ඉතින් ටිම් ගස්ටන් මහතාගේ දෙපා ලෙව කමින්, වලිගය වනමින් ඔහු වටා කැරකෙමින් කළගුණ සැලකුවා...!

ළමුන් ගස්ටන් මහතාගේ කාරයට නැග ගත්තා. ටිම්ත් ජෝර්ජ් අසලින්ම බිම වාඩි වුණා. ගස්ටන් මහතා වේගයෙන් කාරය පදවාගෙන යන්නට පටන් ගත්තා.

අතරමග දී සිදු වූ සියල්ල ළමුන් ඔහුට පැහැදිලි කර දුන්නා. ගස්ටන් මහතා ළමුන්ගේ කතාව අසා ඔවුන් කළ හපන්කම මුව නොසෑහෙන සේ අගය කළා.

"මේ ළමයි හරිම දක්ෂයි...! ඔව්...! හරිම දක්ෂයි...!" ගස්ටන් මහතා කාරය පදවමින් කිව්වා. "මේ වගේ ළමයි ටිකක් මටත් හිටියා නම් මම හරිම කැමතියි...!"

ඔවුන් ගමන් කළ කාරය ටික වේලාවකින් පොලිස් ස්ථානය කරා ළඟා වුණා. ගස්ටන් මහතා නිවසින් පිටත් වන විටම ඔවුන් එන බවට පොලීසියට දුරකථන ඇමතුමකින් දන්වා තිබුණා. ඒ නිසා කාරය පොලිස් ස්ථානය ඉදිරිපිට නවතින විටත් පොලිස් ස්ථානාධිපතිවරයා ඔවුන්ව පිළිගන්නට මග බලා සිටියා.

"මගේ කාර්යාල කාමරේටම යමු." ඔහු කිව්වා.

සියලු දෙනාම ඔහු පිටුපසින් කාමරයට ඇතුළු වුණා.

"ඔක්කෝටම කලින් මට කියලා ඉන්න ෆෙලෝනියා රැජිනගේ





ආභරණ ටික දැන් තියෙන්නේ කොහේද කියලා....!" ඔහු ළමුන්ගෙන් ඇසුවා.

ළමුන් පොලිස් ස්ථානාධිපතිවරයාගේ කාමරයේ දී තම තමන්ගේ ගමන් මලු විවර කරන්නට පටන් ගත්තා...! ජූලියන් ලේන්සුවල ඔතා තිබූ ස්වර්ණාභරණ එකින් එක ගෙන මේසය මත තැබුවා...!

පොලිස් ස්ථානාධිපතිවරයාත් ගස්ටන් මහතාත් ඒවා දෙස පුදුමයෙන් බලා සිටියා...! පොලිස් ස්ථානාධිපතිවරයා දියමන්ති ඇල්ලූ රන් මාලය අතට ගෙන එය පිරික්සා බැලුවා.

"ඔව්...! මේ ළමයි හොයාගෙන තියෙන්නේ ෆෙලෝනියා රැජිනගේ නැතිවුණු ආභරණ ටික තමයි." ඔහු කිව්වා. "පොලීසිය රට පුරාම මාස ගානක් තිස්සේ මේවා හෙව්වා. හැබෑටම ඔය ළමයින්ට මේවා හම්බ වුණේ කොහේ තිබිලද?"

"ඒක නම් ටිකක් දිග කතාවක්...!" ජූලියන් කිව්වා.

ඔහු කතාව කියන්නට පටන් ගත්තා. ඔහුට අමතක වුණු දේවල් විටින් විට අනෙක් ළමුන් මතක් කර දුන්නා.

ගස්ටන් මහතාත් පොලිස් ස්ථානාධිපතිවරයාත් පුදුමයට පත් වෙමින් ළමුන්ගේ කතාව අසා සිටියා. මැගී සහ කිළුටු ඩික් ළමුන් පසුපස එළවා එද්දී වගුරේ ගිළුණු බව ජූලියන් කියනවාත් සමගම පොලිස් ස්ථානාධිපතිවරයා කතාවට බාධා කළා...!

"පොඩ්ඩක් ඔහොම ඉන්න...!" ඔහු කිව්වා. "ඒ දෙන්නා තාම එතන ඇති නේද? විනාඩියක් ඉන්න...!"

ඔහු මේසය මත තිබූ සීනුව නාද කර පොලිස් නිලධාරියෙක්ව එතැනට කැඳවා ගත්තා.

"සාජන්ට්, ජෝන්ස්ට කියන්න තවත් තුන් දෙනෙකුත් එක්ක ඊබ්ල්ස් ගම ළඟ තියෙන කළුදිය විලට යන්න කියලා." ඔහු පොලිස් නිලධාරියාට කිව්වා. "එතන වගුරේ දෙන්නෙක් එරිලා ඉන්නවා. ඒ දෙන්නව ඉක්මනට

ගොඩ අරගෙන පොලීසියට අරගෙන එන්න. අපේ පරණ යාළුවෝ දෙන්නෙක්. මැගී, කිළුටු ඩික්....! දෙන්න ගැන හොඳ කල්පනාවෙන් ඉන්න කියන්න...!"

පොලිස් නිලධාරියා හිස සලා එතැනින් පිට වී ගියා.

ඈන් සිත සැහැල්ලු කර ගත්තා...!

'ඇති යාන්තම්...! දැන් ඉතින් ඒ දෙන්නා ටික කාලෙකට හිර ගෙදරට වෙලා ඉඳීවි.' ඈය තමාටම කියා ගත්තා.

ජූලියන් කතාවේ ඉතිරි කොටස කියා අවසන් කළා. පොලිස් ස්ථානාධිපතිවරයා ළමුන්ව අගය කරමින් කතා කළා.

"මේ ළමයි කරලා තියෙන්නේ විශිෂ්ට ක්‍රියාවක්...!" ඔහු කිව්වා. "අපි ඒ ගැන ආඩම්බර වෙනවා. ඔය ළමයි දක්ෂයි...! බුද්ධිමත්...! ඒ වගේම වගකීමෙන් වැඩ කරලා තියෙනවා. මේ වටිනා දේවල් හොයලා දුන්නු එකට ෆෙලෝනියා රැජිනගෙන් ඔය ළමයින්ට අනිවාර්යයෙන්ම වටිනා තෑග්ගක් ලැබෙනවා....!"

ළමුන් පොලිස් ස්ථානාධිපතිවරයාගෙනුත් ගස්ටන් මහතාගෙනුත් සමුගෙන යන්නට සූදානම් වුණා.

"අපි අද හවසට ඉස්කෝලේ නේවාසිකාගාරයට යන්න ඕනේ." ජූලියන් කිව්වා. "ඒත්... අපේ හැටි බලන්න. ඇඟ පුරාම කුණු, දූවිලි ගෑවිලා...! ඇඳුම් පොඩි වෙලා...! මේ විදිහට බස් එකේ යන්න බෑ. අපිට නාලා පිරිසිදු වෙන්න තියෙනවා නම් ඒක ලොකු උදව්වක්...!"

"මගේ නිල නිවාසෙට ගිහින් ඔය ළමයින්ට ඒ සේරම දේවල් කර ගන්න පුළුවන්." පොලිස් ස්ථානාධිපතිවරයා කිව්වා. "මම ඔය ළමයින්ව ඉස්කෝලෙට ගිහින් ඇරලවන්න වාහනයකුත් ලෑස්ති කරලා දෙන්නම්. ෆෙලෝනියා රැජිනගේ ආභරණ ලැබුණු බව මම දැන් ඉහළ නිලධාරීන්ට දන්වන්න ඕනේ...!"

ගස්ටන් මහතා ළමුන්ගෙන් සමුගෙන යන්නට සූදානම් වුණා.





"ටිම්, ආපහු හා ගුල්වලට රිංගන්න එපා...!" ගස්ටන් මහතා කාරයට නගිමින් කිව්වා.

ගස්ටන් මහතාගේ කාරය පිට වී ගිය පසු ළමුන් පොලිස් ස්ථානාධිපතිවරයාගේ නිල නිවාසයට ගොස් නා, පිරිසිදු වී, අලුත් ඇඳුම් හැඳ ගත්තා. ඔවුන්ට පාසැල් නේවාසිකාගාරය බලා පිටත් වන්නට පොලිස් කාරයක් ඒ වන විටත් සූදානම් කර තිබුණා.

"ඔය ළමයින්ට කියන්න සුබ ආරංචියක් තියෙනවා...!" පොලිස් ස්ථානාධිපතිවරයා කිව්වා. "අපි මැගී, කිළුටු ඩික් දෙන්නාව අත් අඩංගුවට ගත්තා."

"ඔහ්...! ඒක හොඳයි." ළමුන් සතර දෙනාම එක හඬින් කිව්වා.

ළමුන් ඔහුගෙන් සමුගෙන කාරයට නැගුණා. ළමුන් සහ ටිම් රැගත් කාරය පාසැල් නේවාසිකාගාරය බලා යන්නට වේගයෙන් පිටත් වුණා.

"ඇති යාන්තම්...!" ඈන් සැනසුම් සුසුමක් හෙළමින් කිව්වා. "අපි කරපු හපන්කම ගැන විශ්වාස කරන්නත් අමාරුයි...! ඒත් දැන් ඒක කරලා ඉවරයි...! අපි ආපහු සැරයක් ඉස්කෝලෙට යනවා...!"

"ඊළඟ නිවාඩු කාලේ එනකල් බලාගෙන ඉන්න කෝ...!" ඩික් කිව්වා. "අපිට තවත් මේ වගේ හපන්කමක් කරන්න ඉඩ ලැබේවි...!"

ඔහු කිව්වා වගේම ළමුන්ට තවත් හපන්කමක් කරන්නට ඉඩ ලැබුණා...!

ඒත් ඒක වෙනත් කතාවක්....!

- අවසානයි -